the Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| සමාජවාදී සංස්කෘතිය

## දිට්වා සුළි කුණාටු ව්‍යසනයෙන් පසු ශ්‍රී ලංකාවේ එන්පීපී ආණ්ඩුව හදිසි නීතිය පනවයි: කම්කරු පන්තියට අනතුරු ඇඟවීමක්

එන්පීපී ආණ්ඩුව, ජනතා විමුක්ති පෙරමුණේ (ජේවීපී) සංස්ථාපිත-විරෝධී ජනතාවාදී වාගාලංකාරය තිබියදීත්, දැන් එම ධනේශ්වර රාජ්‍ය උපකරණයම පරිපාලනය කරමින්, එම පන්ති අවශ්‍යතාවලින්ම බැඳී, අධිරාජ්‍යවාදී මූල්‍ය පද්ධතියෙන්ම තල්ලු වෙන තැනට පත්ව ඇත. පි.5

## ‘කොමියුනිස්ට්’ විරෝධී ඉන්දුනීසියානු මහා ජන සංහාරයෙන් 60 වසරක්

මෙම වසරේ ඔක්තෝබර් මාසයේදී, ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂ (PKI) සාමාජිකයින් සහ ආධරකරුවන් කේන්ද්‍ර කරගනිමින් 1965 දී කම්කරු පීඩිත මහජනතාවට එරෙහිව සිදු කරන ලද ජන සංහාරයට හැට වසරක් පිරුණි. පි.15

## කම්කරු විප්ලවවාදී පක්ෂය ජාත්‍යන්තර කමිටුවෙන් අත්හිටුවා වසර 40 ක්

හතරවන ජාත්‍යන්තරය සම්බන්ධයෙන් ගත් කල, කවිප අත්හිටුවීම ඓතිහාසික හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළේය. පි.24

## ඕස්ට්‍රේලියාවේ සමාජ මාධ්‍ය තහනම අන්තර්ජාල වාරණය සඳහා ගෝලීය පූර්වාදර්ශයක් සකසයි

වර්ධනය වන සමාජ කෝපය ජාත්‍යන්තර ස්වභාවයක් ගන්නවා සේම, අධිරාජ්‍යවාදී බලවතුන් ද එය මර්දනය කිරීමේ උත්සාහයේදී සම්බන්ධීකරණය වෙමින් සිටිති. පි.22



## ට්‍රම්ප් වෙනිසියුලාවට එරෙහිව නව-යටත්විජිතවාදී කොල්ලකෑමේ යුද්ධයක තර්ජනය කරයි

ට්‍රම්ප් පරිපාලනයේ අරමුණ වන්නේ වෙනිසියුලාවේ, කොලොම්බියාවේ සහ කියුබාවේ ආන්ඩු පෙරලා දමා මෙම රටවල ස්වාභාවික සම්පත් කොල්ලකන සහ කම්කරු පන්තිය මිලේච්ඡ ලෙස මර්දනය කරන ලේ වැකි ආඥාදායකත්වයන් ස්ථාපිත කිරීමයි. පි.2

## රුසියාව සහ චීනය “අධිරාජ්‍යවාදී” ලෙස නම් කිරීම පිටුපස: න්‍යායික වංචාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්




ප්‍රොබිස්ට්ටං අනුව, මෑත වසරවල ආක්‍රමණශීලීත්වය සහ ප්‍රධාන බලවතුන් අතර යුද්ධයක වැඩෙන අනතුර පිටුපස ඇති ගාමක බලවේග ඇමරිකානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදය නොවේ. ඒ වෙනුවට, ප්‍රධාන වගකීම පැවරෙන්නේ “අධිරාජ්‍යවාදී යටත් විජිත බලවතුන්” වන රුසියාව සහ චීනයටයි. පි.8

## එලිසබෙත් සිමර්මන්-මොඩෙල්ගේ අවමංගල්‍යය: "අසාමාන්‍ය ලෙස ධෛර්ය සම්පන්න පෞරුෂයක්"

එලී අසාමාන්‍ය ලෙස නිර්භීත පෞරුෂයක් වූවාය. ඇය ඉතා නිරවුල් බවකින් සහ සංගතභාවයකින් යුතුව ඇගේ ජීවන මාවත තරණය කළාය. පි.28

 ISSN 3093-6217

# ට්‍රම්ප් වෙනිසියුලාවට එරෙහිව නව-යටත්විජිතවාදී කොල්ලකෑමේ යුද්ධයක තර්ජනය කරයි



යූඑස්එස් ජෙරල්ඩ් ආර්. ෆෝඩ් [ඡායාරූපය: එක්සත් ජනපද යුද්ධෝපාය විධානය-US Strategic Command]

**ඇන්ඩ්‍රෙ ඩේමන්** විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) 2025 දෙසැම්බර් 15 දින ‘*Trump threatens neo-colonial war of plunder against Venezuela*’ යන හිසින් පලවූ ඇන්ඩ්‍රෙ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය නැවතත් යුද මාවතට පිවිස ඇති අතර, මෙවර වෙනිසියුලාවට තර්ජනය කරන්නේ මුළු ලතින් ඇමරිකාවම යටත් කර ගැනීමේ ක්‍රමානුකූල මෙහෙයුමක කොටසක් ලෙස ය. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පසුගිය සතියේ පොලිටිකෝ වෙත පැවසුවේ වෙනිසියුලා ජනාධිපති නිකොලස් මධුරෝගේ “දින සීමිත” බවයි. ඔහු සිකුරාදා ප්‍රකාශ කළේ ගොඩබිම් ප්‍රහාර “ඉතා ඉක්මනින්” ආරම්භ වන බවයි.

වෝල් ස්ට්‍රීට් ජර්නලයේ කර්තෘ මණ්ඩලය ඔහුගේ ක්‍රියාවන් පාලන තන්ත්‍ර වෙනසක් සිදුකිරීමේ ප්‍රතිඥාවක් ලෙස විස්තර කළ අතර, ට්‍රම්ප් දැන් මධුරෝ නෙරපා හැරීම සඳහා ඔහුගේ කැපවීම “පිළිපැදීමට බැඳී සිටී” යැයි ලිවීය.

1962 කියුබානු මිසයිල අර්බුදයෙන් පසු කැරිබියන් වල විශාලතම ඇමරිකානු හමුදා යෙදවීම මගින් ට්‍රම්ප්ගේ තර්ජනවලට පිටු බලය ලැබී තිබේ. භටයින් 15,000 කට වැඩි පිරිසක්, යූඑස්එස් ජෙරල්ඩ් ආර්. ෆෝඩ් ගුවන් යානා වාහක නෞකාව ඇතුළු යුද නැව් දුසිමක් සහ ගුවන් යානා විශාල ගණනක් වෙනිසියුලාවට පහර දෙන දුරින් පෙන්ටගනය යොදවා ඇත.

සැප්තැම්බර් මාසයේ සිට, එක්සත් ජනපද හමුදා දකුණු කැරිබියන් සහ නැගෙනහිර පැසිෆික් කලාපයේ බෝට්ටු වලට එරෙහිව ඩ්‍රෝන සහ මිසයිල ප්‍රහාර 22 කට වඩා දියත් කර ඇති අතර, අවම වශයෙන් පුද්ගලයින් 87 දෙනෙකු ඝාතනය කර තිබේ.

මෙම මෙහෙයුම් මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් බවට වන ධවල මන්දිරයේ ප්‍රකාශය පැහැදිලි වංචාවකි. වෙනිසියුලාවේ එක්සත් ජනපද මැදිහත්වීමේ සැබෑ අරමුණු පසුගිය බදාදා පරිපාලනය විසින් ඩොලර් මිලියන 78 ක් පමණ වටිනා බොරතෙල් බැරල් මිලියන 1.1 ක් රැගත් වෙනිසියුලානු තෙල් නැවක් අත්අඩංගුවට ගත් විට පැහැදිලි විය.

පසුදා අත්අඩංගුවට ගත් තෙල්වලට කුමක් සිදුවේදැයි විමසූ විට, ට්‍රම්ප් මැර කල්ලි භාෂාවෙන් පිළිතුරු දුන්නේ මෙසේය: “ඔව්, මම හිතන්නේ අපි ඒක තියා ගන්නවා.” නැව දැන් ඇමරිකානු හමුදා ආරක්ෂාව යටතේ එක්සත් ජනපද තෙල් කර්මාන්තයේ මධ්‍යස්ථානයක් වන ටෙක්සාස් හි ගැල්වෙස්ටන් වෙත පැමිණ ඇත.

වෙනිසියුලාවට එරෙහි ව්‍යාපාරයේ කොල්ලකාරී අරමුණු සහ ලතින් ඇමරිකාව තුල පුළුල් මැදිහත්වීම, පසුගිය මාසයේ ධවල මන්දිරය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ආරක්ෂක මූලෝපායේ දක්වා ඇත. මෙම ලේඛනය " මොන්රෝ මූලධර්මයට ට්‍රම්ප් අනුෂංගයක් (දිගුවක්)" නිවේදනය කරන අතර, "බටහිර අර්ධගෝලයේ ඇමරිකානු ප්‍රමුඛත්වය" ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ඉලක්කයක් පැහැදිලිව ස්ථාපිත කරමින්, "අපගේ අර්ධගෝලයේ මූලෝපායිකව වැදගත් වත්කම් … හිමිකර ගැනීමට හෝ පාලනය කිරීමට චීනයට ඇති හැකියාව" ප්‍රතික්ෂේප කරයි. එය "කලාපයේ ඇමරිකානු සමාගම් සඳහා මූලෝපායික අත්පත් කර ගැනීම් සහ ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සදහා" රජය යොමු කරවයි.

මෙම ලේඛනය "අපගේ අර්ධගෝලය" ලෙස ඉදිරිපත් කර ඇති මහාද්වීප දෙක මත එක්සත් ජනපද අයිතිය සඵල ලෙස තහවුරු කරයි. රුසියාව සහ චීනය සමඟ ගැටුමක් සඳහා බල කඳවුරක් ලෙස භාවිතා කිරීම පිණිස බලහත්කාරයෙන් ඒවා අල්ලා ගැනීමට සැලසුම් කරන බැවින්, එක්සත් ජනපදය ලතින් ඇමරිකාවේ සම්පත් "අයිතිකරගෙන" "පාලනය" කරනු ඇත.

බැරල් බිලියන 300 කට වඩා වන ලොව විශාලතම තහවුරු කරන ලද තෙල් සංචිත වෙනිසියුලාව සතුව ඇත. තෙල් වලට අමතරව, ලතින් ඇමරිකාව සතුව, මෝටර්, අර්ධ සන්නායක සහ බැටරි සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වන ලිතියම් සහ තඹ විශාල සංචිත ඇත. චිලීය යනු ලොව ප්‍රමුඛතම තඹ නිෂ්පාදකයා වන අතර විශාලතම ලිතියම් සංචිතය ද හිමි රටයි.

වෙනිසියුලාවේ තෙල් සහ ස්වභාවික සම්පත් අත්පත් කර ගැනීමේ එක්සත් ජනපද සැලැස්ම රුසියාව සහ චීනය යන දෙකම ඉලක්ක කරයි. බොහෝ දුරට සහතික කළ තෙල් අලෙවිය හරහා ආපසු ගෙවීම් කරනු ලබන, ඩොලර් බිලියන 62 කට වඩා ණය 2005 සිට ලබා දී ඇති චීනය වෙනිසියුලාවේ විශාලතම ණයහිමියා වන අතර, දැනට වෙනිසියුලාවේ අපනයනවලින් සියයට 80 ක් මිලදී ගනී. රුසියාව වෙනිසියුලානු බලශක්ති යටිතල පහසුකම් සඳහා බිලියන ගණනක් ආයෝජනය කර ඇත.

වෙනිසියුලාවට එරෙහි සිය ව්‍යාපාරයේදී, ට්‍රම්ප් පරිපාලනය නීත්‍යානුකූලභාවය සඳහා වූ ඉතාමත් දුර්වල මවාපෑම් පවා ප්‍රතික්ෂේප කර ඇත. අපරාධකාරී වූ 2003 දී සිදු කල ඉරාක ආක්‍රමණයේදී, බුෂ් පරිපාලනය අවම වශයෙන් එහි ක්‍රියාවන් සඳහා–කෙතරම් වංචනික වුවත්–යම් නීතිමය සාධාරණීකරණයක් ගොඩනගා ගැනීමට උත්සාහ කළේය. මෙහි දී එවැනි කිසිදු උත්සාහයක් නැත. පරිපාලනය හුදෙක් මහ මුහුදේ මිනිසුන් ඝාතනය කිරීමට, විදේශීය ජාතීන්ගේ දේපළ අත්පත් කර ගැනීමට සහ අභිමතය පරිදි ආණ්ඩු පෙරලා දැමීමට ඇති අයිතිය ප්‍රකාශ කර ඇත. එක්සත් ජනපදය දැන් වෙනිසියුලාව කෙරෙහි අනුගමනය කරන ප්‍රතිපත්තිය සහ 1930 ගණන්වල අගභාගයේදී හිට්ලර් අසල්වැසි රටවල් ආක්‍රමණය කිරීම අතර අර්ථවත් වෙනසක් නොමැත.

වෙනිසියුලාව තුළ මැදිහත්වීම් සම්බන්ධයෙන් එක්සත් ජනපදයට දිගු ඉතිහාසයක් ඇත. 1908 දී, ඉදිරි වසර 27 තුළ කුරිරු ඒකාධිපතියෙකු ලෙස පාලනය කළ ජුවාන් විසෙන්ටේ ගෝමස් බලයට පත් කළ කුමන්ත්‍රණයකට එක්සත් ජනපදය සහාය දුන් අතර, එමගින් වෙනිසියුලාවේ තෙල් සම්පත් ඇමරිකානු සංගතවලට විවෘත කළේය.

මෙය ලතින් ඇමරිකාව පුරා ඇමරිකානු පාලන තන්ත්‍ර වෙනස් කිරීමේ මෙහෙයුම් වල–ඍජු මිලිටරි මැදිහත්වීම් හෝ සීඅයිඒ කුමන්ත්‍රණ හරහා වේවා–දිගු, ලේ වැකි ඉතිහාසයේ එක් පරිච්ඡේදයක් පමණි. එක්සත් ජනපදය ග්වාතමාලාවේ (1954), බ්‍රසීලයේ (1964) සහ චිලීයේ (1973) ආණ්ඩු පෙරලා දැමීය; 1980 ගණන්වල එල් සැල්වදෝරයේ ඝාතක කල්ලි සන්නද්ධ කළේය ; 1989 දී පැනමාව ආක්‍රමණය කළේය; සහ මෑත වසරවලදී බ්‍රසීලයේ ජයේ බොල්සොනාරෝගේ (Jair Bolsonaro) සහ ආර්ජන්ටිනාවේ හාවියේ මිලෙයිගේ (Javier Milei) අන්ත දක්ෂිණාංශික රජයන්ට සහාය දී තිබේ.

ට්‍රම්ප් පරිපාලනයේ අරමුණ වන්නේ වෙනිසියුලාවේ, කොලොම්බියාවේ සහ කියුබාවේ ආන්ඩු පෙරලා දමා මෙම රටවල ස්වාභාවික සම්පත් කොල්ලකන සහ කම්කරු පන්තිය ම්ලේච්ඡ ලෙස මර්දනය කරන ලේ වැකි ආඥාදායකත්වයන් ස්ථාපිත කිරීමයි.

මෙම මෙහෙයුමේ ප්‍රචාරක අංශය ලෙස ඇමරිකානු මාධ්‍ය කටයුතු කර ඇත. සති අන්තයේ දී, CBS ප්‍රවෘත්ති සේවය වෙනිසියුලානු විපක්ෂ නායක මාරියා කොරිනා මචාඩෝ සමඟ කළ බයාදු සහ චාටුකාර සම්මුඛ සාකච්ඡාවක් විකාශනය කළේය. ඇය විවෘතව එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීමක් වෙනුවෙන් පෙනී සිටියාය. මචාඩෝ සහ වෙනිසියුලානු විපක්ෂයට එක්සත් ජනපද ආක්‍රමණයක් අවශ්‍ය වීමට හේතුව සරලය: ඔවුන්ට වෙනිසියුලාව තුළ මහජන සහයෝගයක් නැත. වසර ගණනාවක් තිස්සේ එක්සත් ජනපදයේ පිටුබලය ලත් අස්ථාවර කිරීමේ උත්සාහයන්ගෙන් පසුව විපක්ෂයට අභ්‍යන්තර ක්‍රම මගින් මදුරෝ බලයෙන් පහ කිරීමට නොහැකි වී තිබේ. ඒ, වෙනිසියුලානු ජනතාවට වොෂින්ටනයේ රූකඩ විසින් පාලනය කරනු ලැබීමට කිසිදු කැමැත්තක් නොමැති නිසාය.

ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුළ, ට්‍රම්ප් පරිපාලනය වෙනිසියුලාවට එරෙහිව ගෙන යන ක්‍රියාමාර්ගයට කිසිදු විරෝධයක් එල්ල වී නොමැත. වෙනිසියුලාවේ පාලන තන්ත්‍ර වෙනසකට විරුද්ධ දැයි විමසූ විට සෙනෙට් සභා සුළුතර නායක චක් ෂුමර් බදාදා මෙසේ පිළිතුරු දුන්නේය: "ඔබ දන්නවා, පැහැදිලිවම මදුරෝ සිය කැමැත්තෙන්ම පලා ගියහොත්, සෑම කෙනෙකුම එයට කැමති වනු ඇත."

සෙනෙට් බුද්ධි කමිටුවේ ජ්‍යෙෂ්ඨතම ඩිමොක්‍රටිකයෙකු වන වර්ජිනියාවේ සෙනෙට් සභික මාර්ක් වෝනර් ඉරිදා ABC හි "මේ සතිය" වැඩසටහනට පෙනී සිටියේය. ට්‍රම්ප්ගේ, මදුරෝ "ඒකාධිපතියා පලවා හැරීමට ගන්නා

උත්සාහය" සමඟ "ඔබ එකඟද" යනුවෙන් වැඩසටහනේ සත්කාරක මාර්තා රඩැට්ස් වෝනර්ගෙන් විමසූ විට, වෝනර් පිළිතුරු දුන්නේ, "වෙනිසියුලානු ජනතාවට මදුරෝ ඉවත් කිරීමට අවශ්‍ය බවට මම එකඟ වෙමි" යනුවෙනි.

පසුගිය සතියේ, ඩිමොක්‍රටික් කොංග්‍රස් නායකත්වය රිපබ්ලිකන්වරුන් සමඟ එක්වී එක්සත් ජනපද ඉතිහාසයේ විශාලතම මිලිටරි අයවැය සම්මත කළේය. අතිරේක අරමුදල් සමඟ ඒකාබද්ධ කළ විට ඩොලර් ට්‍රිලියන 1 කට වඩා වැඩි ඩොලර් බිලියන 901 ක ජාතික ආරක්ෂක බලය පැවරීමේ පනතට සුළුතර [එනම් ඩිමොක්‍රටික් පාක්ෂික] නායක හකීම් ජෙෆ්‍රිස්, සුළුතර සංවිධායක කැතරින් ක්ලාක් සහ ඩිමොක්‍රටික් කොකස් සභාපති පීට් අගුයිලර් යන අයගෙන් ඡන්ද ලැබුණි.

ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රමුඛ කොටස් වෙනුවෙන් කතා කරන නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත, "ගැලපීම ඉක්මවා ගොසින්: එක්සත් ජනපද හමුදාවට එයම ප්‍රති නිර්මාණය ගැනීමට අවශ්‍ය ඇයි?" යන මාතෘකාව යටතේ කතුවැකි මාලාවක් ප්‍රකාශයට පත් කර ඇත. නව ලෝක යුද්ධයක් සඳහා ප්‍රමාණවත් ලෙස සූදානම් වීමට පෙන්ටගනය අසමත් වෙමින් සිටින බවට තර්ක කරමින්, "කෙටි කාලීනව, ඇමරිකානු හමුදාවේ පරිවර්තනයට අමතර වියදම් අවශ්‍ය විය හැකිය" යනුවෙන් ටයිම්ස්පිළිගනී. ට්‍රම්ප් සමඟ ඩිමොක්‍රටික් පක්ෂ සංස්ථාපිතයට මතභේද ඇති තාක් දුරට, ඒ, ඔහු රුසියාව සමඟ මිලිටරි ගැටුමකට ප්‍රමාණවත් ලෙස කැපවී නොමැති බව ඔවුන් විශ්වාස කරන නිසාය.

මිලිටරිය ගොඩනැගීම මධ්‍යයේ ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාසියෝ-කෝර්ටෙස් සහ බර්නි සැන්ඩර්ස් නිහඬව සිටිති. නිව්යෝර්ක් නගරාධිපති ධුරයට තේරී පත් වූ සොහ්රාන් මම්දානි ධවල මන්දිරයේදී දත් විලිත්තන ජායාරූ-මෙහෙයුමක් සඳහා ට්‍රම්ප් මුණගැසුණු අතර එහිදී ට්‍රම්ප්ගේ හමුදා වෙනිසියුලාවේ වෙරළට ඔබ්බෙන් නිරායුධ සිවිල් වැසියන් සාගරය ජලය මැද පුපුරුවා හරිමින් සිටියදී, "දැරිය හැකි මිල" ප්‍රවර්ධනය කිරීමේ ට්‍රම්ප්ගේ උත්සාහයට ප්‍රශංසා කළේය.

ට්‍රම්ප් පරිපාලනය වෙනිසියුලාවේ පමණක් නොව, ලතින් ඇමරිකාව පුරා සහ එක්සත් ජනපදය තුළම වෙඩි බෙහෙත් බැරලයකට ගිනිනූල දල්වමින් සිටී. වෙනිසියුලාව යටත් කර ගැනීමට සහ අත්පත් කර ගැනීමට කරන යුද්ධයක් වෙනිසියුලානු කම්කරු පන්තියෙන් සහ මහාද්වීපය පුරා කම්කරුවන්ගෙන් දැවැන්ත ප්‍රතිරෝධයකට මුහුණ දෙනු ඇත. ලතින් ඇමරිකාව දැනටමත් වැඩෙන පන්ති අරගලයේ කලාපයක් වන අතර, එක්සත් ජනපද ආක්‍රමණයක් මෙම විරුද්ධත්වය බෙහෙවින් තීව්‍ර කර අර්ධගෝලය පුරා විප්ලවවාදී නැගිටීම් වේගවත් කරනු ඇත.

ලතින් ඇමරිකාවේ තම පන්ති සහෝදර සහෝදරියන් අධිරාජ්‍යවාදය විසින් යටත් කර ගැනීමට විරුද්ධ වීම සඳහා එක්සත් ජනපදයේ කම්කරුවන්ට ගැඹුරු පරදුවක් තිබේ. රට පුරා නගරවල විරෝධතා සහ වැඩ නැවැත්වීම් අවුලුවා ඇති ගෙස්ටාපෝ (Gestapo) පන්නයේ සංක්‍රමණික වැටලීම් වලට එරෙහිව ට්‍රම්ප් පරිපාලනය වැඩෙන විරෝධයකට මුහුණ දී සිටී. සමූහ දොට්ට දැමීම්, පහත වැටෙන මූර්ත (සැබෑ) වැටුප්, පොදු අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා විනාශ කිරීම සහ ආහාර මුද්දර, මෙඩිකේඩ්, මෙඩිකෙයාර් සහ සමාජ ආරක්ෂණ කප්පාදු හරහා ගෙවනු ලබනු ඇති කැරිබියානු යුධ (සූදානම) ගොඩනැගීමට අරමුදල් සපයන මිලිටරි අයවැය, කෝපාග්නිය අවුලුවයි .

විදේශයන්හි යුද්ධය රට තුළ මර්දනය තීව්‍ර කිරීමට යොදා ගැනේ. සාක්ෂි හෝ නිසි ක්‍රියා පටිපාටියකින් තොරව ජාත්‍යන්තර මුහුදේදී මිනිසුන් ඝාතනය කිරීමේ අයිතිය ඉල්ලා සිටින එම පරිපාලනයම, එක්සත් ජනපදය තුළ විරුද්ධ මත දැරීම අපරාධයක් ලෙස සැලකීමට අඩිතාලම දමමින් සිටී. ට්‍රම්ප් පරිපාලනය වෙනිසියුලාවේ වෙරළට ඔබ්බෙන් තම ඝාතන සාධාරණීකරණය කර ඇත්තේ, කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකර, තමන් විසින් ඝාතනය කරන ලද පුද්ගලයින් "ත්‍රස්තවාදීන්" බව ප්‍රකාශ කිරීමෙනි. විදේශයන්හි ස්ථාපිත මෙම පූර්වාදර්ශය එක්සත් ජනපදයට ආනයනය කරනු ඇති අතර, ඒ ෆැසිස්ට්වාදයට විරුද්ධ ඇමරිකානුවන් විස්තර කිරීම සඳහා ට්‍රම්ප් පරිපාලනය "ත්‍රස්තවාදීන්" යන වචනයම භාවිතා කරන පසුබිමකය.

1980 ගණන්වල, විශේෂයෙන් නිකරගුවාව ඉලක්ක කර ගනිමින් මධ්‍යම ඇමරිකාවේ පූර්න පරිමාණ යුද්ධයකට එක්සත් ජනපදය සූදානම් වෙමින් සිටියදී, රේගන් පරිපාලනය විසින් එවැනි යුද්ධයකට විරුද්ධ විය හැකි 300,000 ක් වටලා සිරගත කිරීමට සැලසුම් සකස් කරන ලදී. වසර 40 කට පසුව, ධවල මන්දිරයේ ෆැසිස්ට් කල්ලියක් බලයේ සිටිද්දී, මහා පරිමාණ මර්දනය සඳහා වන සූදානම බෙහෙවින් දියුණු ය.

එබැවින් වෙනිසියුලාවට එරෙහි අධිරාජ්‍යවාදී ප්‍රහාරයට එරෙහි අරගලය, යුද්ධය, ආඥාදායකත්වය සහ සමාජ ප්‍රතිවිප්ලවයට එරෙහි ජාත්‍යන්තර කම්කරු පන්තියේ පුළුල් සටනක කොටසක් ලෙස වටහා ගත යුතුය.

යුද්ධයට එරෙහි විරෝධය, සංක්‍රමණික වැටලීම්, කප්පාදු සහ සමාජ අයිතිවාසිකම් විනාශ කිරීමට එරෙහි අරගලය සමඟ ඒකාබද්ධ කළ යුතුය. මේ සඳහා ධනේශ්වර පක්ෂ දෙකෙන්ම සවිඥානිකව බිඳී යාම සහ කම්කරු පන්තියේ ස්වාධීන, ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම අවශ්‍ය වේ. යුද්ධයට හා ආඥාදායකත්වයට ඇද වැටීම නැවැත්විය හැක්කේ සහ කුඩා මූල්‍ය කතිපයාධිකාරයක ලාභ හා බලයට වඩා මානව අවශ්‍යතා සඳහා සේවය කිරීම පිණිස සමාජය ප්‍රතිසංවිධානය කළ හැක්කේ මෙම පදනම මත පමණි.

**යුද්ධයට, කප්පාදුවට හා ආඥාදායකත්වයට එරෙහිව ලෝක සමාජවාදී වැඩපිළිවෙලකට සටන් වදිනු!**

 ISSN 3093-6217

# දිට්වා සුළි කුණාටු ව්‍යසනයෙන් පසු ශ්‍රී ලංකාවේ එන්පීපී ආණ්ඩුව හදිසි නීතිය පනවයි: කම්කරු පන්තියට අනතුරු ඇඟවීමක්

**සංජය ජයසේකර** විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් *2025 දෙසැම්බර් 02* දින *thesocialist.lk* හි පළ විය.



2025 නොවැම්බර් 30 වන දින ශ්‍රී ලංකාවේ මුතූර් ප්‍රදේශයේ ඩිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ ගංවතුර

නොවැම්බර් 28 වන දින ජනාධිපති අනුර කුමාර දිසානායක හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරමින්, ඩිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ ව්‍යසනකාරී විනාශයට ප්‍රතිචාර වශයෙන්, දුෂ්ට මහජන ආරක්ෂක ආඥා පනත (PSO) ක්‍රියාත්මක කළේය. සුළි කුණාටුවෙන් අවම වශයෙන් ජීවිත 410 ක් අහිමි වී, 400 කට ආසන්න පිරිසක් තවමත් අතුරුදහන් වී ඇති අතර, එය 2017 න් මෙපිට ශ්‍රී ලංකාවේ වඩාත්ම මාරාන්තික ස්වාභාවික විපත සනිටුහන් කරයි. මිලියනයකට ආසන්න ජනතාවක් පීඩාවට පත්ව ඇති අතර, 180,000 කට වැඩි පිරිසක් රජය විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂක මධ්‍යස්ථානවල නවාතැන් ගෙන සිටිති.

නොවැම්බර් 29 වන දින ජාතිය අමතමින් ජනාධිපතිවරයා කළ කතාවේදී, ජාතිය නැවත ගොඩනැගීම සඳහා "එක්සත්" වන ලෙස සහ "සියලු පක්ෂ හා දේශපාලන වෙනස්කම් ඉවත ලන ලෙස" ජනතාවගෙන් ඉල්ලා සිටිමින්, ජනතාවාදී වාගලංකාර කතා ප්‍රවේශමෙන් භාවිතා කළේය. හදිසි අවස්ථා රෙගුලාසි තනිකරම ආපදා කළමනාකරණය සඳහා වන පරිපාලන අවශ්‍යතාවක් ලෙස ඉදිරිපත් කිරීමට ඔහු ප්‍රවේශම් විය. එහෙත් මෙම හදිසි බලතලවල පන්ති ස්වභාවය නොවරදවාම එය සඟවා ඇති තැනින් හෙළිදරව් වේ.

හදිසි අවස්ථා තත්ත්වය සමඟ ගැසට් කර ඇති හදිසි නීති රෙගුලාසි, ආපදා සහනවල අවශ්‍යතා වලට වඩා එපිට බොහෝ දුරට විහිදෙන පුළුල් බලතල ලබා දෙයි. "රාජ්‍ය නිලධාරීන් අතර අප්‍රසාදයබ් ඇති කිරීම" අපරාධකරණය කිරීම, "මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ ජනතාවගේබ්බ් ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා නඩත්තු කිරීමට අගතිදාහක වන කාරණා අඩංගු වන දැන්වීම් කොළ, අත්පත්‍රිකා හෝ පත්‍රිකා ඇලවීම හෝ බෙදා හැරීම" තහනම් කිරීම සහ "මහජනයා බිය ගැන්විය හැකි හෝ මහජනයා කැලඹිය හැකි" "කටකතා හෝ අසත්‍ය ප්‍රකාශ" ලෙස සැලකෙන තොරතුරු මර්දනය කිරීම මෙයට ඇතුළත් වේ (18,19, 20 රෙගුලාසි). ශ්‍රී ලාංකික චින්තන පර්ශදයක් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), එවැනි "පුළුල් රෙගුලාසි (නීත්‍යානුකූල සීමාවන් ඉක්මවා යන) මගින් ගමනාගමනයේ නිදහස, රැස්වීමේ, ප්‍රකාශනයේ සහ නිසි

පටිපාටියේ මූලික අයිතිවාසිකම් ඇතුළු සිවිල් නිදහසට හානි කිරීමේ අවදානමක් ඇති බවට" අනතුරු ඇඟවීමක් කර තිබේ. 2005 ආපදා කළමනාකරණ පනත වැනි වඩා අඩුවෙන් දැඩි ආපදා කළමනාකරණය සඳහා නිශ්චිත නීති තිබියදීත් හදිසි නීති ක්‍රියාත්මක කර ඇති බව එය සඳහන් කරයි.

දිසානායක තම කතාවේදී සඳහන් නොකළ නමුත් කම්කරු පන්තිය තේරුම් ගත යුතු දෙය නම්, මෙම හදිසි බලතල වැඩ වර්ජන බිඳීම, කම්කරු පන්ති අරගලවලට එරෙහිව සන්නද්ධ හමුදා යෙදවීම, සහ "ජාතිය නැවත ගොඩනැගීම" මුවාවෙන් මිලේච්ඡ කප්පාදු පියවර පැනවීම සඳහා නීතිමය රාමුව සපයන බවයි. හදිසි නීති රෙගුලාසි යටතේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කිරීම හරියටම මෙම අභිප්‍රාය සංඥා කරයි.

මූලික ඇස්තමේන්තුවලට අනුව ගංවතුර, නායයෑම් සහ සුළං හේතුවෙන් ඇති වූ ආර්ථික හානිය ඩොලර් මිලියන 500 ඉක්මවන අතර එය 2022 ආර්ථික අර්බුදයෙන් තවමත් මිදී නැති රටක කෘෂිකර්මාන්තයට වඩාත්ම බලපා ඇත. විදේශ අමාත්‍යාංශය පෙන්වා දී ඇත්තේ නොවැම්බර් 28 වන විට කෘෂිකර්මාන්තය, වාරිමාර්ග වැව් සහ හානියට පත් ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් බිලියන 31 ක් අවශ්‍ය බවයි. හානියට පත් මාර්ග, දුම්රිය මාර්ග, පාලම්, විදුලි සැපයුම් සහ රජයේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුවනු ඇත. ගොවිබිම් හෙක්ටයාර 57,000 කට වඩා බලපෑමට ලක්ව ඇති අතර, ණය බරින් සහ වෙළඳපොළ යැපීමෙන් දැනටමත් අරගල කරමින් සිටින ග්‍රාමීය නිෂ්පාදකයින් විනාශකාරී ලෙස පීඩාවට පත්ව ඇත.

මෙම ව්‍යසනය සමාජයේ වඩාත්ම අවදානම් සහගත තත්වයන්හි සිටින ස්ථරවලට විශේෂයෙන් දරුණු ලෙස පහර දෙයි. ජලයෙන් යට වූ ගොවිබිම්, හානි වූ ගබඩා පහසුකම් සහ කපා දැමූ සැපයුම් මාර්ග ඉදිරි සතිවලදී බාණ්ඩ හිඟයක සහ මිල වැඩි වීමේ තර්ජනයක් මතු කරමින් ඉහළ යන ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳව බලධාරීන් අනතුරු අඟවා ඇත. කම්කරු පන්තියට සහ ග්‍රාමීය දුප්පතුන්ට, මෙය කුසගින්නේ සහ මන්දපෝෂණයේ අද්දරට තල්ලු කිරීමක් බවට පරිවර්තනය වේ—එය හුදෙක් 'ස්වාභාවික' ව්‍යසනයක නොව, දශක ගණනාවක් තිස්සේ පැවති නව ලිබරල් ප්‍රතිපත්තිය යටතේ කෘෂිකාර්මික යටිතල පහසුකම් සහ ආහාර සුරක්ෂිතතාව ක්‍රමානුකූලව නොසලකා හැරීමේ සෘජු ප්‍රතිවිපාකයකි.

ආණ්ඩුව මෙම අර්බුදයට මුහුණ දෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) යකඩ කූඩුව තුළ සිර වී සිටියදීය. හිටපු අමාත්‍ය සහ දිවයිනේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ සභාපති හර්ෂ ද සිල්වා සඳහන් කළ පරිදි, මූලික අභියෝගය පවතින්නේ "ශ්‍රී ලංකාව මත පනවා ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය සීමාවන් තුළ වැඩ කිරීම තුළ වන අතර එමඟින් ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 කට සීමා වේ". විශේෂයෙන් IMF වියදම් සීමාවන් සැලකිල්ලට ගත් විට, දිගු කාලීන නැවත ගොඩනැගීම සඳහා සැලකිය යුතු බාහිර ආයෝජන අවශ්‍ය වනු ඇත, ඔහු පවසා තිබේ.

වෛෂයික ආර්ථික යථාර්ථය මෙයයි: පූර්වගාමී ආන්ඩුව විසින් සාකච්ඡා කරන ලද IMF ගිවිසුම පවත්වා ගැනීමට පොරොන්දු වූ NPP ආණ්ඩුවට, කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට තවදුරටත් ප්‍රහාර එල්ල කිරීම හැර වෙනත් කිසිදු ක්‍රමයක් නොමැත. "ජාත්‍යන්තර ආධාර" සහ "විදෙස් ගත වූවන්ගෙන් සහ ශ්‍රී ලාංකික සමාගම්වලින් පරිත්‍යාග" සඳහා වන ඉල්ලීම්, රජයේ ඊළඟ ඉල්ලීමට පූර්විකාවකි: එනම්, රාජ්‍ය සේවකයින් ඔවුන්ගේ වැටුප්, ප්‍රතිලාභ සහ වැඩ කරන වේලාවන්ගෙන් "කැප කිරීම්" කිරීම යි.

මෙම ව්‍යසනය තනිකරම "ස්වාභාවික" සංසිද්ධියක් ලෙස තේරුම් ගත නොහැක. කාලගුණ විද්‍යාඥයින් සඳහන් කරන්නේ, ගෝලීය උණුසුම හා සම්බන්ධ ප්‍රවණතාවක් වන උණුසුම් වූ මුහුදු මතුපිට උෂ්ණත්වය හේතුවෙන් ඩිට්වාහි තීව්‍රතාවය ඇති වූ බවයි. ඉන්දුනීසියාව, තායිලන්තය, මැලේසියාව සහ අනෙකුත් අග්නිදිග ආසියානු රටවලට පහර දුන් විනාශකාරී සුළි සුළං සමඟ සමගාමීව ඩිට්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවට හ්බලපෑ අතර, එය ආන්තික කාලගුණික සංසිද්ධි මගින් මෙහෙයවනු ලබන පුළුල් ව්‍යසනයක් ලෙස කලාපය පුරා මිලියන ගණනකට බලපෑවේය.

එවැනි ව්‍යසනයන් උත්සන්න වීම ගෝලීය ධනවාදය විසින් ස්වභාවධර්මය නිර්දය ලෙස සූරාකෑමේ සෘජු ප්‍රතිවිපාකයකි. දියුණු අධිරාජ්‍යවාදී බලවතුන්—ප්‍රධාන වශයෙන්, එක්සත් ජනපදය, යුරෝපීය සංගමය සහ ජපානය—හරිතාගාර වායු විමෝචනය සඳහා අතිමහත් ලෙස අසමානුපාතික ඓතිහාසික වගකීම දරන නමුත් වඩාත්ම විනාශකාරී ප්‍රතිවිපාකවලට ගොදුරු වන්නේ ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ සහ එම අධිරාජ්‍යවාදයේ මධ්‍යස්ථානවල ම වැඩ කරන ජනතාවයි.

එපමණක් නොව, ශ්‍රී ලංකාව තුළම, දශක ගණනාවක් තිස්සේ නියාමනය නොකළ ධනවාදී සංවර්ධනය ස්වභාවික ගංවතුර බාධක ක්‍රමානුකූලව විනාශ කර, තෙත්බිම් ඉවත් කර, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිව ආපදාවන්ට ගොදුරු විය හැකි ප්‍රදේශවල අවදානමට ලක්විය හැකි ජනගහනය සංකේන්ද්‍රණය කර ඇත. අවදානම් කලාපවල සිටින අය වෙනත් ස්ථානයකට ගෙන යාමට හෝ දිගුකාලීන ආපදා සූදානම සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කිරීමට ආණ්ඩුව කිසිදු බැරෑරුම් උත්සාහයක් ගෙන නොමැත. බදුකරණය හරහා කම්කරු පන්තියෙන් ලබා ගන්නා සෑම රුපියලක්ම ගංවතුර පාලන පද්ධති, පූර්ව අනතුරු ඇඟවීමේ යටිතල පහසුකම් හෝ දේශගුණික අනුවර්තන පියවරයන් සඳහා ආයෝජනය කිරීම

වෙනුවට ජාත්‍යන්තර මූල්‍ය ආයතන වෙත පොලී ආපසු ගෙවීම ඇතුළුව ණය සේවා සැපයීම සඳහා යොමු කරන ලදී.

ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය හදිසි අවස්ථා ප්‍රකාශයට ප්‍රවේශ විය යුත්තේ ඓතිහාසික අත්දැකීම්වල සම්පූර්ණ බර සමඟිනි. එක්සත් ජාතික පක්ෂයේ සිට ශ්‍රීලනිපය දක්වා, රාජපක්ෂගේ සිට වික්‍රමසිංහ දක්වා පෙර පැවති සෑම ආණ්ඩුවක්ම හදිසි අවස්ථා නීති භාවිතා කර ඇත්තේ ප්‍රධාන වශයෙන් සැබෑ අර්බුද විසඳීමට නොව, කප්පාදු සහ සූරාකෑමට එරෙහිව කම්කරු පන්තියේ ප්‍රතිරෝධය මැඩපැවැත්වීම සඳහා ය.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් උරුම වූ සහ අනුප්‍රාප්තික ධනේශ්වර ආණ්ඩු යටතේ පරිපූර්ණ කරන ලද, පාලක පන්තියේ අවි ගබඩාවේ භයානක ආයුධවලින් එකක් වන මහජන ආරක්ෂක ආඥා පනත, වැඩ වර්ජන කුරිරු ලෙස මර්දනය කිරීම, කම්කරු ආරවුල් මිලිටරිකරණය කිරීම සහ සමාජ විරුද්ධත්වය අපරාධකරණය කිරීම සඳහා නීතිමය මෙවලම ලෙස සේවය කර ඇත. නොවැම්බර් 26 වන දින, PSO හි 12 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා ශ්‍රී ලංකාව පුරා ‘මහජන සාමය’ පවත්වා ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කැඳවූ අතර, එය ඔහුගේ සියලු පූර්වගාමීන් විසින් අනුගමනය කරන ලද පියවරකි. හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවයකින් තොරව ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමට PSO ජනාධිපතිවරයාට බලය ලබා දෙයි. නොවැම්බර් 28 වන දින, අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සේවාවන් කිහිපයක් අත්‍යවශ්‍ය මහජන සේවා ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නීතියේ විධිවිධාන ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන සහ අනෙකුත් අංශවල සේවකයින්ට වැඩ වර්ජනය කිරීමේ මූලික අයිතිය ක්‍රියාත්මක කිරීම වළක්වයි.

එන්පීපී ආණ්ඩුව, ජනතා විමුක්ති පෙරමුණේ (ජේවීපී) සංස්ථාපිත-විරෝධී ජනතාවාදී වාගාලංකාරය තිබියදීත්, දැන් එම ධනේශ්වර රාජ්‍ය උපකරණයම පරිපාලනය කරමින්, එම පන්ති අවශ්‍යතාවලින්ම බැඳී, අධිරාජ්‍යවාදී මූල්‍ය පද්ධතියෙන්ම තල්ලු වෙන තැනට පත්ව ඇත. හදිසි අවස්ථා බලතල ඉල්ලා සිටීමේදී එය එහි පූර්වගාමීන්ගේ සමාන තර්කනය අනුගමනය කරයි: එනම්, ධනේශ්වර දේපළ සබඳතා ආරක්ෂා කිරීම සහ අධිරාජ්‍යවාදී නියෝග ක්‍රියාත්මක කිරීම මිනිස් ජීවිතවලට වඩා පරම ප්‍රමුඛතාවයක් ගනී.

සාම්ප්‍රදායික දක්ෂිණාංශික පක්ෂ මගින් හෝ NPP වැනි සුලු ධනේශ්වර ජනතාවාදයේ පක්ෂ මගින් නියෝජනය වන ධනේශ්වරය, ආරක්ෂිත ස්ථානවල ප්‍රමාණවත් නිවාස, විස්තීර්ණ ආපදා සූදානම, ආහාර සුරක්ෂිතතාව හෝ දේශගුණික ව්‍යසනයෙන් ආරක්ෂාව යන මුඛ්‍ය අවශ්‍යතා පවා සැපයීමට මූලික වශයෙන් අසමත් බව කම්කරු පන්තිය තේරුම් ගත යුතුය.

ශ්‍රී ලංකාවේ දිග හැරෙන ව්‍යසනය ධනවාදයේ ගෝලීය අර්බුදයේ ක්ෂුද්‍ර නිරූපණයකි. දේශගුණික විපත් උත්සන්න වන විට, සමාජ යටිතල පහසුකම් කප්පාදුව යටතේ බිඳ වැටෙන විට, අසමානතාවය අසභ්‍ය අනුපාතයන්ට ළඟා වන විට, ධනේශ්වර ජාතික රාජ්‍යය මානව පැවැත්ම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගීතාවය සම්බන්ධීකරණය කිරීමට නොහැකි යල් පැන ගිය සහ ප්‍රතිගාමී ආයතනයක් ලෙස තමන්ව හෙළි කරයි.

හදිසි නීතියට එරෙහිව, IMF කප්පාදුවලට එරෙහිව, දේශගුණික ව්‍යසනයට එරෙහිව සටන් කිරීම, ධනේශ්වර පාර්ලිමේන්තුවාදයේ රාමුව තුළ හෝ දිසානායක විසින් කැඳවන ලද “ජාතික සමගිය” සඳහා ආයාචනා හරහා දියත් කළ නොහැක. ඒ සඳහා ජාත්‍යන්තර සමාජවාදී වැඩපිළිවෙලක් මත කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම අවශ්‍ය වේ.

මෙයින් අදහස් වන්නේ:

- හදිසි නීතියට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට ඇති සියලු සීමාවන්ට කොන්දේසි විරහිතව විරුද්ධ වීම
- අහිමි වූ ජීවිත හා දේපළ හානි සඳහා සම්පූර්ණ වන්දි සහ යහපත් ජීවන තත්වයන් සහිතව නැවත පදිංචි කිරීම.
- IMF විසින් පනවන ලද සියලුම කප්පාදු පියවර ප්‍රතික්ෂේප කිරීම, පෙර පාලන තන්ත්‍රයන් යටතේ රැස් කරගත් විදේශ ණය ප්‍රතික්ෂේප කිරීම සහ අධිරාජ්‍යවාදයේ නියෝජිතයන් ලෙස ක්‍රියා කරන බැංකු සහ මූල්‍ය සමූහ සමාගම් වන්දි ගෙවීමකින් තොරව අත්පත් කර ගැනීම.
- ධනපති පන්තිය විසින් රැස්කරගෙන ඇති ධනය අත්පත් කර ගැනීමෙන් අරමුදල් සපයනු ලබන දේශගුණික අනුවර්තන යටිතල පහසුකම් සඳහා දැවැන්ත රාජ්‍ය ආයෝජන.
- තවදුරටත් කප්පාදු පියවර ඉල්ලා සිටින අධිරාජ්‍යවාදී “ආධාර” වැඩසටහන් නොව, කම්කරුවන්ගේ පාලනය යටතේ දේශගුණික විපත්වලට ප්‍රතිචාර දැක්වීමේ ජාත්‍යන්තර සම්බන්ධීකරණය.
- ස්වාධීන සහන සේවා කටයුතු සංවිධානය කිරීම සහ හදිසි නීතියට එරෙහි ප්‍රතිරෝධය දැක්වීම සඳහා සේවා ස්ථාන, අසල්වැසි ප්‍රදේශ සහ ගම්මානවල ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම.

විකල්පය පැහැදිලිය: එක්කෝ කම්කරු පන්තිය ජාත්‍යන්තර සමාජවාදී විප්ලවය හරහා ධනවාදයේ සහ අධිරාජ්‍යවාදයේ සිරගෙයින් මිදිය යුතුය, නැතහොත් උත්සන්න වන වෙළඳ යුද්ධය, දේශගුණික ව්‍යසනය, මිලිටරිකරණය වූ මර්දනය, සමාජ බිඳවැටීම සහ න්‍යෂ්ටික යුද්ධය මගින් සලකුණු කරන ලද ම්ලේච්ඡත්වයට ඇද වැටීමකට මානව වර්ගයා මුහුණ දිය යුතුය.

ඩිට්වා සුළි කුණාටුවේ අත්දැකීම ශ්‍රී ලාංකික කම්කරු පන්තියේ දේශපාලන පිබිදීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස

සේවය කළ යුතුය. මෙම ව්‍යසනය, එන්පීපී / ජේවීපී ජනතාවාදය (populism) ඇතුළු ධනේශ්වර පාලනයේ සියලු ප්‍රභේදවල බංකොලොත්භාවය අනුකම්පා විරහිතව පැහැදිලි කරයි. ශ්‍රී ලංකාවේ, දකුණු ආසියාවේ සහ ජාත්‍යන්තරව ධනවාදය විප්ලවීය ලෙස පෙරලා දමා කම්කරු බලය ස්ථාපිත කිරීම හරහා පමණක්, දේශගුණික විපර්යාස සහ අධිරාජ්‍යවාදී යුද්ධයේ ද්විත්ව ව්‍යසනයන්ට එරෙහිව මානව වර්ගයාට තම අනාගතය සුරක්ෂිත කර ගත හැකිය. මේ සඳහා, ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන්, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) ගොඩනැගීම අවශ්‍ය වේ.

---

“ජෙන්-Z නැගිටීම් සහ නායකත්වයේ අර්බුදය: ‘නායකත්වයක් නොමැති’ ව්‍යාපාර සහ ‘වාම ජනතාවාදයට’ එරෙහිව නොනවතින විප්ලවය” ලිපියේ 3 කොටස මීලඟ කලාපයේ පළ වනු ඇති බව සලකන්න.

---

**ගාසාවේ සියොන්වාදී ජන සංහාරය නවතනු!**

---

**අධිරාජ්‍යවාදී ණය අහෝසි කරනු!**

---

# රුසියාව සහ චීනය “අධිරාජ්‍යවාදී” ලෙස නම් කිරීම පිටුපස: න්‍යායික වංචාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

**ජොහැන්ස් ස්ටර්න්** විසිනි.

ජොහැන්ස් ස්ටර්න් විසින් ලියා 2016 අප්‍රේල් 14 වන දින ලෝක සමාජවාදී වෙබ් අඩවියේ “Behind the designation of Russia and China as “imperialist”: A case study in theoretical charlatanry“ යන හිසින් ඉංග්‍රීසි බසින් මුලින් ප්‍රකාශයට පත් කරන ලද මෙම ලිපිය, විප්ලවවාදී කොමියුනිස්ට් ජාත්‍යන්තර ප්‍රවණතාවයේ (RCIT) “අනුබද්ධ අංශයක්” ශ්‍රී ලංකාවේ මෑතකදී පිහිටුවීමත් සමඟ ක්ෂණික අදාළත්වයක් ලබා ගනී. 2025 නොවැම්බර් 9 වන දින ගාල්ලේ පැවති රැස්වීමකදී, RCIT ට සහාය දෙන කණ්ඩායමක් විප්ලවවාදී කම්කරු පෙරමුණ (RWF) නමින් එහි ශ්‍රී ලංකා අංශය ආරම්භ කළේය.

දේශපාලනිකව මුළා කිරීමේ සහ එය පාලක පන්තියේ ඒ හෝ මේ කොටසකට යටත් කිරීමේ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ස්ටර්න්ගේ ලිපිය RCIT හි න්‍යායික පදනම සහ දේශපාලන ගමන් මග පිළිබඳ විනාශකාරී හෙළිදරව්වක් සපයයි. RCIT හි ජාත්‍යන්තර ලේකම් මයිකල් ප්‍රොබ්ස්ටිං ගේ ලියවිලි පිළිබඳ සූක්ෂ්ම විශ්ලේෂණයක් හරහා, ලිපිය පෙන්වා දෙන්නේ, රැඩිකල් වාක්‍යාංශ සහ මාක්ස්, ලෙනින් සහ ට්‍රොට්ස්කි වෙත කරන රැවටිලිකාර සැඳහුම් පිටුපස, ඇමරිකානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදයේ උපායමාර්ගික අවශ්‍යතා සඳහා සේවය කරන දේශපාලන ඉදිරිදර්ශනයක් එයට තිබෙන බවයි.

රුසියාව සහ චීනය “අධිරාජ්‍යවාදී බලවතුන්” ලෙස RCIT විසින් නම්




විප්ලවවාදී කම්කරු පෙරමුණ දේශපාලන බල මණ්ඩලය 2025.11.09

මෙම වර්ධනයේ කාලසීමාව හුදෙක් අහඹු සිදුවීමක් නොවේ. අධිරාජ්‍යවාදී බලවතුන් තුන්වන ලෝක යුද්ධයක් සඳහා වන තම සූදානමේ මට්ටම—යුක්රේනය තුළ රුසියාවට එරෙහි නේටෝ ප්‍රොක්සි යුද්ධයෙන් සහ චීනය සමඟ උත්සන්න වන ගැටුමෙන් ප්‍රකාශිත—තීව්‍ර කරන අවස්ථාවේ, RCIT වැනි ව්‍යාජ-වාම සංවිධාන කම්කරු පන්තිය

කිරීම බරපතල මාක්ස්වාදී විශ්ලේෂණයක නිෂ්පාදනයක් නොව, නේටෝ සහ පෙන්ටගනයේ ප්‍රචාරක අවශ්‍යතා වෙත දේශපාලන අනුගත වීමකි. මෙම න්‍යායික වංචනිකත්වය සංයුක්ත දේශපාලන කාර්යයන් ඉටු කරයි: එය ලෝකය ව්‍යසනය කරා තල්ලු කිරීමේ එක්සත් ජනපද, යුරෝපීය සහ ජපන් අධිරාජ්‍යවාදයේ කේන්ද්‍රීය

භූමිකාව සාපේක්ෂව ලඝු කර අපැහැදිලි කරන අතර, අධිරාජ්‍යවාදය විසින් පිටුබලය දෙන තන්ත්‍ර-වෙනස් (regime change) කිරීමේ මෙහෙයුම් සහ ඊනියා "වර්ණ විප්ලවයන්" සඳහා සහයෝගය ලබා දීමට "වාම" ආවරණයක් සපයයි.

ස්ටර්න් පෙන්වා දෙන පරිදි, 2011 ලිබියාවේ නේටෝ සංවිධානය කළ යුද්ධයට RCIT හි සහයෝගය, සිරියාවේ තන්ත්‍ර වෙනස් කිරීම සඳහා වූ යුද්ධයේ ඉස්ලාම්වාදී ප්‍රොක්සි බලවේග වෙත එහි පිටුබලය, සහ 2014 යුක්රේනයේ එක්සත් ජනපදය විසින් පිටුබලය දුන් කුමන්ත්‍රණයට එහි පෙළගැසීම, එහි සාවද්‍ය න්‍යායික පදනම් වලින් සෘජුවම ගලා එයි. මෙම අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වල ව්‍යසනකාරී ප්‍රතිවිපාක—ලිබියාව සහ සිරියාව විනාශ කිරීම, ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ මරණ, මිලියන ගණනක් අවතැන් වීම, සහ ජිහාදි ත්‍රස්තවාදී ජාලවල වර්ධනය—RCIT හි දේශපාලනයේ ප්‍රතිගාමී ස්වභාවය හෙළි කරයි.

ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාව පුරා කම්කරුවන් විශේෂ වැදගත්කමකින් සැලකිය යුත්තේ ජාතික සහ වාර්ගික බෙදුම්වාදය ප්‍රවර්ධනය කිරීම සඳහා RCIT හි වැඩසටහනයි. "ජාතික ස්වයං නිර්ණය" සඳහා සහාය දැක්වීමේ ධජය යටතේ, RCIT ජාතික සහ වාර්ගික රේඛා ඔස්සේ රුසියාව සහ චීනය ඛණ්ඩනය කිරීම වෙනුවෙන් පෙනී සිටියි—එය ඇමරිකානු හමුදා සැලසුම්කරුවන් සහ චින්තන පර්ෂධ විසින් දක්වා ඇති භූ-දේශපාලන උපාය මාර්ග ප්‍රතිරාවය කරන වැඩසටහනකි. මෙම ඉදිරිදර්ශනය ලෙනින් සහ බොල්ෂෙවික්වරුන් විසින් ඉදිරිපත් කරන ලද ජාත්‍යන්තරවාදී වැඩසටහනට සෘජුවම පරස්පර වේ; එය සමාජවාදය වෙනුවෙන් වන අරගලයේදී ජාතික සහ වාර්ගික බෙදීම් හරහා කම්කරු පන්තිය එක්සත් කිරීමේ අතිමහත් අවශ්‍යතාවයට ජාතික ව්‍යාපාර සඳහා සහයෝගය යටත් කළේය.

ශ්‍රී ලංකා කම්කරු පන්තියේ අත්දැකීම RCIT හි බෙදුම්වාදී වැඩසටහනේ බලවත් ප්‍රතික්ෂේප කිරීමක් සපයයි. ධනවාදයේ ප්‍රතිවාදී කොටස් විසින් සිංහල සහ දෙමළ ජාතිකවාදය ප්‍රවර්ධනය කිරීම තුල මූලයන් ඇති දශක තුනක සිවිල් යුද්ධය පෙන්වා දුන්නේ, ජාතික සහ වාර්ගික බෙදීම් කම්කරු පන්තිය දුර්වල කිරීමට සහ ධනවාදී රාජ්‍යයට ශක්තිමත් කිරීමට පමණක් සේවය කරන බවයි. දෙමළ කම්කරුවන්ගේ සහ තරුණයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් වන අරගලය ඉදිරියට ගෙන යා හැක්කේ දිවයිනේ සහ මුළු දකුණු ආසියානු උප මහද්වීපය පුරා සමාජවාදය වෙනුවෙන් සිංහල, දෙමළ සහ මුස්ලිම් කම්කරුවන්ගේ එක්සත් අරගලය හරහා පමණි.

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය RCIT සහ ශ්‍රී ලංකාවේ එහි අලුතින් පිහිටුවන ලද "අනුබද්ධ අංශයේ" ක්‍රියාකාරකම් සමීපව නිරීක්ෂණය කරනු ඇත. කම්කරු පන්තිය අධ්‍යාපන ගත කිරීම සහ අධිරාජ්‍යවාදයේ සහ ජාතික ධනේශ්වරයේ අවශ්‍යතා වෙත කම්කරුවන් යටත් කිරීමට උත්සාහ කරන සියලුම දේශපාලන ප්‍රවණතා හෙළිදරව් කිරීම පිළිබඳ අපගේ වගකීම ලෙස, අපි RCIT හි ප්‍රති-මාක්ස්වාදී දේශපාලනයට එරෙහිව අවශ්‍ය ප්‍රතිවාදාත්මක (polemical) අරගලයේ නිරත වෙනු ඇත.

කම්කරුවන්, තරුණයන් සහ බුද්ධිමතුන් ස්ටර්න්ගේ ලිපිය හොඳින් අධ්‍යයනය කරන ලෙස අපි ඉල්ලා සිටිමු. එය මතු කරන දේශපාලන ප්‍රශ්න—අධිරාජ්‍යවාදය පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණය, ජාතික ප්‍රශ්නයට මාක්ස්වාදී ප්‍රවේශය, යුද්ධයට එරෙහි අරගලය, සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ සැබෑ විප්ලවවාදී නායකත්වයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය—වත්මන් කාලපරිච්ඡේදයේ තීරණාත්මක වැදගත්කමක් ඇත. න්‍යායික පැහැදිලි බව සහ දේශපාලන මූලධර්ම පදනම මත පමණක්, කම්කරු පන්තියට යුද්ධය, ඒකාධිපතිත්වය සහ ධනවාදයට එරෙහි අරගලයේ ඉදිරි ගමන සැලසුම් කළ හැකිය.

***

පෙබරවාරි 18 වන දින ප්‍රකාශයට පත් කරන ලද "<u>සමාජවාදය සහ යුද්ධයට එරෙහි සටන</u>" යන ප්‍රකාශයේ දී, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක), ව්‍යාජ-වාම සංවිධාන රුසියාව සහ චීනය අධිරාජ්‍යවාදී බලවතුන් ලෙස අර්ථ දැක්වීමට ඉක්මන් වී ඇති හේතුව කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරයි. [1]

"මෙම නිර්වචනය හිස් අවකාශයෙන් උදුරා ගෙන ඇති අතර, රුසියාව සහ චීනය, වසර 25 ක් වැනි කෙටි කාලයක් තුළ නිලධාරිවාදීව පරිහානියට පත් වූ සහ විකෘති වූ කම්කරු රාජ්‍යයන්ගේ සිට අධිරාජ්‍යවාදී බලවතුන් දක්වා පරිවර්තනය වූ ඓතිහාසික ක්‍රියාවලිය පැහැදිලි කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නැත.

බීජිං සහ මොස්කව්හි පාලන තන්ත්‍රයන්ට දේශපාලනික විරෝධය ප්‍රකාශ කිරීමේ කාරණයක් පමණක් නම්, "අධිරාජ්‍යවාදී" යන විරුදාවලිය භාවිතා කිරීම අවශ්‍ය නොවනු ඇත. ලෝක සමාජවාදී විප්ලවයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස කම්කරු පන්තිය විසින් රුසියාවේ සහ චීනයේ ධනේශ්වර රාජ්‍යයන් පෙරලා දැමිය යුතු බව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඉල්ලා සිටී. …

චීනය සහ රුසියාව පිළිබඳ විස්තර සඳහා "අධිරාජ්‍යවාදී" යන වචනය එකතු කිරීමෙන් ඉටු වන්නේ කුමන දේශපාලන අරමුණක් දැයි විමසිය යුතුය? ප්‍රායෝගික දේශපාලනික විෂයෙන් ගත් කල, එය ඉතා නිශ්චිත කාර්යයන් ඉටු කරයි.

පළමුව, එය ඇමරිකානු, යුරෝපීය සහ ජපන් අධිරාජ්‍යවාදයේ කේන්ද්‍රීය හා තීරණාත්මක ගෝලීය ප්‍රතිවිප්ලවවාදී භූමිකාව සාපේක්ෂක කරන අතර එම නිසා එය හීන කරයි. මෙය, රුසියාව සහාය ලබා දී ඇති සිරියාවේ අසාද්

තන්ත්‍රය වැනි පාලන තන්ත්‍ර වෙනස් කිරීමේ මෙහෙයුම් වලදී එක්සත් ජනපදය සමඟ ක්‍රියාකාරී සහයෝගීතාවය සඳහා ව්‍යාජ-වමට පහසු කරයි. දෙවනුව, සහ ඊටත් වඩා සැලකිය යුතු ලෙස, චීනය සහ රුසියාව අධිරාජ්‍යවාදී ලෙස නම් කිරීම—සහ ඒ අනුව, ජනවාර්ගික, ජාතික, භාෂාමය සහ ආගමික සුළුතරයන් මර්දනය කරන යටත් විජිත බලවතුන් ලෙස ඇඟවුම් කිරීම—පවතින රාජ්‍යවල සීමාවන් තුළ අධිරාජ්‍යවාදී පිටුබලය ලත් "ජාතික විමුක්ති" නැගිටීම් සහ "වර්ණ විප්ලව" වලට සහාය දැක්වීමට ව්‍යාජ-වමට අවසර හිමි වෙයි."

මෙම තක්සේරුව පස්වන ජාත්‍යන්තරය සඳහා ලීගයෙන් (LIFI) බිඳී ගිය විප්ලවවාදී කොමියුනිස්ට් ජාත්‍යන්තර ප්‍රවණතාවයේ (RCIT) දේශපාලනය මගින් සනාථ වේ. 1970 ගණන්වල ජාත්‍යන්තර සමාජවාදී ප්‍රවණතාවයේ (IST) භේදයකින් මතු වූ LIFI සහ RCIT යන දෙකම සතුව ට්‍රොට්ස්කිවාද විරෝධී දීර්ඝ වාර්තාවක් ඇත. ඔවුන්ගේ සුළු ධනේශ්වර නියෝජිතයින්ගේ ලක්ෂණය වන්නේ දක්ෂිණාංශික ධනේශ්වර බලවේග සඳහා ඔවුන්ගේ ප්‍රායෝගික සහයෝගය වසන් කිරීම සඳහා රැඩිකල් ශබ්ද නවන වාක්‍ය ඛණ්ඩ උච්චාරණය කිරීමයි.

RCIT සහ එහි ශාඛා මෙම ආකාරයේ දේශපාලනය අන්තයටම ගෙන යයි. එහි ජාත්‍යන්තර ලේකම් සහ ප්‍රමුඛ න්‍යායාචාර්ය මිෂෙල් ප්‍රොබ්ස්ටිං (Michael Pröbsting) විසින් ලියන ලද ලේඛන—රැඩිකල් සේ ශබ්ද නගන වාචාල කතා වලින් මුක්කු ගසන ලද මාක්ස්, ලෙනින් සහ ට්‍රොට්ස්කි පිළිබඳ සඳහන් කිරීම් නොතකා—අධිරාජ්‍යවාදී බලවතුන්ගේ විදේශ සහ ආරක්ෂක අමාත්‍යාංශ සහ චින්තන පර්ශද විසින් රචිත මූලෝපායික පත්‍රිකා මෙන් කියවේ.

එක්සත් ජනපදය සහ යුරෝපීය සංගමය විසින් මෙහෙයවන ලද යුක්රේනයේ දක්ෂිණාංශික කුමන්ත්‍රණයෙන් යන්තම් සති කිහිපයකට පසුව, "මහා අධිරාජ්‍යවාදී බලවතෙකු ලෙස රුසියාව" යන මැයෙන් ප්‍රොබ්ස්ටින් විසින් රචිත පත්‍රිකාවක් ජර්මනියේ ප්‍රකාශයට පත් කරන ලදී. ලේඛනයේ ආරම්භක ඡේදවල, ප්‍රොබ්ස්ටිං රුසියාව සහ චීනය අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයන් බව ප්‍රකාශ කරන අතර, එමඟින් ඔවුන්ට එරෙහි අරගලය ජාත්‍යන්තර දේශපාලනයේ කේන්ද්‍රීය ගැටලුව බවට ගම්‍ය කරයි.



මිෂෙල් ප්‍රොබ්ස්ටිං

ඔහු මෙසේ ලියයි:

"යුක්රේනයේ දේශපාලන අර්බුදය සහ සිරියාවේ සිවිල් යුද්ධය මෑතකදී නැවත වරක් රුසියාව අධිරාජ්‍යවාදී බලවතෙකු ලෙස කෙතරම් වැදගත් දැයි පෙන්නුම් කර ඇත. ඇත්ත වශයෙන්ම, මහා අධිරාජ්‍යවාදී බලවතුන් ලෙස රුසියාව සහ චීනය නැගීම මෑත දශකයේ ලෝක දේශපාලනයේ වැදගත්ම වර්ධනයන්ගෙන් එකකි. එය අභ්‍යන්තර අධිරාජ්‍යවාදී එදිරිවාදිකම් සැලකිය යුතු ලෙස වැඩි කර ඇති අතර එම නිසා විවිධ කලාපීය ගැටුම් සහ සිවිල් යුද්ධ තීව්‍ර කිරීම සඳහා පසුබිම සාදයි. *2008* ජෝර්ජියා යුද්ධය, චීනය, ජපානය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර නැගෙනහිර චීන මුහුදේ ගැටුම, සිරියානු සිවිල් යුද්ධය සහ දැන් යුක්රේනයේ සිදුවීම් අපි විශේෂයෙන් පෙන්වා දෙමු". *[2]*

මෙසේ, ප්‍රොබ්ස්ටිංට අනුව, මෑත වසරවල ආක්‍රමණශීලීත්වය සහ ප්‍රධාන බලවතුන් අතර යුද්ධයක වැඩෙන අනතුර පිටුපස ඇති ගාමක බලවේග ඇමරිකානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදය නොවේ. ඒ වෙනුවට, ප්‍රධාන වගකීම පැවරෙන්නේ "අධිරාජ්‍යවාදී යටත් විජිත බලවතුන්" වන රුසියාව සහ චීනයටයි. ප්‍රොබ්ස්ටිං මෙසේ ප්‍රකාශ කරයි:

රුසියාවේ *(සහ චීනයේ)* අධිරාජ්‍යවාදී ස්වභාවය නොසලකා හැරීම බරපතල වැරැද්දක් බවත්, එය නොවැළැක්විය හැකි ලෙසම ප්‍රධාන ලෝක දේශපාලන සිදුවීම් තක්සේරු කිරීමේදී ව්‍යාකූලත්වයට හේතු වන බවත්, පන්ති අරගලයේ බැරිකේඩ වල වැරදි පැත්ත පවා ගැනීමට තුඩු දෙන බවත් අපි සිතමු. *[3]*

අප පෙන්නුම් කරන පරිදි, ප්‍රොබ්ස්ටිං විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවරයන්, "බැරිකේඩ වල වැරදි පැත්තේ" වැඩ කරන බලවේග සමඟ සන්ධානයන් පැහැදිලිවම යුක්ති සහගත කිරීමට ඔහුව යොමු කරයි.

"අධිරාජ්‍යය නැවත ගොඩනැගීම: රුසියානු අධිරාජ්‍යවාදයේ ග්‍රහණය පුළුල් කිරීම සඳහා පුටින්ගේ ධාවනය" යන මාතෘකාවෙන් යුත් මෙම ලේඛනයේ III වන කොටසේ ප්‍රොබ්ස්ටිං මෙසේ පවසයි:

"රුසියාව තම රාජ්‍යය තුළ සහ ඉන් පිටත අනෙකුත් ජාතීන් පීඩාවට පත් කර සූරාකයි. රුසියාවේ ජනගහනයෙන් පහෙන් එකක් පමණ, එනම් *19.1%* ක්,

වාර්ගික සහ ජාතික සුළුතරයන්ට අයත් වේ. වඩාත්ම වැදගත් වන්නේ ටාටාර් *(3.9%)*, යුක්රේනියානුවන් *(1.2%)*, බෂ්කර් *(1.1%)*, චුවාෂස් *(1.1%)*, චෙචන් *(1%)*, ආර්මේනියානුවන් *(0.9%)* සහ අනෙකුත් කුඩා ජනයා ය. සමස්තයක් වශයෙන් ගත් කල, රුසියාවේ ජනවාර්ගික කණ්ඩායම් *185* කට වඩා ජීවත් වෙති*". [4]*

රුසියාවෙන් ජාතිකව හා වාර්ගිකව වෙන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා RCIT සන්නද්ධ අරගලය අනුමත කරයි. ප්‍රොබිස්ටිං මෙසේ ප්‍රකාශ කරයි:



2015 සිට දකුණු චීන මුහුදේ සිය නාවික නිදහසේ මෙහෙයුම් (FONOPs) සම්බන්ධයෙන් එක්සත් ජනපදය වඩ වඩාත් ආක්‍රමණශීලීව කටයුතු කර ඇත. Image Credit: sandboxx.us

“චෙචන් යුද්ධවලදී සහ ඒ හා සමාන සියලු ගැටුම්වලදී *RCIT* හි ස්ථාවරය වන්නේ පීඩිත ජාතිකත්වයන් සඳහා ජාතික ස්වයං නිර්ණ අයිතිය කොන්දේසි විරහිතව ආරක්ෂා කිරීමයි. ජාතික හෝ ජනවාර්ගික කණ්ඩායමක් වෙන් වී තමන්ගේම රාජ්‍යයක් පිහිටුවීමට කැමති නම්, සමාජවාදීන් මෙම ආශාවට සහාය දිය යුතු අතර පීඩක රාජ්‍යයේ ඕනෑම මර්දනයකට එරෙහිව ඔවුන් ආරක්ෂා කළ යුතුය*". [5]*

මෙම වැඩසටහනට බරක් ලබා දීම සඳහා, ප්‍රොබිස්ටින්ගේ ලේඛනයට “රුසියාවේ ජනවාර්ගික සහ ජාතික සුළුතරයන්”, “රුසියාවේ ස්වයං පාලන ප්‍රදේශ” සහ “රුසියාවේ ස්වාභාවික සම්පත්” සිතියම් ඇතුළත් කර ඇත. එකී ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන් ඔහු මෙසේ ලියයි:

“පහත සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කරන පරිදි, රුසියාවේ අමුද්‍රව්‍යවලින් සැලකිය යුතු කොටසක්–ඒවායින් තෙල් හා ගෑස් වඩාත් කැපී පෙනෙන නමුත් කිසිසේත්ම එකම ඒවා නොවේ–ජාතික සුළුතරයන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින කලාපවල පිහිටා ඇත*". [6]*

රුසියාව මෙන්ම චීනය ද කුඩා, පහසුවෙන් ජීර්ණය කළ හැකි කැබලිවලට කපා, රටවල වටිනා ස්වාභාවික සම්පත් පාලනය කිරීමේ ඉදිරිදර්ශනය, ප්‍රමුඛ අධිරාජ්‍යවාදී භූ-මූලෝපායකයින් විසින් දිගු කලක් තිස්සේ සාකච්ඡා කර ඇත.

එක් උදාහරණයක් *Foreign Affairs* හි වත්මන් සංස්කරණයෙන් සොයාගත හැකිය. ඉරාක ආක්‍රමණය පිටුපස සිටි ප්‍රමුඛ එක්සත් ජනපද මූලෝපාඥයන් සහ සැලසුම්කරුවන්ගෙන් එකෙකු වන වන රොබට් ඩී. කැප්ලාන්, “යුරේසියාවේ එළඹෙන අරාජිකත්වය” යන මාතෘකාවෙන් යුත් ලිපියකින් පුරෝකථනය කරන්නේ රුසියාවේ සහ චීනයේ ආර්ථික අර්බුදය ගැඹුරු අභ්‍යන්තර ආතතීන් අවුස්සනු ඇති බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, විවිධ ජනවාර්ගික, ආගමික සහ භාෂාමය සුළුතරයන්ගෙන් ජාතික ස්වයං පාලනය සඳහා වන ඉල්ලීම් තීව්‍ර වනු ඇත. [7]

කැප්ලාන්ට අනුව රුසියාව “කැලඹීමකට” ඇද වැටෙනු ඇති අතර එය “නැවතත් කැබලිවලට කැඩී යා හැකිය.” ඔහු “කේන්ද්‍රයෙන් දුරස්ථ, ලේ වැකි දේශපාලනයෙන් බර වූ, රුසියාවේ සයිබීරියානු සහ ඈත පෙරදිග දිස්ත්‍රික්කවල ප්‍රදේශ සමඟ, දැඩි ලෙස මුස්ලිම් උතුරු කොකේසස්” වෙත අවධානය යොමු කරමින් සඳහන් කරන්නේ, ඒවා “ක්‍රෙම්ලිනය තුළම අස්ථාවරත්වයක් ඇති වුවහොත් මොස්කව් සමඟ ඔවුන්ගේ සබඳතා ලිහිල් වීමට පටන් ගත හැකි” බවයි.

චීනය සම්බන්ධයෙන් ගත් කල, කැප්ලාන් “මෙම විශාල රට තුළ වර්ධනය වන වාර්ගික ආතතීන්” ගැන අනතුරු අඟවයි. ඔහු තවදුරටත් මෙසේ පවසයි: “යම් දුරකට, හන් ආධිපත්‍යය දරන චීන රාජ්‍යය යනු මොංගෝලියානුවන්, ටිබෙට් ජාතිකයන් සහ උයිගර්වරුන් ඇතුළු විවිධ ජාතීන්ගේ සිරගෙයකි; ඔවුන් සියල්ලෝම විවිධ මට්ටම්වලින් මධ්‍යම පාලනයට විරුද්ධ වී ඇත.” කැප්ලාන් නිගමනය කරන්නේ, “අද, උයිගර් සටන්කාමීන් නියෝජනය කරන්නේ ආසන්නතම බෙදුම්වාදී තර්ජනයයි.”

සිරියාවේ ඉස්ලාමීය බලවේග සමඟ සහයෝගීතාවයෙන් ජවසම්පන්නව ඉදිරියට යාමට එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ එහි සහචරයින්ගේ අධිෂ්ඨානය, රුසියාවේ සහ චීනයේ බෙදුම්වාදී ව්‍යාපාර සඳහා මිලිටරි පුහුණුව ලබා දීම අරමුණු කරගත් බවට ඇඟවීම් තිබේ. පසුගිය දෙසැම්බරයේ *London Review of Books* හි පළවූ ලිපියක, හොඳ සබඳතා ඇති එක්සත් ජනපද මාධ්‍යවේදී සෙමූර් හර්ෂ්, තුර්කිය “විශේෂ ප්‍රවාහනය මගින් උයිගර්වරුන් සිරියාවට ගෙනැවිත් ඇත්තේ, රිසෙප් ටයිප් එර්ඩෝගන්ගේ රජය චීනයේ ඔවුන්ගේ අරගලයට පක්ෂව උද්ඝෝෂණ කරමින් සිටින අතර” යයි වොෂින්ටනයේ නිලධාරියෙකු උපුටා දක්වමින් සඳහන් කළේය. හර්ෂ් විසින් උපුටා දක්වන ලද එක්සත් ජනපද නිලධාරියා තවදුරටත් ප්‍රකාශ කළේ උයිගර් සටන්කරුවන් 800 කට වැඩි පිරිසක් ඊනියා “මී පාර” (rat line) හරහා සිරියාවට ගෙනැවිත් ඇති බවයි. [8]

මෙම ප්‍රතිපත්තියේ ඓතිහාසික වශයෙන් ප්‍රතිගාමී ඇඟවුම් විශේෂයෙන් චීනය සම්බන්ධයෙන් කැපී පෙනේ. 20 වන සියවස ආරම්භයේදී චීනයේ වර්ධනය වූ ජාතික ව්‍යාපාරය, ඓතිහාසික වශයෙන් ප්‍රගතිශීලී–අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ඔවුන්ගේ “විවෘත දොර” නම් කොල්ලකෑමේ වැඩසටහනේ අවශ්‍යතා සඳහා පවත්වාගෙන ගිය වැඩවසම් බෙදීම් ජය ගැනීම සඳහා විවිධ භාෂාමය සහ ජනවාර්ගික කණ්ඩායම් එක්සත් කිරීමේ – කර්තව්‍යයකට වෛෂයිකව මුහුණ දුන්නේය. කෙසේ

වෙතත්, ධනේශ්වරයේ නායකත්වය යටතේ එය විසඳිය නොහැකි විය. ප්‍රොබිස්ටිං සහ RCIT රුසියාව සහ චීනය බෙදීමට ජාතිකවාදී සහ ජනවාර්ගික කේන්ද්‍රීය ව්‍යාපාර දිරිමත් කරන්නේ නම්, ප්‍රොබිස්ටිං සිට ගන්නේ, ඔවුන් ව්‍යාජ ලෙස ප්‍රකාශ කරන ලෙනින්ගේ සහ මාක්ස්වාදී ව්‍යාපාරයේ ජාත්‍යන්තරවාදී සමාජවාදී සම්ප්‍රදාය තුළ නොව, අධිරාජ්‍යවාදයේ සම්ප්‍රදාය තුළය.

සියවසකට වැඩි කාලයකට පෙර–එනම්, ගෝලීය ධනවාදී සංවර්ධනයේ අසමසම ලෙස පහළ මට්ටමක දී–ලියන ලද "ජාතික ප්‍රශ්නය" පිළිබඳ ලෙනින්ගේ කෘතිය, අධිරාජ්‍යවාදී පිටුබලය ලත් බෙදුම්වාදී ව්‍යාපාර සඳහා ඔවුන්ගේ සහයෝගය නීත්‍යානුකූල කිරීම සඳහා සුලු ධනේශ්වර ව්‍යාජ-වාම ප්‍රතිගාමීහු ඉඳහිට කැඳවා ගනිති. ජාතික ප්‍රශ්නයට ලෙනින්ගේ ප්‍රවේශය සැමවිටම "විවේචනශීලී" වූ බව ඔවුන් අනිවාර්යයෙන් නොසලකා හරිති. අප්‍රිකාවේ, මැදපෙරදිග සහ ආසියාවේ විශාල කොටස් වැඩවසම් ක්‍රමයේ සහ අධිරාජ්‍යවාදී-යටත් විජිතවාදී ආධිපත්‍යයේ නටබුන් වලට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී අරගලයේ පළමු අදියරවල යෙදී සිටි 1913 දී ලියමින්, ලෙනින් ජාතික පීඩනයට එරෙහි අරගලයේ සුජාතකභාවය පිළිගත්තේය. නමුත් ඔහු ස්වයං නිර්ණය සඳහා සහාය සඳහා දැඩි සීමාවන් පැනවීය. ස්වයං නිර්ණ ඉල්ලීම අනුමත කිරීමේ කාර්යය,

"බොහෝ දුරට ඍණාත්මක එකකි. නමුත් ජාතිකවාදයට සහාය දැක්වීමේදී නිර්ධන පන්තියට යා හැකි සීමාව මෙයයි, මන්ද ඉන් ඔබ්බට, ජාතිකවාදය ශක්තිමත් කිරීමට උත්සාහ කරනා ධනේශ්වරයේ "ධනාත්මක" ක්‍රියාකාරීත්වය ආරම්භ වේ... නමුත් මෙම දැඩි ලෙස සීමිත හා නිශ්චිත ඓතිහාසික සීමාවන් ඉක්මවා ඉන් ඔබ්බට යන්නට ධනේශ්වර ජාතිකවාදයට උදව් කිරීම යනු නිර්ධන පන්තිය පාවා දීම සහ ධනේශ්වරය සමඟ පැත්ත ගැනීමයි. මෙහි මායිම් රේඛාවක් ඇත, එය බොහෝ විට ඉතා සිහින් වන අතර බුන්ඩිස්ට්වාදීන් සහ යුක්රේන ජාතිකවාදී-සමාජවාදීහු එය සම්පූර්ණයෙන්ම නොසලකා හරිති. *[9]*

1913 දී පවා, ලෙනින් ජාතික බෙදුම්වාදයේ ධජය යටතේ අසංඛ්‍යාත කුඩා රාජ්‍යයන් පිහිටුවීම සඳහා සහාය ප්‍රතික්ෂේප කළේය. මධ්‍යගතකරණයේ ආර්ථික වැදගත්කම ඔහු අවධාරණය කරමින්, "පන්ති සවිඥානික නිර්ධන පංතිය සැමවිටම විශාල රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටිනු ඇත" යනුවෙන් තර්ක කළේය. [10] මෙය ලියා ඇත්තේ, ඔක්තෝබර් විප්ලවයට පෙර, ධනේශ්වර ගෝලීයකරණයේ සංවර්ධනය බෙහෙවින් පහළ මට්ටමක පැවති අවස්ථාවක සහ ජාතික හා වාර්ගික බෙදුම්වාදය ප්‍රවර්ධනය කිරීම කම්කරු පන්තියේ පන්ති සවිඥානික කොටස්වල සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී අභිලාෂයන්ට එරෙහිව ධනේශ්වර-අධිරාජ්‍යවාදී යුද්ධයේ වඩාත්ම බලගතු අවිය බවට පත්වීමට වසර 103 කට පෙරය.

ඓතිහාසික නොදැනුවත්කම න්‍යායික වංචාව සමඟ ඒකාබද්ධ කරමින් ප්‍රොබිස්ටිං, ජාතික ස්වයං නිර්ණය පිළිබඳ සටන් පාඨය යොදා ගනිමින්, කම්කරු පන්තිය බෙදීමට සහ අධිරාජ්‍යවාදය විසින් ගොඩනඟා අරමුදල් සපයනු ලැබුවා වුවද සියලු ජාතික හා වාර්ගික බෙදුම්වාදී ව්‍යාපාරවලට "කොන්දේසි විරහිත" සහයෝගය ලබා දෙයි. RCIT පැහැදිලිවම "විමුක්ති අරගලයට–එහි සන්නද්ධ ස්වරූපය ද ඇතුළුව–කොන්දේසි විරහිත සහයෝගයක්!" ඉල්ලා සිටී. මෙය "උදාහරණයක් ලෙස සමාජවාදී දෙමළ ඊලම, එක්සත් අයර්ලන්තය, එක්සත් කාශ්මීරය, ස්වාධීන කුර්දිස්තානය, චෙච්නියාව, ටිබෙට් යනාදිය සඳහා" අදාළ වේ. RCIT මෙම බෙදුම්වාදී වැඩසටහන, "චීනයේ උයිගර්, තුර්කිය, ඉරාකය, ඉරානය සහ සිරියාවේ කුර්දි, චෙච්නියානුවන් සහ රුසියාවේ අනෙකුත් කොකේසියානු ජනයා" දක්වා ව්‍යාප්ත කරයි. [11]

පසුගිය දශක කිහිපයේ ඓතිහාසික අත්දැකීම් සහ දේශපාලන පාඩම් ග්‍රහණය කර ගැනීමට පවා උත්සාහ නොකර, ප්‍රොබිස්ටිං සහ RCIT ඉතා විවිධාකාර ගැටළු එකට එකතු කරති. මෙම සංකීර්ණ ක්‍රියාවලීන් සවිස්තරාත්මක විශ්ලේෂණයකට භාජනය කිරීම මෙම ලිපියේ කාර්යය නොවේ, නමුත් RCIT හි දේශපාලනයේ ප්‍රතිගාමී ස්වභාවය අවම වශයෙන් උදාහරණ දෙකක් ආශ්‍රයෙන් පෙන්නුම් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ තිස් වසරකට වැඩි කාලයක් පැවති සිවිල් යුද්ධය, දෙමළ බෙදුම්වාදය කම්කරු පන්තියට ආවෘත අන්තයක් බවත්, "සමාජවාදී දෙමළ ඊලමක්" සඳහා අරගලය සාක්ෂාත් කරගත හැක්කේ ශ්‍රී ලංකාව පුරා සමාජවාදය සඳහා අරගලයක යෙදෙන සිංහල හා මුස්ලිම් කම්කරුවන් සමඟ සන්ධානයකින් පමණක් බවත් ඔප්පු කර ඇත. කාශ්මීරයට ද එය එසේම අදාළ වේ. 1947 දී ඉන්දියාව ආගමික රේඛා ඔස්සේ බෙදා ලීමට එරෙහිව සමස්ත ඉන්දියානු උප මහාද්වීපයේම සමාජවාදී ඉදිරිදර්ශනයක් සහ ජනතාවගේ ඒකාබද්ධ අරගලයක් නොමැතිව, "ස්වාධීන කාශ්මීරයක්" සඳහා වන ඉල්ලීම ගැඹුරින්ම ප්‍රතිගාමී ය.

ස්ටැලින්වාදී නිලධරය විසින් සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසු, අධිරාජ්‍යවාදී බලවතුන් නැවත නැවතත් ගැටුම් දිරිමත් කර ඇති අතර තමන්ගේම භූ මූලෝපායික සහ ආර්ථික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජාතික හා වාර්ගික සුළුතරයන් එකිනෙකාට එරෙහිව තල්ලු කර ඇත. මේ සඳහා ලේ වැකි උදාහරණයක් වූයේ 1990 ගණන්වල යුගෝස්ලාවියාව ප්‍රචණ්ඩ ලෙස බෙදීමයි; එහිදී ලක්ෂ සංඛ්‍යාත ජීවිත හානි සහ මිලියන සංඛ්‍යාත සරණාගතයින් බිහිවීම සිදුවිය. ජර්මනිය සහ ඇමරිකා එක්සත් ජනපදය, සර්බියානුවන්, මුස්ලිම්වරුන් සහ ක්‍රොඒෂියානුවන් එකිනෙකා මරා ගැනීමට පෙළඹවීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ අතර, පසුව ඔවුන්ම මිලිටරිමය වශයෙන් මැදිහත් විය. බොහෝ ව්‍යාජ-වාම සංවිධාන ධනේශ්වර ජාතිකවාදයේ විෂ පතුරුවා හැරීම සඳහා අධිරාජ්‍යවාදී බලවතුන් සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු

කළේය. "1992-95 දී බොස්නියානුවන්ගේ අරගලයට" සහ "1999 දී කොසෝවෝ ඇල්බේනියානුවන්ගේ" අරගලයට සහාය දුන් බවට RCIT අද දක්වාම පුරසාරම් දොඩමින් සිටී. අධිරාජ්‍යවාදී බලවතුන්ගේ වත්මන් යුද ප්‍රතිපත්තිවල සන්දර්භය තුළ, RCIT හි අත්වල ද ලේ තැවරී ඇති අතර, ICFI විසින් එහි ප්‍රකාශයේ විස්තර කර ඇති එම භූමිකාවම ඉටු කරමින් සිටී.

සිරියාවේදී, ඔවුන් "සිරියානු විප්ලවය ආරක්ෂා කිරීමේ" නාමයෙන්, සීඅයිඒ පිටුබලය ලත් පාලන තන්ත්‍ර වෙනසක් සඳහා වන යුද්ධයට පක්ෂව ප්‍රචාරණයේ යෙදෙති.

"සිරියානු විප්ලවයේ පස්වන සංවත්සරය වෙනුවෙන්" මාර්තු 8 වන දින නිකුත් කරන ලද පත්‍රිකාවක, වෙනත් දේ අතර, "අද, රුසියානු රාශිභූත හමුදා ප්‍රහාර සහ ඉරානය මෙහෙයවන දහස් ගණනක හමුදා ආධාරයෙන්, අසාද් තන්ත්‍රය නිදහස් ඇලෙප්පෝව දියකර හැරීමට තර්ජනය කරයි" යනුවෙන් සඳහන් වේ. [12] පසුගිය දෙසැම්බරයේ "සියලු විප්ලවවාදී සංවිධාන සහ ක්‍රියාකාරීන් වෙත විවෘත ලිපියක්" ලියමින්, "සිරියාවේ විප්ලවවාදී විමුක්ති අරගලය අඛණ්ඩව පවතී, නමුත් දැවැන්ත තර්ජනවලට මුහුණ දෙයි. රුසියානු අධිරාජ්‍යවාදයේ මෙන්ම ඉරානයේ ද පූර්ණ සහයෝගය ඇතිව බෂාර් අල්-අසාද්ගේ මිනීමරු ආඥාදායකත්වය තමන්ගේම ජනතාවට එරෙහිව විනාශකාරී යුද්ධය දිගටම කරගෙන යයි," යනුවෙන් ඔවුහු සඳහන් කළහ.[13]

ඒ අතරම, අධිරාජ්‍යවාදී බලවතුන් විසින් මැද පෙරදිග කැබලි කර යලි යටත් විජිතකරණය කිරීමට විරුද්ධ වන "කට්ටිවාදී අධිරාජ්‍ය විරෝධීන්" RCIT හෙළා දකී.

"විමුක්ති අරගල සහ අධිරාජ්‍යවාදී මැදිහත්වීම්. බටහිර රටවල කට්ටිවාදී 'අධිරාජ්‍ය විරෝධ' අසාර්ථකත්වය: මාක්ස්වාදී දෘෂ්ටි කෝණයෙන් සමහර පොදු සලකා බැලීම් සහ 2011 දී ලිබියාවේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ උදාහරණය" යන රුවට්ලිකාරී මාතෘකාව දරන වැඩ සටහන් ලිපියක–ප්‍රොබ්ස්ටිං 2011 දී ලිබියාවේ නේටෝ යුද්ධය විප්ලවයක් සහ කම්කරු පන්තියේ ජයග්‍රහණයක් ලෙස සුබ පැතීම ප්‍රතික්ෂේප කළ සියල්ලන්ටම පහර දෙයි.

ප්‍රොබ්ස්ටිං මෙසේ ලියයි:

*"අනෙක් අතට, අපි තර්ක කරන්නේ ධනේශ්වර-බොනපාට්වාදී ගඩාෆි පාලනය පරාජය කළ බැවින් ලිබියානු විප්ලවය කම්කරු පන්තියට සහ පීඩිතයින්ට අර්ධ ජයග්‍රහණයක් ලබා දෙමින් අවසන් වූ බවයි... ලිබියානු විප්ලවයේ තවත් ධනාත්මක ප්‍රතිවිපාකයක් වන්නේ අසාවඩ් ජනරජය පිහිට වූ මාලි හි ටුවාරෙග් ජනතාවගේ ජාතික විමුක්ති අරගලයේ ප්‍රගතියයි... නැවතත්, අපගේ මතය අනුව, මෙය පෙන්නුම් කරන්නේ ලිබියාවේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ අර්ධ ජයග්‍රහණය පීඩිත ජනතාවට වාසිදායක වී ඇති බවයි." [14]*

මෙම තක්සේරුව විකාර සහගත මෙන්ම නරුම ද වේ. ගඩාෆි තන්ත්‍රය "පෙරලා දමන ලද්දේ" ලිබියානු කම්කරුවන්ගේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් විසින් නොව, ගුවනින් නේටෝ බෝම්බ සහ බිමින් බටහිර රටවල සහාය ඇති ඉස්ලාමීය ප්‍රොක්සි (නියෝජිත) හමුදා විසිනි. මෙම "අර්ධ ජයග්‍රහණයේ" ප්‍රතිඵලය වන්නේ විනාශභාග වූ සමාජයක්, දස දහස් ගණනක් මරණ, ලක්ෂ සංඛ්‍යාත සරණාගතයින් සහ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ මැදිහත්වීමක අලුත් තර්ජනයයි.

මෙම වර්ධනය මාලි රාජ්‍යයට කිසිසේත් "වාසිදායක" දෙයක් නොවීය. එය ව්‍යසනයක් විය. ස්වාභාවික සම්පත්වලින් පොහොසත් රට, ලිබියානු යුද්ධය සහ එහි අසල්වැසියාගේ විනාශය හේතුවෙන් අර්බුදයකට ඇද දමා අස්ථාවර විය. උතුරේ ටුවාරෙග් සටන්කාමීන් සහ ඉස්ලාම්වාදීන්ගේ කැරැල්ල "විමුක්තිය" කරා නොව, සිවිල් යුද්ධයට සමාන තත්වයන්ට, බමාකෝහි හමුදා කුමන්ත්‍රණයකට සහ හිටපු යටත් විජිත බලවතා වූ ප්‍රංශයේ සහ එක්සත් ජනපදය ඇතුළු එහි අධිරාජ්‍යවාදී සහචරයින්ගේ මිලිටරි මැදිහත්වීමට මඟ පෑදීය.

RCIT හා සමාන ආස්ථානයන් අනුගමනය කරන බොහෝ ව්‍යාජ-වාම ප්‍රවනතා දේශපාලනිකව ප්‍රතිගාමී බලවේගයන්ට අනුවර්තනය වීම සැඟවීමට උත්සාහ කරද්දි, RCIT මුලෝපායික අත්‍යවශ්‍යතාවයක් ලෙස ප්‍රති-විප්ලවවාදී ප්‍රවනතා සමඟ සහයෝගී වීම සාධාරණීකරණය කරයි.

එහි "විප්ලවවාදී කොමියුනිස්ට් ප්‍රකාශනයේ" RCIT මෙසේ ප්‍රකාශ කරයි:

*"ඇත්ත වශයෙන්ම, වර්තමාන තත්වයන් යටතේ එවැනි නව ජාතික පක්ෂයක් හෝ පස්වන ජාත්‍යන්තරයක් පරස්පර විරෝධී පන්ති ස්වභාවයක් ගන්නා බව අපි දනිමු, මන්ද එයට විප්ලවවාදී පමණක් නොව, ප්‍රතිසංස්කරණවාදී සහ මාධ්‍යමික බලවේග ද ඇතුළත් වන බැවිනි. මෙය, එහි නායකයින් පන්ති අරගල මාලාවකින් අසාර්ථක වනු ඇති, නැතහොත් කම්කරුවන්ට එරෙහිව බැරිකේඩ වල අනෙක් පැත්තේ පවා සිටගනු ඇති ජාත්‍යන්තරයක් වනු ඇත." [15]*

මෙම පුදුමාකාර සූත්‍රගත කිරීම RCIT හි භාවිතය තුළ මුල් බැස ඇත. RCIT හි අංග ඇති සහ දේශපාලනිකව ක්‍රියාකාරී වන ඕනෑම තැනක, එය ධනේශ්වර බලවේගයන්ට සහාය දක්වන අතර ඇත්ත වශයෙන්ම "බැරිකේඩ වල අනෙක් පැත්තේ" සිටගෙන සිටී. 2013 දී ඔස්ට්‍රියාවේ පැවති අවසන් ජාතික මැතිවරණවලදී, RKO ලිබරේෂන් (RKOB) සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට (SPÖ) ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටි අතර, එය දැනට වියානාහි ෆෙඩරල් මට්ටමින් කොන්සර්වේටිව් ඔස්ට්‍රියානු මහජන පක්ෂය (ÖVP) සමඟ සන්ධානයක් පිහිටුවා සිටිද්දි, බර්ගන්ලන්ඩ් ප්‍රාන්තයේ අන්ත දක්ෂිණාංශික, විදේශික භීතික (xenophobic) ඔස්ට්‍රියානු නිදහස් පක්ෂය (FPÖ) සමඟ සන්ධානයක සිටී.

අප්‍රිකාවේ සහ ආසියාවේ ඔවුන්ගේ ආධාරකරුවන් අන්ත දක්ෂිණාංශික ජාතිකවාදී බලවේග සමඟ සහයෝගයෙන් කටයුතු කරති. කලින් උපුටා දක්වන ලද "විවෘත ලිපියේ" RCIT, "ප්‍රතිසංස්කරණවාදීන්ගේ සහ ජනතාවාදීන්ගේ බලපෑම යටතේ සිටින අය ඇතුළත් විය යුතු කම්කරුවන්ගේ සහ ජනප්‍රිය සංවිධානවල බහුජන එක්සත් පෙරමුණක්" වෙනුවෙන් පෙනී සිටී.

මෙම දක්ෂිණාංශික, ධනේශ්වර සහ අධිරාජ්‍ය ගැති දිශානතිය අනෙකුත් ව්‍යාජ-වාම ප්‍රවනතාවන්ගේ සහයෝගය ලබාගෙන ඇත. ප්‍රොබ්ස්ටිං බොහෝ ව්‍යාජ-වාම සාකච්ඡා අවස්ථාවල ඉහලින් පිළිගන්නා ආරාධිත අමුත්තෙක් වේ; උදාහරණයක් ලෙස, 2015 ජූලි මාසයේදී හතරවන ජාත්‍යන්තරය නැවත ස්ථාපිත කිරීම සඳහා වූ සම්බන්ධීකරණ කමිටුව (CRFI) විසින් සංවිධානය කරන ලද ඇතන්ස් හි පැවති "තුන්වන යුරෝ-මධ්‍යධරණී සමුළුවේදී" ඔහු කතා කළේය. CRFI හි සාමාජිකයින් අතර, 1985 දී ICFI යෙන් සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය සඳහා මොනයම්ම හෝ සමාජවාදී ඉදිරිදර්ශනයකින් බිඳී ගිය සවාස් මයිකල්-මට්සාස් විසින් නායකත්වය දෙන ග්‍රීසියේ කම්කරු විප්ලවවාදී පක්ෂය (EEK) සහ ආර්ජන්ටිනාවේ කම්කරු පක්ෂය (PO) ඇතුළත් වේ.[16]

සමුළුව පිළිබඳ සිය වාර්තාවේ දී, රුසියානු සහ යුක්රේන නියෝජිතයින්ගේ දායකත්වයන් RCIT විවේචනය කළේ ඔවුන් "රුසියානු අධිරාජ්‍යවාදයට එරෙහි ඔවුන්ගේ මෘදු බව බොහෝ විට ප්‍රකාශ කළ" බැවිනි. CRFI හි "සහෝදරවරුන්" සමඟ "වැදගත් දේශපාලන වෙනස්කම්" ද තිබුණි. RCIT මෙසේ ලිවීය:

*"RCIT රුසියාව සහ චීනය අධිරාජ්‍යවාදී බලවතුන් ලෙස විස්තර කළද, මෙම සහෝදරවරු එසේ නොකරති. තවද, RCIT එහි සුලු ධනේශ්වර ඉස්ලාමීය නායකත්වය නොතකා සිරියානු විප්ලවයට සහාය දීම දිගටම කරගෙන යන අතර, RedMed සහෝදරවරු [RedMed ජාලය CRFI ඔන් ලයින් වේදිකාවකි] ඔවුන්ගේ සහයෝගය නවතා දැන් පරාජකවාදී ආස්ථානයක් ගෙන ඇත." [17]*

මෙම වෙනස්කම් තිබියදීත්, RCIT ය සමුළුව "ප්‍රයෝජනවත්" බව සටහන් කළේය.

**පාදසටහන්:**

[1] බලන්න http://www.wsws.org/en/articles/2016/02/18/icfi-f18.html/

[2] "Russia as a Great Imperialist Power," *Revolutionary Communism,* No. 21, March 2014, p. 3. සම්පූර්ණ ප්‍රකාශය :___________http://www.thecommunists.net/theory/imperialist-russia/

[3] එම

[4] එම, 16 පිටුව

[5] එම

[6] එම

[7] https://www.foreignaffairs.com/articles/china/2016-02-15/eurasias-coming-anarchy

[8] http://www.lrb.co.uk/v38/n01/seymour-m-hersh/military-to-military

[9] "Critical Remarks on the National Question," *Lenin Collected Works*, Volume 20 [Moscow, 1964], pp. 34-35

[10] එම, පිටුව 46

[11] "The Revolutionary Communist Manifesto," *Programme of the Revolutionary Communist International Tendency (RCIT)*, pp. 48-49

[12] http://www.thecommunists.net/worldwide/africa-and-middle-east/rcit-als-syria/

[13] http://www.thecommunists.net/rcit/open-letter-revolutionary-unity/

[14] http://www.thecommunists.net/theory/liberation-struggle-and-imperialism/


[15] http://www.thecommunists.net/rcit-manifesto/the-leadership-we-have-and-the-leadership-we-need/

[16] ප්‍රොබ්ස්ටිංගේ නව දේශපාලන සගයෙකු වන්නේ ඇලෙක්ස් ස්ටයිනර් ය. ඔහු වසර 40 කට පමණ පෙර හතරවන ජාත්‍යන්තරයෙන් ඉවත් වූ අතර එතැන් සිට දරුණු ට්‍රොට්ස්කි විරෝධියෙකු බවට වර්ධනය වී ඇත. පාලනය කළ නොහැකි දේශපාලන අවස්ථාවාදයේ සහ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායකත්වයේ ඔහුගේ පැරණි සහෝදරවරුන් කෙරෙහි ව්‍යාධිජනක ආත්මීය වෛරයක දුෂ්ට අන්තර්ක්‍රියාවකින් මෙහෙයවනු ලැබෙන ස්ටයිනර්ට, සගයන් තෝරා ගැනීමේදී ඔහුගේ ප්‍රධාන නිර්ණායකය වන්නේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට ඔවුන්ගේ විරුද්ධත්වයයි. ඔහු ICFI ට එරෙහිව විභව්‍ය සහචරයින් සෙවීම සඳහා යුරෝ-මධ්‍යධරණී සමුළුවට සහභාගී වූ අතර එහිදී ඔහුට ප්‍රොබ්ස්ටිං හමුවිය. රුසියාව සහ චීනය අධිරාජ්‍යවාදී ලෙස අර්ථ දැක්වීම අනුමත කරමින්, ස්ටයිනර් ප්‍රොබ්ස්ටිංගේ ලේඛන ඔහුගේ permanent-revolution.org බ්ලොග් අඩවියේ පළ කරයි. ස්ටයිනර්ගේ දේශපාලන ඉතිහාසය පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් ඩේවිඩ් නෝර්ත්ගේ "ෆ්‍රැන්ක්ෆර්ට් පාසල, පශ්චාත් නූතනවාදය සහ ව්‍යාජ-වාම දේශපාලනය*:* මාක්ස්වාදී විවේචනයක්" හි අන්තර්ගත වේ. [කියවන්න: https://mehring.com/frankfurt-school-postmodernism.html]

[17] http://www.thecommunists.net/rcit/euro-mediterranean-conference-2015/

# ‘කොමියුනිස්ට්’ විරෝධී ඉන්දුනීසියානු මහා ජන සංහාරයෙන් 60 වසරක් – I කොටස

**මිගාර මල්වත්ත** විසිනි.



ඉන්දුනීසියානු සමූලඝාතනවලට ගොදුරු වූවන් සමූහ මිනී වලවල්වලට හෝ ගංගාවලට විසි කරන ලදී (1965)

මෙම වසරේ ඔක්තෝබර් මාසයේදී, ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂ (PKI) සාමාජිකයින් සහ ආධරකරුවන් කේන්ද්‍ර කරගනිමින් 1965 දී කම්කරු පීඩිත මහජනතාවට එරෙහිව සිදු කරන ලද ජන සංහාරයට හැට වසරක් පිරුණි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ආසියාව, අප්‍රිකාව සහ ලතින් ඇමරිකානු කලාපයන් පුරා සැඩ සුළඟක් මෙන් හමා ගිය අධිරාජ්‍යවාදයට සහ දේශීය කොම්ප්‍රදෝරු ධනපති පන්තියට එරෙහි කම්කරු පීඩිත මහජනතාවගේ දැවැන්ත අරගලයන් අතරට, ඉන්දුනීසියානු කම්කරු පීඩිත මහජනතාව විසින් දියත් කරන ලද අරගලය ද ඇතුළත් විය. ප්‍රතිගාමී ස්ටැලින්වාදී නිලධාරීවාදයත්, 1950 ගණන්වල මුලදී මෙම ස්ටැලින්වාදී නිලධාරීවාදය රැක ගැනීම සඳහා අධිරාජ්‍යවාදයේ තවත් ඒජන්සියක් ලෙස මතු වූ පැබ්ලෝවාදයත් පිහිට කර ගනිමින්, අධිරාජ්‍යවාදය හා එහි සහායක දේශීය කොම්ප්‍රදෝරු ධනපති පංතිය විසින් කම්කරු පීඩිත මහජනතාවට අත්කර දුන් අතිදැවැන්ත පරාජයක් ලෙස මෙම සමූලඝාතනය හඳුනාදිය හැකිය. ස්ටැලින්වාදී ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයේ සහයෙන් දේශීය ධනපති පන්තිය විසින් ඉන්දුනීසියානු ජාතික විමුක්ති අරගලය පාවා දීම, 1965 දී සිදු වූ ලේ වැකි කුමන්ත්‍රණය, ඒ තුළ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මැදිහත් වීම, මෙම සමූලඝාතනය උදෙසා නැවත වරක් PKI නායකත්වය හා පැබ්ලෝවාදීන් විසින් සිදු කරන ලද පාවාදීම, මෙම ලේ වැකි සමූලඝාතනයෙන් පසු බලය ලබා ගත් සුහාර්තෝගේ හමුදා ඒකාධිපතිත්වය යටතේ 1998 දක්වා වූ දැඩි මර්දනකාරී පාලනය හා 1997 ආසියානු මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස කැරලිකාර මහජනතාව විසින් සුහාර්තෝ පලවා හැරීම දක්වාත් ඉන් පසු ප්‍රතිසංස්කරණ යුගය (Reformasi) ලෙස ධනපති ක්‍රමය යළි ස්ථාපිත වීම දක්වාත් ඓතිහාසික වාර්ථාවක් මෙම ලිපි මාලාවට අඩංගු වේ. මෙම ඓතිහාසික වාර්තාව සලකා බැලෙන්නේ විශේෂයෙන් මෙම කාල පරිච්ඡේදය තුල විජිත හා ධනපති සංවර්ධනයේ පසුගාමී රටවල ජාතික ධනේශ්වරයේ හා සුලු ධනපති පන්තියේ නායකත්වයන් විසින් කම්කරු පීඩිත අරගල ග්‍රහනයට ගැනිම හා ඊට බැඳි පැබ්ලෝවාදයේ අවස්ථාවාදී ක්‍රියාකලාපය විග්‍රහ කර ගැනීමේ පසුබිමක් වශයෙනි. ඒ සමගම

ඉන්දුනීසියාවේ කම්කරු, ගොවි හා ශිෂ්‍යයින් ඇතුලු පීඩිත මධ්‍යම පන්තිය දේශපාලනික අවමංගතභාවයේ හෙලමින් කම්කරු පන්තියේ ස්වාධීන විප්ලවවාදී ජාත්‍යන්තරවාදී වැඩ පිළිවෙළට හතුරුව කටයුතු කරන වත්මන් ජාතිකවාදී ධනපති ව්‍යාපාර හා සුළු ධනපති ව්‍යාජ-වාම සංවිධානවල ක්‍රියාකලාපය සලකා බලමින්, මෙම සියලු පාවාදීම්වලට එරෙහිව විප්ලවවාදී ඉදිරිදර්ශනයක් සහිතව සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදයේ ධජය යටතේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව(හජජාක) විසින් සිදු කරන ලද අරගලය සාකච්ඡා කිරිම සහ ඉන්දුනීසියාවේ එහි ශාඛාවක් පිහිටුවීමේ අවශ්‍යතාව මතු කිරීම මෙම ලිපි මාලාවේ අරමුණයි.

***

ඇමරිකානු CIA සංවිධානය මැදිහත් වීමෙන් සිදු කළ හමුදා කුමන්ත්‍රණයක් හරහා ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂ (PKI) සාමාජිකත්වය හා සහායකයින් ඉලක්ක කරගනිමින් 1965 ඔක්තෝම්බරයේ සිට සය මසකට වැඩි කලක් ක්‍රියාත්මක කෙරුණු මහා ජන සංහාරයට හැට වසරක් පිරී තිබේ. මෙම සංහාරය ‘කොමියුනිස්ට්’ විරෝධී යන නාමයෙන් සිදු කරන ලද නමුත්, සැබැවින්ම එය ස්ටැලින්වාදී PKI නායකත්වය විසින් පාවාදුන් කම්කරු පන්තියට සහ ගොවි ජනතාවට එරෙහි අධිරාජ්‍යවාදී ප්‍රහාරයක් විය. මෙම සංහාරයෙන් අවම වශයෙන් පුද්ගලයින් 500,000 ත් 1,000,000 ත් අතර සංඛ්‍යාවක් ඝාතනය කරන ලද බවට ගණන් බලා ඇත. තවත් වාර්තා මෙම ගණන මිලියන තුන දක්වා ඉහල දමයි. පශ්චාත් දෙවන ලෝක යුද කාල පරිච්ඡේදයේ, අධිරාජ්‍යවාදයට සහ දේශීය කොම්ප්‍රදෝරු ධනපති පන්තියට එරෙහිව ආසියාව, අප්‍රිකාව හා ලතින් ඇමරිකාව පුරා හමා ගිය කම්කරු පීඩිත මහජනතාවගේ දැවැන්ත විප්ලවවාදී අරගලයන් අතරට ඉන්දුනීසියානු කම්කරු පීඩිත මහජනතාවගේ අරගලය ද ඇතුළත්ය. ප්‍රතිගාමී ස්ටැලින්වාදී නිලධාරීවාදය සහ 1950 මුල් භාගයේ ප්‍රතිගාමී ස්ටැලින්වාදය ආරක්ෂා කර ගැනීම සඳහා අධිරාජ්‍යවාදයේ තවත් ඒජන්සියක් ලෙස මතුවූ පැබ්ලෝවාදය විසින් මෙම විප්ලවවාදී ව්‍යාපාරය පාවා දීමෙන්, අධිරාජ්‍යවාදය හා එහි සහයක දේශීය කොම්ප්‍රදෝරු ධනපති පන්තිය විසින් කම්කරු පීඩිත මහජනතාවට අත්කර දුන් අති දැවැන්ත පරාජයක් ලෙස මෙම සමූලඝාතනය හඳුන්වාදිය හැකිය.

**ඓතිහාසික පසුබිම**

බුරුමයට ආසන්නව, අද දින ඉන්දියන් සාගරයේ පිහිටි සුමාත්‍රා දූපතේ සිට, ඕස්ට්‍රේලියාවට ආසන්න පැසිෆික් සාගරයේ පිහිටි බටහිර පැපුවා දක්වා සැතපුම් 3200 ක් පමණ දක්වා වූ දුරක් පුරා මෙම දූපත් සමූහය විහිද යන සේ පිහිටා සිටී. 1880 න් පසු මෙම භූගෝලීය කලාපය සඳහා “ඉන්දුනීසියාව” යන යෙදුම භාවිතා කරන ලදී. ඉන්දුනීසියානු දූපත් ප්‍රමාණය ගණනින් 17,000 ඉක්මවන අතර, ඉන් ජනාවාසව පවතින්නේ දූපත් 6,000 පමණ ප්‍රමාණයකි. ඉස්ලාම් ධර්මය හැරෙන්නට වෙනත් කිසිදු සංස්කෘතික සාම්‍යතාවයක් නොමැති මෙම දූපත් සමූහය එකට බැද තබනු ලැබුවේ වසර 350 පමණ වූ ලන්දේසි යටත් විජිත පාලනය විසිනි.

**ලන්දේසි යටත් විජිතවල අධිරාජ්‍යවාදී කොල්ලකෑම**

ලන්දේසි යටත් විජිත අධිරාජ්‍යවාදීන් විසින් වසර 350 ක් තිස්සේ ඉන්දුනීසියාව අනුකම්පා විරහිතව කොල්ලකෑ අතර, ස්වභාවික සම්පත් කොල්ලකෑම, විශාල කෘෂිකාර්මික වතු ස්ථාපිත කිරීම සහ එහි ජනතාව අනුකම්පා විරහිතව සූරා කෑම සිදු කළහ. ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව්වල යටත් විජිත යුද්ධ ඉන්දුනීසියානු ජනගහනයට දැඩි හානියක් සිදු කළ අතර, ඍජු යුද්ධ හානි, සාගතය සහ රෝග හේතුවෙන් මිලියන 3 සිට 4 දක්වා මරණ සිදු විය.

19 වන සියවස ආරම්භයේදී, නැගී එන බ්‍රිතාන්‍ය ධනේශ්වර අධිරාජ්‍යවාදය මෙම කලාපය කෙරෙහි ආධිපත්‍යය සඳහා ලන්දේසීන්ට වැඩි වැඩියෙන් අභියෝග කළේය. 1800 දී ලන්දේසි නැගෙනහිර ඉන්දීය සමාගම බිඳ වැටුණු අතර 1811 දී බ්‍රිතාන්‍යයන් විසින් මෙම කලාපය අත්පත් කර ගත්හ. නමුත් 1814 ඇංග්ලෝ-ලන්දේසි ගිවිසුමට අනුව 1816 දී නැවත ලන්දේසින්ට මෙම කලාපය බාර දෙන ලද අතර, 1824 ලන්ඩන් ගිවිසුම මගින් මෙම යටත් විජිත බලවතුන් දෙදෙනා විසින් කලාපය කොටස් දෙකකට බෙදා ගත්හ: බ්‍රිතාන්‍යයන් මැලේ අර්ධද්වීපයේ පාලනය අත්පත් කරගත් අතර ලන්දේසීන් ඉන්දුනීසියානු දූපත් සමූහය පාලනය කරන ලදී.

ලන්දේසීන් විසින් 1830 න් පසු ජාවාහි බලහත්කාර වගා කිරීමේ සහ ගිවිසුම්ගත ශ්‍රම ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය මගින් ලන්දේසීන් සහ ඔවුන්ගේ ඉන්දුනීසියානු සහචරයින් අතිවිශාල ධනයක් උපයන ලදී. මෙම වගා ක්‍රමය ගොවීන් ඔවුන්ගේ ඉඩම්වලට බැඳ දමා තිබුණි. 1870 න් පසු එළඹි වඩාත් ලිබරල් කාල පරිච්ඡේදයේ දී මෙම ක්‍රමය අහෝසි කරන ලදී.

1901 දී ලන්දේසීන් “ආචාර ධර්ම ප්‍රතිපත්තිය” ලෙස හැඳින්වූ ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, එයට දේශීය අධ්‍යාපනය සඳහා තරමක් වැඩි මුදලක් වෙන් කළහ. ලන්දේසි අධිරාජ්‍යවාදීන්ට මෙම ලිබරල් ප්‍රතිසංස්කරණ හදුන්වා දීමට සිදු වූයේ ධනපති ක්‍රමයේ සීඝ්‍ර වර්ධනයත් සමඟම, එහි පැවැත්ම සඳහා ධනපති පන්තියට වඩාත් ලිබරල්වාදී ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීමට සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

“ආචාර ධර්ම ප්‍රතිපත්තිය” පුළුල් අධ්‍යාපන අවස්ථා ලබා දුන්නේ නැත. කෙසේ වෙතත්, එය ස්වදේශික ඉන්දුනීසියානු ප්‍රභූ පැලැන්තියේ දරුවන්ට ලන්දේසි අධ්‍යාපනයක් ලබා දුන්නේය. බටහිර අධ්‍යාපනය නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බටහිර දේශපාලන අදහස් ගෙන ආවේය. 1920 සහ 30 ගණන්වලදී, මෙම කුඩා ප්‍රභූ පැලැන්තිය විසින් නැගී එන යටත් විජිත විරෝධී සහ ජාතික චින්තනයක් ප්‍රකාශ කිරීමට පටන් ගත්තේය.

1918 දී, වසර දෙකකට පෙර පිහිටුවන ලද පූර්ව-පාර්ලිමේන්තුවක් වන වොක්ස්රාඩ් (මහජන කවුන්සිලය), පළමු වරට රැස්විය. එය සාමාජිකයින් 39 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඉන් 15 දෙනෙකු ස්වදේශික ඉන්දුනීසියානුවන් විය. මෙම වසරේ දී, අනාගතයේ යම් නිශ්චිත අවස්ථාවක දී ඉන්දුනීසියානුවන්ට ස්වයං පාලනයක් ලබා දෙන බවට ලන්දේසි රජය එකඟ වූ නමුත්, පසු වසරවලදී මෙම පොරොන්දු අත් හැර දැමුණි.

**ජාතිකවාදයේ නැගීම හා ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීම**

පළමු ලෝක යුද්ධය පුපුරා යාමෙන් (1914-1918) සනාථ වූයේ, ලෝක ආර්ථික දේශපාලන ක්‍රමයක් ලෙස ධනපති ක්‍රමය සිය ඓතිහාසික වලංගුතාවය සිඳ ගත් බවයි. එහෙයින්, මෙම ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී ධනපති ක්‍රමයට එරෙහිව, 20 වන සියවසේ මුල් භාගයේ විජිත හා අර්ධ-විජිත රාජ්‍ය තුළ පැන නැගි ජාතිකවාදය මෙම නව ලෝක තත්ත්වයේ නිෂ්පාදනයක් වූ අතර බටහිර යටත් විජිතවාදයේ යටත්වැසියන් ලෙස පැවති අප්‍රිකාවේ සහ ආසියාවේ බොහෝ ප්‍රදේශවලට බලපාන පුළුල් නොසන්සුන්තාවයේ ප්‍රවාහයන්ගේ කොටසක් විය.

මෙම කාල පරිච්ඡේදය තුළ පළමු ඉන්දුනීසියානු දේශපාලන පක්ෂ මතුවීමට පටන් ගත්තේය. 1908 ඔක්තෝබර් මාසයේදී, පළමු ජාතිකවාදී ව්‍යාපාරය වන බුඩි උටෝමෝ පිහිටුවන ලදී. “ඉන්ඩිෂ් පාර්ටිජ්” පක්ෂය 1912 දී පිහිටුවන ලදී. එම වසරේම, සැප්තැම්බර් 10 වන දින, සරේකට් ඉස්ලාම් පළමු ජාතිකවාදී මහජන ව්‍යාපාරය පිහිටුවන ලදී. 1912 දෙසැම්බර් වන විට සරේකට් ඉස්ලාම් හි සාමාජිකයින් 93,000 ක් සිටියහ. එය ලන්දේසි පාලනයට එරෙහිව ඉස්ලාමයේ ධජය භාවිතා කරමින් ඉන්දුනීසියානුවන් එකට ගෙන ආවේය.

**PKI හි පුරෝගාමී ව්‍යාපාරය සහ නිදහස් අරගලය**

1914 දී ඉන්දීය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය (ලන්දේසි: Indische Sociaal-Democratische Vereeniging – ISDV -Indies Social Democratic Association) ලන්දේසි සමාජවාදී හෙන්ක් ස්නීව්ලියට් සහ තවත් ඉන්දීය සමාජවාදියෙකු විසින් ආරම්භ කරන ලදී. ISDV හි යටත් විජිත පාලනයට විරුද්ධ වීමට ක්‍රම සොයන උගත් ඉන්දුනීසියානුවන්ට ලන්දේසි සාමාජිකයින් විසින් කොමියුනිස්ට් අදහස් හඳුන්වා දෙනු ලැබුණි. 1914 දී පටන්, ඉන්දුනීසියානු පීඩිත ජනතාවගේ හොඳම නියෝජිතයෝ මාක්ස්වාදය වෙත හැරුණහ.

ISDV විසින් 1915 ඔක්තෝබර් මාසයේදී Het Vrije Woord (නිදහස් වචනය) නමින් ලන්දේසි භාෂා ප්‍රකාශනයක් ආරම්භ කළේය. ISDV පිහිටුවන විට එය ස්වාධීනත්වයක් ඉල්ලා සිටියේ නැත. නමුත්, එය ඉක්මනින් රැඩිකල් ධනවාදී විරෝධී දිශාවක් ගත්තේය. ISDV විසින් 1917 වසරේ දී එහි පළමු ඉන්දුනීසියානු භාෂා ප්‍රකාශනය වන Soeara Merdeka (නිදහසේ හඬ) ආරම්භ කළේය.

1917 රුසියානු විප්ලවයෙන් පසුව, ISDV හි රැඩිකල්වාදයට ඉන්දුනීසියානු ජනගහනයෙන් මෙන්ම ලන්දේසි සොල්දාදුවන්ගෙන් සහ විශේෂයෙන් නාවිකයින්ගෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලැබුණු අතර ලන්දේසි බලධාරීන් කලබලයට පත් විය. එබැවින් 1918 දී ස්නීව්ලියට් ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව්වෙන් පිටව යාමට සිදු විය. ලන්දේසි යටත් විජිත බලධාරීන් විසින් ISDV මර්දනය කිරීම ආරම්භ කරන ලදී.

ඒ සමඟම, ISDV සහ කොමියුනිස්ට් හිතවතුන් “ඇතුළත අවහිර කිරීම” උපාය මාර්ගයක් ලෙස හැඳින්වෙන උපක්‍රමයකින් නැගෙනහිර ඉන්දීය කොදෙව්හි අනෙකුත් දේශපාලන කණ්ඩායම්වලට රිංගා ගැනීමට පටන් ගත්හ. වඩාත්ම පැහැදිලි බලපෑම වූයේ සරේකට් ඉස්ලාම් වෙත සිදු කරන ලද ඇතුළුවීමයි. සෙමවුන් සහ ඩාර්සෝනෝ ඇතුළු බොහෝ සාමාජිකයින්ගේ රැඩිකල් වාමාංශික අදහස් මගින් මෙම ඉස්ලාමීය ජාතිකවාදී සංවිධානය සාර්ථක බලපෑමට ලක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කොමියුනිස්ට්වාදී සංකල්පයන් ISDV නියෝජිතයන් විසින් ඉන්දුනීසියාවේ විශාලතම ඉස්ලාමීය සංවිධානය තුළ සාර්ථකව රෝපණය කරන ලදී.

1920 මැයි 23 වන දින සෙමරන්ග් හි පැවති සම්මේලනයේදී, ISDV, Perserikatan Komunis di Hindia (PKH; ඉන්දීය කොමියුනිස්ට් සංගමය) යන නම ලබා ගත්තේය. සෙමවුන් පක්ෂ සභාපතිවරයා වූ අතර ඩාර්සෝනෝ උප සභාපති විය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ (කොමින්ටර්න්) කොටසක් වූ පළමු ආසියානු කොමියුනිස්ට් පක්ෂය PKH වූ අතර, 1921 දී කොමින්ටර්න්හි 2 වන ලෝක සම්මේලනයේදී ස්නීව්ලියට් පක්ෂය නියෝජනය කළේය.

1924 වසරේ දී පක්ෂයේ නම පාර්ටයි කොමුනිස් ඉන්දුනීසියාව (PKI, ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය) ලෙස වෙනස් කරන ලදී.

**1926-27 කැරැල්ල සහ එහි මර්දනය**

1925 මැයි මාසයේ පැවති පූර්ණ සැසියකදී, කොමින්ටර්න් විධායක කමිටුව, සිය ප්‍රතිගාමී පන්ති සම්මුතිවාදී ප්‍රතිපත්තිය මත පදනම් වෙමින්, ඉන්දුනීසියානු කොමියුනිස්ට්වාදීන්ට කොමියුනිස්ට් නොවන ජාතිකවාදී සංවිධාන සමඟ අධිරාජ්‍ය විරෝධී සන්ධානයක් පිහිටුවීමට නියෝග කළේය. PKI හි අලිමින් සහ මුසෝගේ නායකත්වයෙන් යුත් අධිරාජ්‍ය විරෝධී කොටස් ලන්දේසි යටත් විජිත රජය පෙරළා දැමීම සඳහා විප්ලවයක් ඉල්ලා සිටියහ.

සැලසුම් කළ විප්ලවය බටහිර සුමාත්‍රාවෙහි පඩාං නගරයෙන් ආරම්භ වීමට නියමිත විය. නමුත් 1926 ආරම්භයේදී ලන්දේසි ආරක්ෂක අංශ විසින් සිදු කරන ලද මර්දනය හේතුවෙන් PKI සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමට හේතු විය. 1926 නොවැම්බර් 12 වන දින බටේවියාවේ (දැන් ජකර්තා) සීමිත කැරැල්ලක් ආරම්භ විය; ඒ හා සමාන

කැරලි පඩෑං, බැන්ටම් සහ සුරබයා හි සිදු විය.

අසාර්ථක වූ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස, පුද්ගලයින් 13,000 ක් අත්අඩංගුවට ගෙන, 4,500 ක් සිරගත කරන ලද අතර, 823 ක් බටහිර නිව්ගිනියාවේ ඩිගුල් කලාපයේ බොවන්-ඩිගොයෙල් කඳවුරට පිටුවහල් කරන ලදී. 1927 දී ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව් රජය විසින් PKI පක්ෂය තහනම් කරන ලදී.



1949 දෙසැම්බර් 28 දින ජනාධිපති සුකර්නෝ, නිදහස් වී ඇති ඉන්දුනීසියාව ලෝකය සමඟ මිත්‍රත්වයෙන් ජීවත් වන බව ප්‍රකාශ කරන්නේ, ජකර්තා හි කොනිංස්ප්ලයින් හි (බටේවියාව සඳහා ඉන්දුනීසියානු නම, දැන් අගනුවරේ නිල නාමය) පිහිටි ඔහුගේ නව මූලස්ථානයේ සිටය. නෙදර්ලන්තයේ සිට ඉන්දුනීසියානු එක්සත් ජනපදයට ස්වෛරීභාවය මාරු කිරීම පෙර දිනයේ දී ජකර්තාහිදී සිදු විය.

**සුකර්නෝ සහ ජාතිකවාදී ව්‍යාපාරය**

කොමියුනිස්ට් කැරැල්ලේ පරාජය සහ සරේකට් ඉස්ලාමයේ පරිහානිය නව ජාතිකවාදී සංවිධානයක් සඳහා මාවත විවර කළ අතර, 1926 දී බන්ඩුං හි "සාමාන්‍ය අධ්‍යයන සමාජයක්" ආරම්භ කරන ලදී. එහි ලේකම් ලෙස පත්වූයේ, වංශාධිපති පවුලක ජාවා පාසල් ගුරුවරයෙකුගේ පුතෙකු වූ සුකර්නෝ ය. ඔහු තරුණ ගෘහ නිර්මාණ උපාධිධාරියෙකු වූ අතර, උගත් සුළු ධනේශ්වර ස්ථරයට අයත් විය. ඔහු ඉන්දුනීසියාවේ නව නාගරික ප්‍රභූ පැලැන්තිය මත පදනම් වෙමින් ජාතිකවාදී දෘෂ්ටියක් සකස් කිරීමට පටන් ගත්තේය.

ඉන්දුනීසියාවේ ජාතිකවාදය සැලකිලිමත් වූයේ ලන්දේසි පාලනයට එරෙහි ප්‍රතිරෝධය ගැන පමණක් නොව, දූපත් සමූහයේ වාර්ගික විවිධත්වය වැළඳ ගනිමින්, සාම්ප්‍රදායික අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීම සහ නවීන රාජ්‍යයක් ලෙස ඉන්දුනීසියාව නිර්මාණය කිරීමට හැකි වන පරිදි ජාතිකත්වය පිළිබඳ නව සංකල්ප ගොඩ නැගීම කෙරෙහිද අවධානය යොමු කළේය.

1920 පමණ වන විට "ඉන්දුනීසියාව" යන වචනය එහි නූතන භාවිතයට පැමිණියේය. ජනවාර්ගික හා භූගෝලීය ප්‍රදේශය වර්ගීකරණය කිරීම සඳහා 1850 දී ඉංග්‍රීසි ස්වභාව විද්‍යාඥයන් වූ ජෝර්ජ් වින්ඩ්සර් අර්ල් සහ ස්කොට්ලන්ත නාවිකයෙකු වූ ජේම්ස් රිචඩ්සන් ලෝගන් විසින් නිර්මාණය කරන ලද "ඉන්දුනීසියාව" යන යෙදුම ජාතිකවාදීන් විසින් ජනතාවගේ එකමුතුවක් පරිකල්පනය කිරීමේ වචනයක් ලෙස යොදා ගන්නා ලදී. මීට පෙර තරුණ සන්ධාන විසින් වෙනම බාලිනීස් ජාතියක්, ජාවා ජාතියක්, සුමාත්‍රා ජාතියක් යනාදිය වශයෙන් කතා කර තිබුණි. දැන් ඔවුහු 'ඉන්දුනීසියාව' ලෙස තනි ජනතාවක් ගැන කතා කළහ.

නෙදර්ලන්තයේ අධ්‍යාපනය ලද ඉන්දුනීසියානු සිසුන් විසින් නැගෙනහිර ඉන්දීය කොදෙව් හි ලන්දේසි පාලනයට එරෙහිව, 1924 දී පර්හිම්පුනාන් ඉන්දුනීසියා (Perhimpunan Indonesia – ඉන්දුනීසියානු සංගමය) නෙදර්ලන්තයේ ලෙයිඩන් නගරයේ දී පිහිටුවන ලදී. එය රැඩිකල් ජාතිකවාදී චින්තනයේ මධ්‍යස්ථානයක් බවට පත් වූ අතර, 1920 ගණන්වල මැද භාගයේදී නෙදර්ලන්තයේ සිට ආපසු මව්බිමට පැමිණි සිසුන් ඊට සමාන අදහස් ඇති කණ්ඩායම් සමඟ එක් විය.

නව ජාතිකවාදයට එහි ප්‍රකාශනය සඳහා නව සංවිධානයක් අවශ්‍ය වූ අතර, 1927 ජූලි 4 වන දින පිහිටුවන ලද ඉන්දුනීසියානු ජාතිකවාදී සංගමය (Perserikatan Nasional Indonesia), පසුව 1928 මැයි මාසයේ දී ඉන්දුනීසියානු ජාතිකවාදී පක්ෂය (Partai Nasional Indonesia – PNI) ලෙස නම් වෙනස් කරන ලද්දේ, සුකර්නෝ ගේ සභාපතිත්වය යටතේය. PNI ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව් රජය සමඟ සහයෝගයෙන් කටයුතු නොකිරීමේ අදහස සහ 'සම්පූර්ණ නිදහස' සඳහා පෙනී සිටීම මත පදනම් විය. කෙසේ වෙතත්, PNI සඳහා මහජන සහයෝගයේ පදනමක් නිර්මාණය කිරීමට උත්සාහ කළ සුකර්නෝ වඩාත් මධ්‍යස්ථ නායකයින් සමඟ එක්ව කටයුතු කිරීමට ද, යම් සාර්ථකත්වයක් ලබා ගැනීමට ද පක්ෂය තුළ පුළුල් ලෙස පදනම් වූ, තරමක් අස්ථිර වුවද, ජාතිකවාදී සංවිධාන සංගමයක් පිහිටුවීමට සමත් විය.

1928 ඔක්තෝබර් 28 වන දින, තරුණ සංවිධානවල නියෝජිතයින් ගණනාවක් ඓතිහාසික තරුණ ප්‍රතිඥාව (Sumpah Pemuda) නිකුත් කළ

අතර, එමගින් ඔවුන් එක් ඉන්දුනීසියානු මාතෘ භූමියක්, එක් ඉන්දුනීසියානු ජනතාවක් සහ එක් ඉන්දුනීසියානු භාෂාවක් පමණක් හඳුනා ගැනීමට දිවුරුම් දුන්හ. එය රටේ නිදහස් ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන අතර විවිධ අනන්‍යතා හරහා පොදු අනන්‍යතාවයක් සංකේතවත් කෙරෙන බවට සැලකුණි.

**සුකර්ණෝ සිරගත කිරීම**

1929 න් පසු ගෝලීය අවපාතය ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව්වන්ට තියුණු ලෙස බලපෑවේය. රබර්, සීනි සහ අනෙකුත් නිවර්තන භාණ්ඩ සඳහා වන අපනයන මිල පහත වැටුණි. එය යටත් විජිත බලධාරීන්ගේ ආදායම් පහත වැටීමට හේතු වූ අතර, වතු ශ්‍රමය සහ ගොවි අපනයන භෝග මත යැපෙන ඉන්දුනීසියානුවන්ගේ ආර්ථික අර්බුදය ඉහළ ගියේය. එමගින් දූපත් සමූහය පුරා සමාජ පීඩාව තීව්‍ර කළ අතර අර්ථවත් ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීමේ ලන්දේසි කැමැත්ත සහ ධාරිතාව සීමා විය. ආර්ථික හැකිලීම සමාජ නොසන්සුන්තාව, වැඩ වර්ජන සහ සහන සඳහා ඉල්ලීම් තීව්‍ර විය. මෙම තත්වය මත ප්‍රමුඛ අධිරාජ්‍ය විරෝධී කථිකයෙකු ලෙස සුකර්ණෝ පෙරට පැමිණියේය. දේශීය වශයෙන් ඇතිවී තිබෙන මෙම නොසන්සුන්තාව මැඩපැවැත්වීම සඳහා දැඩි පියවර (පොලිස් ක්‍රියාමාර්ග, අත්අඩංගුවට ගැනීම්, මාධ්‍ය සහ රැස්වීම් සීමා කිරීම්) ලන්දේසි පාලනය විසින් ගනු ලැබුණි.

ලන්දේසි පාලනය විසින් ජාතිකවාදී ව්‍යාපාරය මර්දනය කිරීම ආරම්භ කරන ලද අතර, එය බොහෝ අත්අඩංගුවට ගැනීම් වලට හේතු විය. 1929 දෙසැම්බර් 29 වන දින, ඉන්දුනීසියාවේ පළමු ජනාධිපති වූ සුකර්ණෝ සහ PNI හි අනෙකුත් ප්‍රමුඛ නායකයින් ජාවාව පුරා සිදු කරන ලද වැටලීම් මාලාවක දී ලන්දේසි යටත් විජිත බලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබුණි. සුකර්ණෝ අත්අඩංගුවට ගනු ලැබුවේ යොග්‍යාකාර්තාවට කරන ලද සංචාරයක දී ය. 1930 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා බන්ඩුං ලෑන්ඩ්‍රාඩ් උසාවියේ පැවති ඔහුගේ නඩු විභාගයේදී, සුකර්ණෝ විසින් යටත් විජිතවාදය හා අධිරාජ්‍යවාදය ප්‍රහාරයට ලක් කරමින් “Indonesia Menggoegat” (ඉන්දුනීසියාව චෝදනා කරයි) නම් දිගු දේශපාලන කථාමාලාවක් පැවැත්වීය. 1930 දෙසැම්බර් මාසයේදී සුකර්ණෝට වසර හතරක සිර දඬුවමක් නියම කරන ලද අතර, ඔහු බංඩුං හි සුකමිස්කින් බන්ධනාගාරයේ සිර ගතව සිටියේය. කෙසේ වෙතත්, ඔහුගේ කථාව මාධ්‍ය විසින් පුළුල් ලෙස ආවරණය කරන ලද අතර, නෙදර්ලන්තයේ සහ ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව් යන දෙකෙහිම ලිබරල් කොටස්වල ප්‍රබල පීඩනය හේතුවෙන්, සුකර්ණෝ 1931 දෙසැම්බර් 31 වන දින කලින් නිදහස් කරන ලදී. මේ වන විට ඔහු ඉන්දුනීසියාව පුරා ප්‍රකටව දන්නා ජනප්‍රිය වීරයෙකු බවට පත්ව තිබුණි. කෙසේ වෙතත්, ඔහුගේ සිරගත කිරීම තුළදී, PNI යටත් විජිත බලධාරීන්ගේ මර්දනය සහ අභ්‍යන්තර මතභේද හේතුවෙන් බෙදී ගොස් තිබුණි.

මුල් PNI විසුරුවා හරින ලද අතර එහි හිටපු සාමාජිකයින් වෙනම පක්ෂ දෙකක් පිහිටුවන ලදී. 1931 අප්‍රේල් මස අවසානයේදී, PNI හි හිටපු ප්‍රමුඛ චරිතයක් වූ සාර්ටෝනෝ, ඉන්දුනීසියානු පක්ෂය (Partindo) පිහිටුවන ලදී. එය PNI සාමාජිකත්වයෙන් බහුතරයක් ආකර්ෂණය කර ගත් අතර ලන්දේසීන්ගෙන් ඉන්දුනීසියානු නිදහස සඳහා උද්ඝෝෂනය කළ නමුත් PNI තරමේ රැඩිකල්භාවයක් පෙන්වූයේ නැත. පරින්ඩෝ, සහයෝගී ජාතිකවාදයේ ප්‍රමුඛ ප්‍රකාශනය ලෙස මතු වූයේ, සිවිල් අධ්‍යාපනය, සමාජ සුභසාධනය, වෙළඳාම සහ ආර්ථික දියුණුව වැනි ප්‍රතිසංස්කරණවාදී වැඩසටහන් වටා ජාතිකවාදී බලවේග එක්සත් කිරීමට උත්සාහ කරමිනි. එය වොක්ස්රාඩ් හි සාමාජිකත්වය පිළිගත්තේය. හදිසි ජන අරගලවල මාවත ඉදිරිපත් කළ සුකර්ණෝ සමග පරින්ඩෝ පක්ෂය සබඳතා පැවැත් වූ අතර 1932 ජූලි මස සුකර්ණෝ එහි නායකත්වයට එළඹියේය. PNI හි තවත් කණ්ඩායම් ගණනාවක් එකතු වී නව සංවිධානයක් පිහිටුවා ගත් අතර එය නව-PNI (PNI Baru) ලෙස හැඳින්වේ. නෙදර්ලන්තයේ අධ්‍යාපනයෙන් මෑතකදී ආපසු පැමිණි ජාතිකවාදීන් වූ මොහොමඩ් හට්ටා සහ සුතාන් ස්ජහ්රීර්ගේ නායකත්වයෙන් යුත් නව PNI පිහිටුවන ලද්දේ මහජන උද්ඝෝෂණ වෙනුවට දිගුකාලීන කේඩර් පදනම් වූ අරගලයක් සහ ඉන්දුනීසියානු ජනගහනයට නවීන අධ්‍යාපනය ලබා දීමේ උපාය මාර්ගය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සහිතවය.

1933 අගෝස්තු මාසයේදී සුකර්ණෝ නැවතත් අත්අඩංගුවට ගෙන මුලින් ෆ්ලෝරස් දූපතේ එන්ඩේ වෙත පිටුවහල් කර, පසුව 1938 දී දකුණු සුමාත්‍රාවේ බෙන්ග්කුලු වෙත මාරු කරන ලදී. හට්ටා සහ ස්ජහ්රීර් ඇතුළු අනෙකුත් පක්ෂ නායකයින්ට එරෙහිව මර්දනකාරී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද අතර ඔවුන් ද පිටුවහල් කරන ලදී. මෙසේ ජාතිකවාදී ව්‍යාපාරයේ රැඩිකල්වාදී ප්‍රවනතාව මර්ධනය කරනු ලැබිණි.

**සහයෝගී ජාතිකවාදය සහ වොක්ස්රාඩ් (මහජන කවුන්සිලය)**

1930 ගණන්වල අග භාගයේදී ජාතිකවාදී නායකයින්ට ලන්දේසීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට බල කෙරුණු අතර, එය හැරෙන්නට මෙම පසුගාමී ධනපති පන්තියට පංති අවශ්‍යතාවය මත තෝරා ගත හැකි වෙනත් විකල්පයක් නොවීය. ජාතිකවාදී තර්ජන ක්ෂණිකව පෙනෙන තැන ලන්දේසීන් පාලනය දැඩි කළ අතර පරිපාලනය ස්ථාවර කිරීමට සේවය කළ ගතානුගතික දේශීය ධනපතීන්ට සහයෝගය ලබා දුන්නේය. මේ සඳහා ලන්දේසින් යොදා ගනු ලැබුවේ වොක්ස්රාඩ් හෙවත් මහජන කවුන්සිලයයි. එය නීතිගත ක්‍රමය හරහා වර්ධක ප්‍රතිසංස්කරණ අපේක්ෂා කළ දේශපාලනික වශයෙන් ප්‍රභූන් (බොහෝ විට බටහිර අධ්‍යාපනය ලැබූ සහ යටත් විජිත පරිපාලන ජාලයන්හි ගිලී සිටි) පිරිසකගෙන් සැදුම් ලද්දකි.

1918 දී උපදේශක ව්‍යවස්ථාදායකයක් ලෙස නිර්මාණය කරන ලද වොක්ස්රාඩ් වැනි උපදේශක ආයතන ද සංරක්ෂණය කර සමහර විට පුළුල් කළේය. 1930 ගණන්වල මුල් භාගය වන විට

වොක්ස්රාඩ් “සහයෝගී ජාතිකවාදීන්ට” වර්ධක ප්‍රතිසංස්කරණ සඳහා හිමිකම් පෑමට සහ පරිපාලන තනතුරු, සිවිල් සේවා ප්‍රතිසංස්කරණ හෝ ජාතිකවාදී පාරිභාෂිතය සහ සංවිධාන සඳහා නීතිමය පිළිගැනීමක් ලබා ගත හැකි ප්‍රධාන නීති සංසදය බවට පත්ව තිබුණි.

1930 ගණන්වල මැද භාගයේදී බුඩි උටෝමෝ සහ අනෙකුත් ජාතිකවාදී කණ්ඩායම්වල සම්මිශ්‍රණයකින් ආරම්භ කරන ලද පරින්ද්‍ර (Parindra) සංවිධානය, සහයෝගීතාවාදී (cooperative) ජාතිකවාදයේ ප්‍රමුඛ ප්‍රකාශනය ලෙස මතු විය. සිවිල් අධ්‍යාපනය, සමාජ සුභසාධනය, වෙළඳ හා ආර්ථික වැඩිදියුණු කිරීම ආදී ප්‍රතිසංස්කරණවාදී වැඩසටහන් වටා ජාතිකවාදී ශක්තීන් එක්සත් කිරීමට එය උත්සාහ කළේය. මෙම පක්ෂය වොක්ස්රාඩ් හි සාමාජිකත්වය පිළිගත්තේය.

වොක්ස්රාඩ් කණ්ඩායමක් තුළ කටීකයෙකු සේ කටයුතු කළ මොහොමඩ් හුස්නි තම්රින්, සහයෝගීතා ජාතිකවාදී නායකයින්ට යටත් විජිත පාලනය තුළ එක්ව වැඩ කළ හැකි ආකාරය පිළිබඳ වඩාත් ප්‍රසිද්ධ ජාතිකවාදී න්‍යාය පත්‍ර ඉදිරිපත් කරන ලදී.

### දෙවන ලෝක යුද්ධය පුපුරා යාම හා ජාතිකවාදී දේශපාලන සංසදය

දෙවන ලෝක යුද සංග්‍රාමය පුපුරා යාමත් සමගම, ජර්මනිය විසින් සිදුකළ ආක්‍රමණයෙන් 1940 දී නෙදර්ලන්තය අත්පත් කර ගැනීමෙන් පසු ලන්දේසි රජයේ ස්ථාවරත්වය වේගයෙන් බිඳ වැටුණි. අගනගර පාලනය දුර්වල විය. යටත් විජිත පරිපාලකයින් හිඟයන්ට, අවිනිශ්චිතතාවයට සහ අධිරාජ්‍ය පිළිවෙල ආරක්ෂා කළ නොහැකි බවට වූ වැඩෙන හැඟීමකට මුහුණ දුන්හ. මෙවැනි තත්ත්වයක් තුළ ඉන්දුනීසියානු “රැඩිකල්වාදී” ජාතිකවාදී නායකත්වයන්ගේ පවා සැබෑ දේශපාලනය හෙළිදරව් වන්නට විය. මන්ද, 1937 දී Gerindo (ගෙරින්ඩෝ) නම් වඩාත් රැඩිකල් පක්ෂයක් පිහිටුවන ලද නමුත්, එය පවා ජාතික සමාජවාදයේ (නාසිවාදයේ) තර්ජනයට එරෙහිව නෙදර්ලන්තයට සහාය වීම ජාතික නිදහස පිළිබඳ ප්‍රශ්නයට වඩා වැදගත් යැයි සැලකීය. මෙසේ බිඳ වැටෙන ලන්දේසි අධිරාජ්‍යය ආරක්ෂා කර ගැනීම මෙම ජාතිකවාදී නායකත්වයන්ගේ දේශපාලන අස්ථානය වී පැවිතිණි.

මහා ඉන්දුනීසියානු පක්ෂය (Parindra – පරින්ද්‍ර), ඉන්දුනීසියානු මහජන ව්‍යාපාරය (Gerindo – ගෙරින්ඩෝ), Paguyuban Pasundan (පගුයුබන් පසුන්දන්), ඉන්දුනීසියානු ඉස්ලාමීය සංගම් පක්ෂය (PSII), ඉන්දුනීසියානු ඉස්ලාමීය පක්ෂය, මිනහාස සංගමය, කතෝලික පක්ෂය, ඉන්දුනීසියාවේ අරාබි සංගමය ආදී පක්ෂ ඒකාබද්ධ වීමෙන් ඉන්දුනීසියානු දේශපාලන සම්මේලනය (GAPI) 1939 දී පිහිටුවන ලද අතර, ඔවුන්ගේ අරමුණ වූයේ වොක්ස්රාඩ් හි සහභාගී වී, බිඳ වැටෙන ලන්දේසි අධිරාජ්‍යයට මුක්කු සපයමින්, ඊට ප්‍රතිඋපකාර ලෙස ලන්දේසි අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබෙන වරප්‍රසාදයන්ගෙන් තම පංති අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමයි.

මෙම සහයෝගීතාවාදී ජාතිකවාදීන්ට ඉල්ලීම් විධිමත්ව ඉදිරිපත් කළ හැකි නමුත්, එය කළ හැකි වූයේ යටත් විජිතවාදී පාලන රාමුව තුළ පමණි. මහා නගර තුළ ලන්දේසි රජය තීරණාත්මක ලෙස බලය රඳවා ගත්තේය. විශේෂයෙන් ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණයන් අධිරාජ්‍යයේ පරමාධිපත්‍යයට තර්ජනයක් ලෙස විනිශ්චය කළ අවස්ථාවන්හිදී, එවැනි පෙත්සම් ප්‍රතික්ෂේප කෙරුණි.

### ජපන් ආක්‍රමණය සහ සුකර්නෝගේ සහයෝගීතාවය

දෙවන ලෝක යුද්ධය තත්වය තවදුරටත් වෙනස් කළේය. 1942 ජනවාරි 10 වන දින ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව්හි ජපන් ආක්‍රමණය ආරම්භ වූ අතර, අධිරාජ්‍ය ජපන් හමුදාව මාස තුනකටත් අඩු කාලයකදී මුළු යටත් විජිතයම අත්පත් කර ගත්හ. මාර්තු 8 වන දින ලන්දේසීන් යටත් විය. මෙම පරාජය ලන්දේසි පරිපාලනය සම්පූර්ණයෙන්ම බිඳ දැමූ අතර, ජාතිකවාදී සිරකරුවන් නිදහස් කිරීම හා ජපන් අධිරාජ්‍යවාදයට සහයෝගී කිරීම සිදු කරමින් ජාතිකවාදී නායකයින්ට තියුණු තේරීමක් ඉදිරිපත් කළේය. එනම් නව අධිරාජ්‍ය බලයකට (ජපන්) විරුද්ධ වීම හෝ ඉන්දුනීසියානු ස්වයං පාලනය සඳහා ලීවරයක් ලෙස ජපන් අධිරාජ්‍යවාදය සමග උපායශීලීව සහයෝගයෙන් කටයුතු කිරීමයි.

සුකර්නෝ විසින් ජපන් අධිරාජ්‍යවාදීන් විමුක්තිදායකයින් වීමේ හැකියාව පිළිගැනීම මත 1942–45 දී ජපන් අතරමැදියෙකු සහ ප්‍රචාරකයෙකු ලෙස ඔහුගේ පසුකාලීන භූමිකාව දිග හැරුණි. ජපන් අධිරාජ්‍යවාදයේ පැමිණීම ලන්දේසි පාලනය දුර්වල කළ හැකි බවත්, සහයෝගීතාවයෙන් අවසානයේ නිදහස ප්‍රකාශ කිරීම සඳහා සූදානම් වීමට ආයතනික හා සංවිධානාත්මක අවකාශය නිර්මාණය කළ හැකි බවත් සුකර්නෝ සහ අනෙකුත් නායකයින් තර්ක කළහ. එහෙත්, සැබවින්ම ඔවුහු සිදු කරන ලද්දේ, ලන්දේසි අධිරාජ්‍යවාදීන් වෙනුවට ජපන් අධිරාජ්‍යවාදීන්ට සහයෝගය දීමෙන්, නැවත වරක් ඉන්දුනීසියානු කම්කරු පීඩිත මහජනතාව වෙනත් අධිරාජ්‍යවාදී වියගසකට බැඳ දැමීමට සැලසුම් සකස් කිරීමයි.

ජපන් අධිරාජ්‍යවාදය සමග සුකර්නෝ විසින් ඇති කර ගනු ලැබූ සම්මුතිය සුකර්නෝ ඇතුළු ඉන්දුනීසියානු ධනපති පංතියේ පංති අවශ්‍යතා සමග ගැලපුනද, සැබැවින්ම ඉන්දුනීසියානු කම්කරු පීඩිත මහජනතාවට එමගින් අත්වූයේ මහා ව්‍යසනයකි.

### ජපන් ආක්‍රමණයේ ලේවැකි ප්‍රතිඵල

ජපන් අධිරාජ්‍යවාදය විසින් ජාවා හි ආර්ථික සංවර්ධන සහ ආරක්ෂක ව්‍යාපෘති සඳහා ඉන්දුනීසියානු ජාතිකයන් මිලියන 4 ත් 10 ත් අතර සංඛ්‍යාවක් බලහත්කාර කම්කරුවන් (rōmusha – රෝමුෂා) ලෙස බඳවා ගත්හ. ඉන් 200,000 ත් 500,000 ත් අතර සංඛ්‍යාවක් ජාවා සිට පිටත දූපත් දක්වා සහ බුරුමය සහ සියම්

(තායිලන්තය) දක්වා යවන ලදී. ජාවාවෙන් ඉවත් කරන ලද අයගෙන් 70,000 කට වඩා යුද්ධයෙන් දිවි ගලවා ගත්තේ නැත. ජපන් ආක්‍රමණය අතරතුර සාගතය සහ බලහත්කාර ශ්‍රමය හේතුවෙන් ලන්දේසි නැගෙනහිර ඉන්දීය කොදෙව්හි මිලියන හතරක පමණ ජනතාවක් මරණයට පත්විය. විශේෂයෙන්ම 1944-45 වසරවල ජාවාවේ සිදු වූ සාගතය මිලියන 2.4ක් පමණ මරණ වලට හේතු විය.

මේ විනාශයන් පෙන්නුම් කරන්නේ, ඒවාට හවුකල්කරු වීමෙන් සුකර්නෝ ඇතුලු දේශීය ධනේශ්වරයේ කන්ඩායම් මෙතෙක් කලක් පුනරුච්චාරනය කරන ලද අධිරාජ්‍ය විරෝධී වාචාල ප්‍රකාශ සේවය කළේ අධිරාජ්‍යවාදයේ ආරක්ෂාවට හා එහිම අවශ්‍යතායන්ම බවය.

**ජාතික ධනේශ්වරයේ බෙලහීනත්වය**

දුර් විපාක ආකාරයෙන්, මෙය සනාථ කළේ පසුගාමී රටවල බෙලහීන ධනපති පන්තියට ඓතිහාසිකව තවදුරටත් ප්‍රගතිශීලී කාර්යභාරයක් නොමැති බවයි. එනම්, ට්‍රොට්ස්කිවාදී නොනවතින විප්ලව න්‍යායෙන් තහවුරු කරන ලද සිද්ධාන්තයයි. යටත් විජිත සහ අර්ධ-යටත් විජිත රටවල දේශීය ධනපති පන්තිය, අධිරාජ්‍යවාදය සමගම බැඳී සිටින දේපල හා වරප්‍රසාද සබඳතා විෂයයෙන්ම ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සම්පූර්ණ කිරීමට සහ ඉඩම් ප්‍රශ්නය විසඳීමට වෛසිකවම අසමත් වේ. මෙම රටවල අධිරාජ්‍යවාදයට එරෙහි සැබෑ නිදහස් අරගලය දිනාගත හැක්කේ කම්කරු පංතියේ නායකත්වය යටතේ කම්කරු හා ගොවි සන්ධානයක් මත පදනම් වූ, සමාජවාදී විප්ලවයේ දෘෂ්ටිය සමගය.

එනම්, අවසානයේ දී මෙම බෙලහීන ධනපති පන්තියට ඒ හෝ මේ අධිරාජ්‍යවාදී බලයක් සමග පෙල ගැසීම හැරෙන්නට වෙනත් කිසිදු විකල්පයක් නොමැති වූ බව මෙම ඉතිහාස වාර්ථාව තහවුරු කරයි. 1942-45 ජපන් ආක්‍රමණය හා ඊට අනතුරුව 1965 ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් සංවිධානය කරන ලද සුහර්තෝගේ හමුදා කුමන්ත්‍රණය තුළින් සිදු කළ සමූලඝාතනය, ජාතික ධනපති පන්තිය අතට ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන් සාක්ෂාත් කිරීමේ කර්තව්‍යය රැගෙන යන මෙම සම්මුතිවාදී මාර්ගයේ අනිවාර්ය ප්‍රතිඵලය විය. ස්ටැලින්වාදී “අවධි දෙකේ න්‍යාය”, කම්කරු පන්තිය ධනපති පන්තියට යටත් කිරීම හරහා, කම්කරු පීඩිත මහජනතාවගේ ස්වාධීන අරගලය මර්දනය කරමින්, අධිරාජ්‍යවාදයට මෙම පරාජයන් සූදානම් කිරීමේ අවකාශ නිර්මාණය කළේය.


මතු සම්බන්ධයි...


ආශ්‍රිත ලිපි:


1. Lessons of the 1965 Indonesian Coup – Chapter One: The historical background, World Socialist Web Site <https://www.wsws.org/en/articles/2009/05/ind1-m16.html>
2. Lessons of the 1965 Indonesian Coup – Chapter Two: Stalinists betray the mass movement, World Socialist Web Site <https://www.wsws.org/en/articles/2009/05/ind2-m16.html>
3. Lessons of the 1965 Indonesian Coup – Chapter Three: 1965—Stalinism’s bloody legacy, World Socialist Web Site <https://www.wsws.org/en/articles/2009/05/ind3-m16.html>
4. Indonesia – Colonialism, Revolution, Independence | Britannica <https://www.britannica.com/place/Indonesia/Toward-independence>
5. Fifty years since the Indonesian coup, World Socialist Web Site <https://www.wsws.org/en/articles/2015/10/01/indo-o01.html>
6. US orchestrated Suharto’s 1965-66 slaughter in Indonesia, World Socialist Web Site <https://www.wsws.org/en/articles/1999/07/indo1-j19.html>








මෙම පොත්
Mehring Books
වෙතින් ඇනවුම් කරන්න.

# ඕස්ට්‍රේලියාවේ සමාජ මාධ්‍ය තහනම අන්තර්ජාල වාරණය සඳහා ගෝලීය පූර්වාදර්ශයක් සකසයි

**ඔස්කාර් ග්‍රෙන්ෆෙල්** විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) 2025 දෙසැම්බර් 11 දින ‘Australia’s social media ban sets global precedent for online censorship’ යන හිසින් පලවූ **ඔස්කා ග්‍රෙන්ෆෙල්** විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

අසමානතාවය, ආඥාදායකත්වය, සහ යුද්ධය කෙරෙහි වැඩිවන සතුරුකම මධ්‍යයේ අන්තර්ජාලයේ රාජ්‍ය පාලනය සඳහා ගෝලීය පූර්වාදර්ශයක් තබමින්, ඕස්ට්‍රේලියානු වයස අවුරුදු 16 ට අඩු දරුවන්ට සමාජ මාධ්‍ය වෙත පිවිසීම තහනම් කිරීම බදාදා සිට බලාත්මක විය.

දැවැන්ත දඩ මුදල් ගෙවීමේ තර්ජනයක් යටතේ සමාජ මාධ්‍ය වේදිකාවලට වයස් සත්‍යාපන පියවරයන් ස්ථාපිත කිරීමට සහ ළමයින් ඉවත් කිරීමට බල කෙරී ඇත. දැන්, වැඩිහිටියන් ඇතුළු සියලුම පරිශීලකයින්ට වේදිකාවල රැඳී සිටීම සඳහා මහා සමූහ සමාගම්වලට රජයේ හැඳුනුම්පත් හෝ ඡායාරූප සැපයීම වැනි නව බැඳීම්වලට මුහුණ දීමට සිදුවිය හැකිය.

මෙම පියවර මහජන විරෝධයට හේතු වී ඇති අතර, එය මඟ හැරීම සඳහා දැනටමත් ක්‍රම සොයමින් සිටින තරුණයින් ද ඒ අතර වේ.

මෙය හුදෙක් ඕස්ට්‍රේලියානු ප්‍රශ්නයක් නොවේ. ට්‍රම්ප් පරිපාලනය බොහෝ දුරට සමාන ප්‍රතිපත්තියක් එක්සත් ජනපද කොංග්‍රසයට හඳුන්වා දී ඇති අතර, යුරෝපීය බලවතුන් රැසක් ද ඒ හා සමාන තහනමක් කරා ගමන් කරමින් සිටී.

පසුගිය වසරේ කම්කරු (පක්ෂ) රජය විසින් පාර්ලිමේන්තුව හරහා නීති සම්පාදනය කරන ලද්දේ, තරුණයින් අන්තර්ජාල හානිවලින්, විශේෂයෙන් මානසික සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා යැයි පවසමිනි. එම ප්‍රකාශ අසත්‍ය වේ. මානසික සෞඛ්‍ය උපදේශක කණ්ඩායම් මෙම තහනමට දැඩි ලෙස විරුද්ධ වූ අතර, එය දරුවන්ගේ මානසික ගැටලු තීව්‍ර කරනු ඇතැයි අනතුරු ඇඟවීය.

කම්කරු රජය ක්‍රියාත්මක කරමින් සිටින වැඩසටහනට කළ හැක්කේ මානසික සෞඛ්‍ය අර්බුදය තවත් උග්‍ර කිරීම පමණකි. දරුවන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බවට වන කාරණය විසඳීමට එය කිසිවක් කර නැත; ඒ වෙනුවට ආණ්ඩුව ජීවන වියදම් අර්බුදයේ බර කම්කරු පන්තියේ කුටුම්භ මත පටවමින්, අත්‍යවශ්‍ය සමාජ සේවාවන් මත කප්පාදු පණවමින් සිටියි.

මෙම සමාජ තත්වයන් සහ ධනවාදය ඔවුන්ට අනාගතයක් ලබා නොදෙන බවට වන යථාර්ථය, තරුණයින්ගේ රැඩිකලීකරනයකට ඉන්ධන සපයයි. තහනමේ සැබෑ අරමුණ වන්නේ එම හැඟීම මර්දනය කර එය සංවිධානාත්මක දේශපාලන ප්‍රකාශනයක් සොයා ගැනීම වැළැක්වීමයි.

මුළු පරම්පරාවක්ම දේශපාලනීකරණය කර ඇති ගාසා තීරයේ ජන සංහාරය මධ්‍යයේ දිගු කලක් තිස්සේ වර්ධනය වෙමින් පැවති සමාජ කෝපය මතුපිටට පුපුරා යාමෙන් පසු මෙම තහනම පනවනු ලබයි. ඕස්ට්‍රේලියාවේ තරුණ ජනයා සමාජ මාධ්‍ය හරහා ඔවුන් දුටු යුද අපරාධවලට එරෙහිව බොහෝ විට සතිපතා පෙළපාලිවල සහභාගී වූහ, පාසල් වැඩවර්ජන පැවැත්වූහ, එමෙන්ම වෙනත් ක්‍රියාමාර්ගවල නිරත වූහ.



2025 මැයි 3 වන දින නැවත තේරී පත්වීමෙන් පසු ඕස්ට්‍රේලියානු අගමැති ඇන්තනි ඇල්බනීස්. [AP ඡායාරූපය/රික් රයික්‍රොෆ්ට්]

ආබාධිත පලස්තීනුවන්, බෝම්බ හෙලන ලද රෝහල් සහ විනාශ වූ පාසල් පිළිබඳ දර්ශන, සංහාරයට සහාය දුන් ඕස්ට්‍රේලියාව ඇතුළු ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන්ගේ බොරුවලට සම්පූර්ණයෙන්ම පටහැනි යථාර්ථයක් පෙන්නුම් කළේය. තහනම වැළැක්වීමට උත්සාහ කරන්නේ මෙසේ රජයේ බොරු සහ අපරාධකාරීත්වය හෙළිදරව් වීමය.

ජන සංහාරයට එරෙහි මහජන විරෝධයට පෙරාතුව, දේශගුණික අර්බුදය සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ පාසල් වැඩවර්ජන සහ ගෝලීය වශයෙන් ලක්ෂ සංඛ්‍යාත ජනයා සහභාගී වූ ක්‍රියාකාරීත්වයන් මතු විය.

ධනවාදී අර්බුදයේ මෙම ප්‍රකාශනයන් කෙරෙහි ඇති කෝපය සමාජවාදය කෙරෙහි ආකර්ෂණයක් බවට වඩ වඩාත් ඒකාබද්ධ වෙමින් පවතී. ඕස්ට්‍රේලියාවේ මෙම ගැටලුව සම්බන්ධයෙන් පසුගිය වසරේ පැවති මත විමසුමකදී, තරුණ ඕස්ට්‍රේලියානුවන්ගෙන් සියයට 53 කට "වැඩිපුර සමාජවාදයක්" අවශ්‍ය බව සොයා ගත් අතර, එය එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ඊට සමාන ප්‍රතිඵල පිළිබිඹු කරයි.

ආණ්ඩුවේ නායකයින් ප්‍රසිද්ධියේ තහනම සාධාරණීකරණය කිරීමේදී ඔවුන්ගේ දේශපාලන අභිප්‍රේරණ සඟවා ගනිති. ඒ වෙනුවට, අගමැති ඇන්තනි ඇල්බනීස් ළමයින් එළිමහනේ සෙල්ලම් කළ සුන්දර අතීතයකට නැවත යෑමේ අවශ්‍යතාවය පිළිබඳ ගතානුගතික කතා ඇද බෑවේය.

නමුත් යටින් පවතින න්‍යාය පත්‍රය වෙනත් සන්දර්භයන් තුළ ප්‍රකාශ වී ඇත. නොවැම්බර් මාසයේ පැවති දේශනයකදී, දේශීය ඔත්තු ඒජන්සියක් වන ASIO හි ප්‍රධානී මයික් බර්ගස්, ගාසා සමූල ඝාතනය කෙරෙහි සතුරුකම සහ වාමාංශික විරෝධය සමඟ සම්බන්ධ වී වර්ධනය වන "විප්ලවවාදී අන්තවාදය" ගැන අනතුරු ඇඟවීය.

තරුණයින් අතර විරුද්ධවාදී හැඟීම් මර්දනය කිරීමේ ක්ෂණික ගැටලුවට අමතරව, රජයේ නායකයින් දිගු කලක් තිස්සේ සාමාන්‍ය ජනතාවට සාපේක්ෂ නිර්නාමික භාවයකින් අන්තර්ජාලය හරහා දේශපාලන ප්‍රකාශ නිකුත් කිරීමේ හැකියාවට එරෙහිව කෑ මොර දී ඇත.

ඇල්බනීස්, "කිසිදු බියකින් තොරව නිර්නාමිකව ඕනෑම දෙයක් පැවසිය හැකි යතුරුපුවරු රණශූරයන්" හෙළා දැක තිබේ. එම සන්දර්භය තුළ, සමාජ මාධ්‍ය සමාගම් විසින් රැස් කරන ලද හඳුනාගැනීමේ තොරතුරු වෙත ප්‍රවේශ නොවන බවට රජය කරන ප්‍රකාශයන්හි කිසිදු පදනමක් නොමැත.

වර්ධනය වන සමාජ කෝපය ජාත්‍යන්තර ස්වභාවයක් ගන්නවා සේම, අධිරාජ්‍යවාදී බලවතුන් ද එය මර්දනය කිරීමේ උත්සාහයේදී සම්බන්ධීකරණය වෙමින් සිටිති.

2024 දෙසැම්බර් මාසයේදී, සමාජ මාධ්‍ය තහනම සඳහා වූ නීති සම්පාදනය සම්මත වී දින කිහිපයක් ගතවෙද්දීම, ෆයිව් අයිස් (Five Eyes) ඔත්තු බැලීමේ ජාලය "තරුණ රැඩිකලීකරනයට" එරෙහිව අනතුරු ඇඟවීමේ වාර්තාවක් නිකුත් කළේය. ෆයිව් අයිස් එක්සත් ජනපදය විසින් මෙහෙයවනු ලබන අතර එක්සත් රාජධානිය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයෙන් සමන්විත වේ.

තරුණයින් "අන්තර්ජාලය හරහා හැදී වැඩී ඇති අතර තාක්‍ෂණික සූර වේ" යනුවෙන් වාර්තාව අනතුරු ඇඟවීය. ඔවුහු එවැනි වේදිකා "තමන් සහ අන් අය තවදුරටත් රැඩිකල් කරන ප්‍රචණ්ඩකාරී අන්තවාදී අන්තර්ගතයන් නැරඹීමට සහ බෙදා හැරීමට" භාවිතා කරති. මෙම තර්ජනයට එරෙහිව "මුළු සමාජයේම" උත්සාහයකින් සටන් කළ යුතුව තිබුණි.

ට්‍රම්ප් පරිපාලනය සහ යුරෝපීය රටවල් ද ඒ හා සමාන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් සිටීම අවධාරණය කරන පරිදි වයස අවුරුදු 16 න් පහළ සමාජ මාධ්‍ය තහනම එම උත්සාහයේ කොටසක් බව පැහැදිලිය.

එම සන්දර්භය තුළ, "ප්‍රචණ්ඩ අන්තවාදය" පිළිබඳ අනතුරු ඇඟවීම් පැහැදිලි වංචාවකි. ට්‍රම්ප් අන්ත දක්ෂිණාංශික සහ නාසි බලවේග පවා බලමුලු ගැන්වීම හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෙරලා දමමින් ෆැසිස්ට්වාදී ආඥාදායකත්වයක් ගොඩනැගීමට උත්සාහ කරමින් සිටී.

සමාජ මාධ්‍ය සමාගම් සංක්‍රමණික විරෝධී සහ වර්ගවාදී අන්තර්ගතයන් විස්තාරණය කරන තරමට, එය දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය විසින් ෆැසිස්ට්වාදයේ පුළුල් ප්‍රවර්ධනය සඳහා දරන ව්‍යායාමයේ එක් සංරචකයක් වේ. ට්‍රම්ප් පරිපාලනයේ හිටපු සාමාජිකයෙකු වන ලොව ධනවත්ම මිනිසා වන එලොන් මස්ක් විසින් අන්ත-දක්ෂිණාංශික ප්‍රචාරණය සඳහා හොරණෑවක් බවට වැඩි වැඩියෙන් පරිවර්තනය කරන ලද X/ Twitter මගින් මෙම සම්බන්ධතාවය නිරූපණය කෙරේ.

අන්තර්ජාල නිදහසට එල්ල කරන ප්‍රහාරය වාමාංශික විපක්ෂයට එරෙහි පුළුල් ප්‍රහාරයක කොටසකි. "නීතියට සහ ආගමනය (පිළිබඳ නීති) බලාත්මක කිරීමට විරුද්ධවන්නන්; සමූහ සංක්‍රමණය සහ විවෘත දේශසීමා සඳහා පක්ෂ අන්තවාදී අදහස්" හෝ "ධනවාදයට එරෙහි" අදහස් දරන්නන්, "දේශීය ත්‍රස්තවාදීන්" ලෙස වර්ගීකරණය කරමින්, එක්සත් ජනපද නීතිපති පෑම් බොන්ඩි විසින් මෙම සතියේ නිකුත් කරන ලද සංදේශය ද ඊට ඇතුළත් ය.

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා ට්‍රම්ප් වැනි විවෘතව ෆැසිස්ට් බලවේග පමණක් නොව සමස්ත දේශපාලන සංස්ථාපිතයම සම්බන්ධ වන බව, වාරණය සඳහා ගෝලීය පූර්වාදර්ශයක් සකසමින් සිටින්නේ කම්කරු පක්ෂ ආණ්ඩුවක් විසින් බව යන කාරණයෙන් ප්‍රකාශ වේ.

රජයන් විසින් අන්තර්ජාලය පාලනය කිරීමට දිගු කලක් තිස්සේ දරන උත්සාහයන් මත එම පූර්වාදර්ශය ගොඩ නැගෙන අතර, අන්තර්ජාලය විප්ලවීය තර්ජනයක් ලෙස සලකනු ලබන්නේ, බලයේ කොරිඩෝර (කේන්ද්‍රස්ථාන) වලින් බැහැර සිටින්නන්ට තම අදහස් ප්‍රචාරය කිරීමට, සන්නිවේදනය කිරීමට සහ විරුද්ධත්වය සංවිධානය කිරීමට හැකියාව ලබා දෙන බැවිනි.

2017 දී Google, රජයේ ආයතනවල නියෝගය පරිදි ක්‍රියා කරමින්, සෙවුම් ප්‍රතිඵලවල ලෝක සමාජවාදී වෙබ් අඩවිය සහ අනෙකුත් විකල්ප මාධ්‍ය මර්දනය කරමින්, ඒ වෙනුවට

සංගතවල ප්‍රකාශනවලට ප්‍රමුඛත්වය දෙන නව ඇල්ගොරිතමයක් හඳුන්වාදීම මගින් ප්‍රධාන හැරවුම් ලක්ෂයයක් සනිටුහන් කෙරිණි.

ධනවාදයේ අර්බුදය එකී පියවරයන් ආරම්භ කළ කාලයට වඩා බෙහෙවින් ගැඹුරු ය. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ප්‍රධාන බලවතුන්, ගාසා තීරයේ ජන සංහාරය වැනි අපරාධ පමණක් නොව, න්‍යෂ්ටික ලෝක යුද්ධ තර්ජනයක් ගෙනෙන රුසියාව සහ චීනය සමඟ ගැටුම් ද ඇතුළුව අධිරාජ්‍යවාදී යුද්ධයෙන් ප්‍රතිචාර දක්වමින් සිටිති. දේශීය වශයෙන්, ඔවුන් ප්‍රංශ විප්ලවයේ දින වල සිට නොදුටු සමාජ අසමානතාවය ඒකාධිපති පියවරයන් හරහා ක්‍රියාත්මක කරමින් සිටිති.

පුළුල් ලෙස පැතිරුණු (සමාජ) සතුරුකමක් සහ වැඩෙන ප්‍රතිරෝධයක් පවතී. ඕස්ට්‍රේලියාවේ සමාජ මාධ්‍ය තහනම හෙළා දකිමින් සහ එය නොබියව මග හරිමින් සිටින තරුණ ජනයාගේ විශාල සංඛ්‍යාවක් තුළ එය ප්‍රකාශ වී තිබේ. විරෝධතා, පාසල් වැඩවර්ජන සහ අනෙකුත් ක්‍රියාමාර්ග සංවිධානය කළ යුතුය.


විකල්ප දේශපාලන ඉදිරිදර්ශනයක් අවශ්‍ය වේ. වාරණය සහ අවසානයේ ඒකාධිපතිත්වයේ ධනවාදී වැඩසටහනට එරෙහිව සටන් කළ හැක්කේ සමස්ත දේශපාලන සංස්ථාපිතයෙන් ස්වාධීන වූ කම්කරු පන්තියේ මහජන ව්‍යාපාරයක් හරහා පමණි.

අන්තර්ජාල නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාව සඳහා වන සටන, මර්දනකාරී ධනේශ්වර රාජ්‍ය උපකරණ විසුරුවා හැරීම සහ තාක්ෂණික සංස්ථා ඇතුළු සමාජයේ සියලුම ප්‍රධාන නිෂ්පාදන බලවේග කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ හිමිකාරිත්වය යටතේ ස්ථානගත කිරීමට වඩා අඩු දෙයක් නොවේ.

# කම්කරු විප්ලවවාදී පක්ෂය ජාත්‍යන්තර කමිටුවෙන් අත්හිටුවා වසර 40 ක්

**පීටර් ෂ්වාස්** විසිනි.

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) *2025* දෙසැම්බර් *16* දින '<u>40 years since the suspension of the Workers Revolutionary Party from the ICFI</u>' යන හිසින් පලවූ පීටර් ෂ්වාස් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.



ක්ලිෆ් ස්ලෝටර්, ජෙරී හීලි සහ මයික් බන්ඩා

වසර හතළිහකට පෙර, 1985 දෙසැම්බර් 16 වන දින, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) එහි බ්‍රිතාන්‍ය ශාඛාව වන කම්කරු විප්ලවවාදී පක්ෂය (WRP) අත්හිටුවන ලදී. එය එසේ කළේ, කවිප අත්හිටුවීමේ යෝජනාවෙන් පැහැදිලි කළ පරිදි, "කවිපය, හජජාක සහ ජාත්‍යන්තර කම්කරු පන්තියට එරෙහිව ඓතිහාසික පාවාදීමක් සිදු කර ඇති බව" හෙළි කළ එහි ජාත්‍යන්තර පාලන කොමිසමේ වාර්තාවට ප්‍රතිචාර වශයෙනි.

කලින් නොදන්නා බොහෝ ලේඛනවල පදනම මත පාලක කොමිසම ඔප්පු කළ පරිදි, කව්ප නොනවතින විප්ලව න්‍යාය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබූ අතර, "එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් සඳහා යටත් විජිත ධනේශ්වරයේ කොටස් සමඟ ප්‍රතිපත්ති විරහිත සබඳතා ලුහුබැඳීම සිදුවිය."

කව්ප අත්හිටුවීමට පෙර බ්‍රිතාන්‍ය ශාඛාව තුළ ගැඹුරු අර්බුදයක් වර්ධනය වී පැවතියේය. 1985 ජුනි 30 වන දින, ජෙරී හීලිගේ පෞද්ගලික ලේකම් අයිලීන් ජෙනිංස්, දේශපාලන කමිටුවට ලිපියක් යවමින්, දිගු කලක් තිස්සේ කව්ප නායකයා කාන්තා කේඩර්වරුන් අපයෝජනය කිරීම හෙළා දුටුවේය. හීලි, ක්ලිෆ් ස්ලෝටර් සහ මයික් බන්ඩා මෙම අපචාරය වසන් කිරීමට සහ එය ජාත්‍යන්තර කමිටුවෙන් සහ සාමාජිකත්වයෙන් සැඟවීමට උත්සාහ කළහ. කව්ප පාලන කොමිසම මඟින් සිදුකරන පරීක්ෂණයක් ඉල්ලා සිටි මධ්‍යම කාරක සභික ඩේව් හයිලන්ඩ්ට දැවැන්ත පීඩනයක් එල්ල විය.

නමුත් අර්බුදය තවදුරටත් පාලනය කළ නොහැකි විය. පක්ෂය කටුක අරගලයකින් බෙදී ගිය අතර, එහිදී හීලිගේ ආධාරකරුවන් සහ බන්ඩා සහ ස්ලෝටර්ගේ ආධාරකරුවන් යන දෙපාර්ශ්වයම අර්බුදයේ දේශපාලන

හේතු පිළිබඳ සාකච්ඡාවක් වැළැක්වීමට උත්සාහ කළහ.

අර්බුදය පිළිබඳව දැනුම් දෙනු ලැබීම ඔක්තෝබර් මස තෙක් නො ලද ජාත්‍යන්තර කමිටුව, සටන් වදින කිසිදු පාර්ශවයකට සහාය දීම ප්‍රතික්ෂේප කළේය. එය හීලිගේ බලය අයුතු ලෙස භාවිතා කිරීම හෙළා දුටු අතර එම නිසා ඔක්තෝබර් 25 වන දින ඔහුව එහි සාමාජිකත්වයෙන් නෙරපා හැරියේය. නමුත් එය අවධාරනය කළේ, ස්ලෝටර් සහ බන්ඩා ප්‍රකාශ කළ පරිදි කවිප අර්බුදයට හේතුව හීලිගේ පෞද්ගලික විෂමාචාරය නොව, සමස්ත නායකත්වයේ දිගුකාලීන අවස්ථාවාදී සහ ජාතිකවාදී පරිහානිය බවයි.

එක්සත් ජනපද වර්කර්ස් ලීගය ඊට වසර තුනකට පෙර මතු කළ පැහැදිලිව නිර්වචනය කරන ලද වැඩපිළිවෙළ සහ ප්‍රතිපත්තිමය කරුණු මත ජාත්‍යන්තර කමිටුව කවිප විවේචනය පදනම් කර ගත්තේය. වර්කර්ස් ලීගයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් 1982 සහ 1984 දී කවිපයේ න්‍යායික සංකල්ප සහ දේශපාලන වැඩ පිළිවෙළ පිළිබඳ විස්තීර්ණ විවේචනයක් ඉදිරිපත් කර තිබුණි. 1950 සහ 1960 ගනන්වල පැබ්ලෝවාදයට දැඩි ලෙස විරුද්ධ වූ බ්‍රිතාන්‍ය ශාඛාව, 1970 ගනන්වල දී පැබ්ලෝවාදයේ ජාතිකවාදී සහ අවස්ථාවාදී ආස්ථානයන්ට වඩ වඩාත් සමීප වීම සම්බන්ධයෙන් ඔහු විවේචනය කළේය.

හීලි, ස්ලෝටර් සහ—යම් ආරම්භක පැකිලීමකින් පසුව—බන්ඩා නෝර්ත්ගේ විවේචන යටගැසූ අතර, සමස්ත ජාත්‍යන්තර කමිටුව තුළම ඒ පිළිබඳ සාකච්ඡාව වැළැක්වා, වර්කර්ස් ලීගය එය දිගටම කරගෙන ගියහොත් එය නෙරපා හරින බවට තර්ජනය කළහ.

1985 ඔක්තෝබර් 25 වන දින නිකුත් කරන ලද බ්‍රිතාන්‍ය ශාඛාවේ අර්බුදය පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ පළමු ප්‍රකාශයේ පැහැදිලිවම සඳහන් වන්නේ, හීලිගේ දූෂිත භාවිතයන් හෙළිදරව් වීමත් සමඟ අර්බුදය පුපුරා ගිය නමුත්, එහි මූලය වූයේ “සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ගොඩනැගීමේ මූලෝපායික කර්තව්‍යයෙන් වඩ වඩාත් ජාතිකවාදී ඉදිරිදර්ශනයක් සහ භාවිතයක් දෙසට කවිප නායකත්වයේ දිගුකාලීන චලනය” බවයි.

“හජාජාක දේශපාලන අධිකාරිය පැහැදිලිව පිළිගැනීම සහ එහි තීරණවලට බ්‍රිතාන්‍ය ශාඛාව යටත් වීමේ පදනම මත” කවිප සාමාජිකත්වය නැවත ලියාපදිංචි කිරීමට ජාත්‍යන්තර කමිටුව යෝජනා කළේය. කවිපයේ සිදුවීම් විමර්ශනය කිරීම සඳහා ජාත්‍යන්තර පාලන කොමිසමක් ද එය ස්ථාපිත කළේය.

හීලි සහ කවිපයේ ඔහුගේ ආධාරකරුවන් වූ සවාස් මිෂෙල් නායකත්වය දුන් ග්‍රීක ශාඛාව සහ ස්පාඤ්ඤයේ කුඩා හා අද්දැකීම් අඩු කණ්ඩායමක් මේ වන විට හජාජාක සමඟ සියලු සම්බන්ධතා බිඳ දමා තිබූ අතර හීලි විසින්ම කැඳවනු නොලැබූ කිසිදු රැස්වීමක අධිකාරිය පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. හීලි “ඓතිහාසික නායකයෙකු” බවත් ඔහුගේ අධිකාරියට අභියෝග කළ නොහැකි බවත් සවාස් මිෂෙල් ප්‍රකාශ කළේය.

කවිප සාමාජිකත්වය ඉදිරියේ ජාත්‍යන්තර කමිටුවට විවෘතව විරුද්ධ වීමට තරම් ඔවුන් දුර්වල වූ බැවින් ස්ලෝටර් සහ බන්ඩා ජාත්‍යන්තර කමිටුවේ යෝජනාවට එකඟ වූහ. ඔක්තෝබර් 27 වන දින කවිපයේ අතිවිශේෂ සමුළුවක් ජාත්‍යන්තර කමිටුවේ යෝජනාව ඒකමතිකව පිළිගත්තේය.

නමුත් ස්ලෝටර් හෝ බන්ඩා දෙදෙනාම ජාත්‍යන්තරයේ අධිකාරියට යටත් වීම පිළිගැනීමට සූදානම් නොවීය. වර්කර්ස් ලීගයේ විවේචන මැඩපැවැත්වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ සහ 1985 ගිම්හානයේදී හීලිගේ අපයෝජනයන් පිළිබඳ පාලන කොමිසමක් අවහිර කිරීමට උත්සාහ කළ ස්ලෝටර්, දැන් මතු කරන ලද දේශපාලන කරුණු සාකච්ඡා කිරීම වැළැක්වීම සඳහා ලිංගික අපචාරය භාවිතා කළේය.

ප්‍රමුඛ ස්ටැලින්වාදීන් සහ සංශෝධනවාදීන් සහභාගී වූ නොවැම්බර් 26 වන දින ලන්ඩනයේ පැවති ප්‍රසිද්ධ රැස්වීමකදී, ස්ලෝටර්, ට්‍රොට්ස්කි ඝාතනයේ පසුබිම අනාවරණය කර ගැනීම සඳහා හජාජාක විසින් ආරම්භ කරන ලද “ආරක්ෂාව සහ හතරවන ජාත්‍යන්තරය” විමර්ශනය හෙළා දුටුවේය. ඔහු, කවිපය, ස්ටැලින්වාදීන්, පැබ්ලෝවාදීන් සහ ට්‍රොට්ස්කිවාදයේ අනෙකුත් කටුක සතුරන් සමඟ සහයෝගීතාවයේ පථයකට යොමු කළේය.

දෙසැම්බර් 16 වන දින, ජාත්‍යන්තර කමිටුව, ස්ලෝටර් සහ බන්ඩාගේ ආරම්භක විරෝධයට එරෙහිව පිහිටුවන ලද ජාත්‍යන්තර පාලන කොමිසමේ වාර්තාව සාකච්ඡා කිරීම සඳහා රැස්විය. මෙම රැස්වීමේදී ස්ලෝටර්, සයිමන් පිරනි, ටොම් කෙම්ප් සහ ජාත්‍යන්තර කමිටුවට සහාය දුන් සුළුතරයේ නියෝජිතයා ලෙස ඩේව් හයිලන්ඩ් විසින් කවිප ය නියෝජනය කරන ලදී. ඩේවිඩ් නෝර්ත්, පීටර් ෂ්වාස් (බටහිර ජර්මනියේ Bund Sozialistischer Arbeiter), කීර්ති බාලසූරිය (ශ්‍රී ලංකාවේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය), නික් බීම්ස් (ඕස්ට්‍රේලියාවේ සමාජවාදී කම්කරු සංගමය) සහ අනෙකුත් නියෝජිතයින් ICFI වෙනුවෙන් සහභාගී වූහ.

රහස් අභ්‍යන්තර ලේඛන පරීක්ෂා කිරීම මත පදනම්ව, පාලක කොමිසම සිය අතුරු වාර්තාව ඉදිරිපත් කළේය—එය ජාත්‍යන්තර කමිටුව පිටුපසින්, කවිප නායකත්වය විසින් මැද පෙරදිග ධනේශ්වර පාලන තන්ත්‍ර කිහිපයක් සමඟ ස්ථාපිත කරගෙන තිබූ ප්‍රතිපත්ති විරහිත සබඳතා ඉතා පරීක්ෂාකාරී ලෙස හෙළිදරව් කළේය. ජාත්‍යන්තර කමිටුව විමර්ශනය සඳහා අවධාරනය නොකළේ නම්, ලේඛන සහ ඔවුන් හෙළිදරව් කළ සබඳතා සැඟවුණු සහ අඥාතව පවතිනු ඇත.

මෙම වාර්තාවට ප්‍රතිචාර වශයෙන් ICFI බහුතරය කවිප ය අත්හිටුවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළහ. බ්‍රිතාන්‍ය ශාකාවේ පාවාදීම සඳහා හීලි තනිකරම වගකිව යුතු බවට ස්ලෝටර් කළ ප්‍රකාශය බහුතරය ප්‍රතික්ෂේප

කළහ. යෝජනාවේ සඳහන් වූයේ “මෙම භාවිතයන් ක්‍රියාත්මක කිරීමට ඉඩ දුන් ජාතිකවාදී පරිහානිය සඳහා දේශපාලන වගකීම කව්ප හි සමස්ත නායකත්වය මත පැටවෙන” බවයි.

යෝජනාව තවදුරටත් මෙසේ පැවසීය:

‘බ්‍රිතාන්‍ය ශාඛාව තුළ සහ ජාත්‍යන්තර කමිටුව තුළ පක්ෂයේ දේශපාලන වැඩ පිළිවෙළ පිළිබඳ වෙනස්කම් සාකච්ඡා කිරීම කව්ප නායකයෝ අවහිර කළහ.

ජාත්‍යන්තර කමිටුව කිසිදු තනි නායකයෙකුට දොස් පැවරීමට උත්සාහ නොකරන නමුත් සමස්ත නායකත්වයම වගකිව යුතු බව කියා සිටියි.

එබැවින්, එහි මූලධර්ම හා සුපිළිපන්බව ආරක්ෂා කර ගැනීම සඳහා, කව්ප 8 වන සම්මේලනයෙන් පසුව, මාර්තු 1 වන දිනට පෙර, ජාත්‍යන්තර කමිටුවේ හදිසි සම්මේලනයක් කැඳවන තෙක්, ජාත්‍යන්තර කමිටුව බ්‍රිතාන්‍ය ශාඛාව ලෙස කව්ප අත්හිටුවයි.”

ජාත්‍යන්තර නියෝජිතයින්ගේ සහ ඩේවිඩ් හයිලන්ඩ්ගේ සහාය ඇතිව යෝජනාව සම්මත විය. ස්ලෝටර්, කෙම්ප් සහ පිරනි යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්හ.

පසුදා, එනම් දෙසැම්බර් 17 වන දින ICFI රැස්වීම නැවත ආරම්භ විය. ස්ලෝටර් සහ කෙම්ප් වඩාත් ප්‍රකෝපකාරී ලෙස හැසිරෙමින් රැස්වීම කඩාකප්පල් කිරීමට උත්සාහ කළහ. සාමාන්‍යයෙන් අමතක වන සුළු ස්වභාවයෙන් යුතු මහාචාර්යවරයෙකු ලෙස ක්‍රියා කළ කෙම්ප්, කීර්ති බාලසූරියට පැහැදිලි වර්ගවාදී අපහාස එල්ල කිරීමට යොමු විය. කීර්ති සහෝදරයා කෙම්ප්ගේ ප්‍රකෝප කිරීම් නොසලකා හැරියේය.

ජාත්‍යන්තර කමිටුවේ බහුතරය පැහැදිලි කළේ, ශාඛාවේ විශාලත්වය කුමක් වුවත්, දේශපාලන මූලධර්ම පාවාදීම ජාත්‍යන්තර කමිටුව නොඉවසන බව පැහැදිලි කිරීම සඳහා කව්ප අත්හිටුවීම අවශ්‍ය බවයි. අත්හිටුවීම සුදුසු ඓතිහාසික හා දේශපාලන සන්දර්භය තුළ තබන දෙවන යෝජනාවක් ඔවුන් ඉදිරිපත් කළහ.

“1938 දී ලියොන් ට්‍රොට්ස්කි විසින් ආරම්භ කරන ලද සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂයේ එකම ඓතිහාසිකව ස්ථාපිත නායකත්වය ලෙස ජාත්‍යන්තර කමිටුව තුළ මූර්තිමත් කරන ලද ට්‍රොට්ස්කිවාදයේ වැඩ පිළිවෙලේ පදනම් නැවත තහවුරු කිරීම මෙම අරගලය තුළ අන්තර්ගත වේ. මෙම පදනම් නම්: කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පළමු සම්මේලන හතරේ තීරණ (1919-1922); වාම විපාර්ෂවයේ වේදිකාව (Platform) (1927); සංක්‍රාන්ති වැඩපිළිවෙල (1938); විවෘත ලිපිය (1953); සහ 1961-63 ව්‍යාජ එස්ඩබ්ලිව්පී-පැබ්ලෝයිට් යලි එක්සත් වීමට එරෙහි අරගලයේ ලේඛන.”

යෝජනාවේ තවදුරටත් මෙසේ සඳහන් විය.

“ජාත්‍යන්තර කමිටුව තුළ සංරක්ෂණය කර මූර්තිමත් කරන ලද හතරවන ජාත්‍යන්තරයේ අඛණ්ඩතාව පදනම් වී ඇති පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි අරගලයේ ඓතිහාසික නිවැරදි බව ජාත්‍යන්තර කමිටුව සහ කව්ප නැවත තහවුරු කරයි. සමාජවාදී කම්කරු සංගමයේ ජාතික කමිටුව 1961 දී ප්‍රකාශ කළ පරිදි, පැබ්ලෝවාදී සංශෝධනවාදය ‘ට්‍රොට්ස්කිවාදය තුළ ප්‍රවණතාවක්’ නියෝජනය නොකරන අතර එය එසේ සැලකිය නොහැකිය. එහි මූලාරම්භයේදීම පැබ්ලෝවාදය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය මත ලෝක අධිරාජ්‍යවාදයේ පීඩනයට යටත් වීමක් (capitulation) නියෝජනය කළේය. එහි ප්‍රති-විප්ලවවාදී භූමිකාවේ සම්පූර්ණ ඓතිහාසික වැදගත්කම 1964 දී පෙන්නුම් කරන ලද්දේ, ශ්‍රී ලංකා ලසසපය බණ්ඩාරනායක මැතිනියගේ ධනේශ්වර සභාග රජයට ඇතුළු වීමත් සමඟ ය. එපමණක් නොව, ඇමරිකානු සමාජවාදී කම්කරු පක්ෂය (එස්ඩබ්ලිව්පී) විසින් නොනවතින විප්ලව න්‍යාය ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කිරීම සහ අඩියර-දෙකක විප්ලවය පිළිබඳ ස්ටැලින්වාදී මූලධර්මය ආරක්ෂා කිරීම, 1963 දී ජාත්‍යන්තර කමිටුව ගත් මූලධර්මාත්මක ස්ථාවරය නැවතත් සනාථ කරයි. ලෝකයේ සෑම ප්‍රදේශයකම, ජාත්‍යන්තර කමිටුවේ නායකත්වය යටතේ හතරවන ජාත්‍යන්තරයේ ශාඛා ගොඩනැගීම ට්‍රොට්ස්කිවාදයේ පැබ්ලෝවාදී සතුරන්ට එරෙහිව සම්මුති විරහිත අරගලයක් සමඟ බැඳී ඇත.”

අවසාන වශයෙන්, යෝජනාව මගින් කව්ප ජාත්‍යන්තර කමිටුවට නැවත ඇතුළත් කර ගත හැකි කොන්දේසි ඉදිරිපත් කරන ලදී:

"හීලි යටතේ කව්පයේ ජාතිකවාදී පරිහානියේ උරුමය වන පවතින ගැටලු හැකි ඉක්මනින් ජය ගැනීමටත්, කව්ප තුළ ජාත්‍යන්තරවාදයේ මූලික මූලධර්ම නැවත තහවුරු කිරීමටත්, මෙම පදනම මත හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ එහි පූර්ණ සාමාජිකත්වය නැවත ස්ථාපිත කිරීමටත්, හජ්ජාක සහ කව්ප මධ්‍යම කාරක සභාව දැන් සමීපව කටයුතු කරනු ඇත. මෙම සම්බන්ධතාවයේ සංවිධානාත්මක ව්‍යුහය සෑම විටම හතරවන ජාත්‍යන්තරයේ නීතිරීතිවල විස්තාරණය කර ඇති ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයේ ලෙනින්වාදී මූලධර්ම මත පදනම් විය යුතුය.”

ස්ලෝටර්, කෙම්ප් සහ පිරනි යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්හ. ඔවුන් හජ්ජාක හි වැඩ පිළිවෙළෙහි පදනම් තහවුරු කිරීමට සූදානම් නොවීය. සති හතකට පෙර, කව්ප සම්මේලනය හජ්ජාක හි දේශපාලන අධිකාරිය පිළිගැනීමේ පදනම මත එහි සාමාජිකත්වය නැවත ලියාපදිංචි කිරීමට ඒකමතිකව තීරණය කර තිබුණද, දැන් ඔවුන් මෙම අධිකාරිය නිශ්චිතවම ප්‍රතික්ෂේප කළහ.

මෙය කව්ප නියෝජිතයන් සහභාගී වූ ජාත්‍යන්තර කමිටුවේ අවසාන රැස්වීම විය. ඉන් පසු සති කිහිපය තුළ, කව්ප දැඩි ලෙස දකුණට හැරී, ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන අධිකාරිය ප්‍රතික්ෂේප කළේය. 1986 පෙබරවාරි 7 වන දින එහි පුවත්පත වන වර්කර්ස් ප්‍රෙස් (Workers Press) මයික්


බන්ඩාගේ "ජාත්‍යන්තර කමිටුව වහාම වළලනු ලැබීමට හේතු 27 ක්" යන ට්‍රොට්ස්කිවාදී විරෝධී දීර්ඝ - දෝෂදර්ශනය (diatribe) ප්‍රකාශයට පත් කළ අතර එයට ඩේවිඩ් නෝර්ත් "අප ආරක්ෂා කරන උරුමය" *(The Heritage We Defend)* නම් කෘතිය මගින් ප්‍රතිචාර දැක්වීය.

පෙබරවාරි 8 වන දින, ස්ලෝටර් සහ පිරානි පොලිසිය කැඳවා හජජාක ආධාරකරුවන් කව්ප හි අටවන සම්මේලනයට සහභාගී වීම තහනම් කළහ. ඔක්තෝම්බර් මාසයේදී ස්ථාපිත කරන ලද නිර්ණායකයන්ට අනුව නියෝජිතයින් තෝරා පත් කර ගෙන තිබුනේ නම්, හජජාක ආධාරකරුවන්ට සම්මේලනයේදී බහුතරයක් හිමිවනු ඇත. පසුව ඔවුන් හජජාක හි නව බ්‍රිතාන්‍ය ශාඛාව ආරම්භ කළහ.

හතරවන ජාත්‍යන්තරය සම්බන්ධයෙන් ගත් කල, කව්ප අත්හිටුවීම ඓතිහාසික හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළේය. එය 1953 සිට ජාත්‍යන්තර කමිටුව පැබ්ලෝවාදී අවස්ථාවාදයට එරෙහිව ගෙන ගිය දිගු අරගලයේ කූටප්‍රාප්තිය විය. දැන්, වසර 32 කට පසු, ට්‍රොට්ස්කිවාදීන් අවසානයේ හතරවන ජාත්‍යන්තරයේ පාලනය නැවත ස්ථාපිත කර තිබුණි.

මාක්ස්වාදයේ මල් පිබිදීම ඉන් පසුව සිදුවිය. කේඩරය ජාත්‍යන්තර කමිටුවේ පොහොසත් න්‍යායික හා ඓතිහාසික උරුමය නැවත අත්පත් කර ගත් අතර, කව්ප අර්බුදයට යටින් පැවති වෛෂයික වෙනස්කම් විශ්ලේෂණය කළේය. එමගින් ඔවුහු නැගෙනහිර යුරෝපයේ සහ සෝවියට් සංගමයේ ධනවාදය පුනස්ථාපනය සඳහා සූදානම්ව සිටියහ. සමස්ත සුලු ධනේශ්වර "වම" සෝවියට් ඇති, ජාතික රාජ්‍යය අතර ඇති අශමනීය පරස්පරතාවයේ තියුනුම ප්‍රකාශනය පමණක් විය. එය ප්‍රචණ්ඩ අර්බුද, යුද්ධ සහ විප්ලවවාදී අරගලවල නව යුගයක් ආරම්භ කළ අතර, එහිදී ජාත්‍යන්තර කමිටුව විසින් ආරක්ෂා කරන ලද නොනවතින විප්ලවයේ ඉදිරිදර්ශනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කෙරුණි.

ජාත්‍යන්තර කමිටුව සිය සියලු කටයුතු පදනම් කර ගත්තේ මෙම අවබෝධය මත ය. 1990 දශකයේ මැද භාගයේදී, පැරණි ජාතික සංවිධානවල ගුණාත්මක පරිහානිය සහ ඊට අනුරූපව කම්කරු පන්තිය සමඟ හතරවන ජාත්‍යන්තරයේ සම්බන්ධතාවයේ වෙනස හඳුනා ගනිමින්, එය එහි ශාඛා ලීගවලින් පක්ෂ බවට පරිවර්තනය කළේය. 1998 දී, ජාත්‍යන්තර සමාජවාදයේ අව්‍යාජ හඬ ලෙස ජාත්‍යන්තර කමිටුව ලෝක




මාක්ස්වාදය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

ට්‍රොට්ස්කිවාදී සංවිධානයක් ලෙස, කව්ප අවසන් විය. එය බොහෝ කණ්ඩායම් වලට බෙදී විසිරී ගිය අතර, ඒ සියල්ල ඊළඟ වසර වලදී ට්‍රොට්ස්කිවාදයෙන් ඉවත් විය. ස්ලෝටර් අරාජිකවාදියෙකු බවට පත් විය; හජජාක සමඟ භේදයෙන් සති කිහිපයක් ඇතුළත බන්ඩා ට්‍රොට්ස්කි සහ ට්‍රොට්ස්කිවාදය හෙළා දුටු අතර, ස්ටාලින් කෙරෙහි ඔහුගේ ප්‍රසාදය ප්‍රකාශ කරමින් කුර්දි ජාතිකවාදයේ ආධාරකරුවෙකු බවට පත්විය. පිරානි ට්‍රොට්ස්කිවාදය ප්‍රතික්ෂේප කළ අතර ශාස්ත්‍රාලිකයෙකු ලෙස වෘත්තියට එළඹියේය.

සංගමය විසුරුවා හැරීමට ප්‍රතිචාර දැක්වූයේ සමාජවාදය අසාර්ථක බව ප්‍රකාශ කරමින් සහ ධනවාදය සමඟ සාමය ඇති කර ගනිමින්, අත්හැරීම්වාදයේ (renunciationism) රැල්ලකින් වුවද, ජාත්‍යන්තර කමිටුව සම්පූර්ණයෙන්ම වෙනස් නිගමනවලට එළඹියේය.

ස්ටැලින්වාදී පාලන තන්ත්‍රවල බිඳවැටීම, ලෝක ආර්ථිකයේ ජාත්‍යන්තර ස්වභාවය සහ, ධනවාදය මෙන්ම "තනි රටක සමාජවාදය" පිළිබඳ ඉදිරිදර්ශනය සමඟ බැඳී ඇති ස්ටැලින්වාදය යන දෙකම පදනම් ව සමාජවාදී වෙබ් අඩවිය ආරම්භ කළේය. [2025] දෙසැම්බර් 12 වන දින ලෝක සමාජවාදී වෙබ් අඩවිය, ජාත්‍යන්තර කම්කරු පන්තියේ දේශපාලන අධ්‍යාපනය සහ බලමුලු ගැන්වීම සඳහා අති නවීන තාක්ෂණය යොදා ගන්නා නවමු යෙදුමක් ලෙස Socialism AI ඉදිරිපත් කළේය.

මෙම පසුබිමට සාපේක්ෂව බලන කල, වසර 40 කට පෙර සිදුවීම්වල ඓතිහාසික වැදගත්කම පැහැදිලි වේ. විප්ලවවාදී පක්ෂය තුළ පැහැදිලි කිරීමේ ක්‍රියාවලිය මහා විප්ලවවාදී අරගලවලදී ජනතාවගේ දිශානතිය පූර්වාපේක්ෂා

කරයි. වසර 40 කට පෙර කවිප අර්බුදයේ දී එහි මූලධර්මාත්මක මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස, නූතන කම්කරු පන්තියේ ගෝලීය ස්වභාවයට අනුරූප වන සැබවින්ම ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ලෝක පක්ෂයක් ගොඩනැගීම සඳහා මාවත සැකසීමට ජාත්‍යන්තර කමිටුවට හැකි විය. ලෝක ධනවාදයේ ගැඹුරු වන අර්බුදයක කොන්දේසි යටතේ, ජාත්‍යන්තර කමිටුව විසින් නායකත්වය දෙන හතරවන ජාත්‍යන්තරය ලොව පුරා මහජන විප්ලවවාදී අරගලවල නායකත්වය ලෙස මතු වනු ඇත.




ධනේශ්වර ක්‍රමයේ අන්තර් සම්බන්ධිත අර්බුදවලට යටින් පවතින්නේ, සමාජයේ සියලු දෙනාම ලාභයට සහ පුද්ගලික ධනය සමුච්චය කිරීමට යටත් කරන කතිපයාධිකාරයකි. කතිපයාධිකාරයට එරෙහි සටන ස්වභාවයෙන්ම විප්ලවවාදී කාර්යයකි. මේ සඳහා, දේශපාලන බලය ලබා ගැනීමට, නිෂ්පාදන ක්‍රියාවලිය මත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ස්ථාපිත කිරීමට සහ සමාජවාදී පදනම මත–එනම්, පුද්ගලික ලාභයේ පදනම මත නොව, සමාජීය අවශ්‍යතාවයේ පදනම මත–සමාජය ප්‍රතිසංවිධානය කිරීමට, ලෝක පරිමාණයෙන් කම්කරු පන්තිය බලමුලු ගැන්වීම අවශ්‍ය වේ. මෙම ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩලයේ 2025 නව අවුරුදු ප්‍රකාශය Mehring Books වෙතින් ඇණවුම් කරන්න.

# එලිසබෙත් සිමර්මන්-මොඩෙල්ගේ අවමංගල්‍යය: "අසාමාන්‍ය ධෛර්ය සම්පන්න පෞරුෂයක්"



එලිසබෙත් සිමර්මන්-මොඩ්ලර් 2023 දී

**සමාජවාදී සමානතා පක්ෂයේ (ජර්මනිය) සම්භාවනීය සභාපති උල්රිච් රිපර්ට් විසිනි.**

මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) *2025* දෙසැම්බර් *23* දින *[The funeral of Elisabeth Zimmermann-Modler in Duisburg: “An extraordinarily courageous personality”]*’ යන හිසින් පලවූ ලිපියේ සිංහල පරිවර්තනය යි.

*“එලී අසාමාන්‍ය ලෙස ධෛර්ය සම්පන්න පෞරුෂයක් වූවාය. ඇය ඉතා නිරවුල් බවකින් සහ සංගතභාවයකින් ඇගේ ජීවන මාවත තරණය කළාය.”*

මෙය ප්‍රකාශ කරන ලද්දේ එලිසබෙත් සිමර්මන්-මොඩ්ලර්ගේ අවමංගල්‍ය උත්සවයේදී ජර්මනියේ සමාජවාදී සමානතා පක්ෂයේ *(Sozialistische Gleichheitspartei – SGP)* ගරු සභාපති උල්රිච් රිපර්ට් විසිනි. *“එලි”* ලෙස කවුරුත් දන්නා ඇය වසර *50* ක් *SGP* හි සාමාජිකාවක් වූවාය. ඛේදජනක අනතුරක ප්‍රතිඵලයක් ලෙස ඇය නොවැම්බර් *28* වන දින වයස අවුරුදු *69* දී මිය ගියාය.

ශීත ඍතුවේ මලින වූ දිනයක් වූ සිකුරාදා, එලිසබෙත් සිමර්මන්-මොඩ්ලර්ට අවසන් ගෞරව දැක්වීම සඳහා ශෝක වන්නන් 50 ක් පමණ රුහ්රෝර්ට් සුසාන භූමියට රැස් වූහ. වයලීන වාදක එලා රොට්ෂ් යොහාන් සෙබස්තියන් බාක් විසින් රචිත “එයාර්” (Air) වාදනය කළාය. පැමිණ සිටි අය අතර, වසර ගණනාවක් තිස්සේ එලීව හඳුනන SGP සාමාජිකයින්ට අමතරව, සීමන්ස් හි වැඩ සගයන්, තයිසන්ක්‍රෑප් හි වානේ කම්කරුවෙකු ලෙස සේවය කළ ඇගේ සැමියා වන පීටර්ගේ සගයන් කිහිප දෙනෙකු මෙන්ම අසල්වැසියන් සහ මිතුරන් ද වූහ. දෙමළ සහෝදරයෙකු වන තාස්, එලී තමා සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් සරණාගතයින් ඇයගේ නිවසට ගෙන ගිය ආකාරය, ට්‍රොට්ස්කිවාදයේ මූලධර්ම පිළිබඳව ඔවුන්ට අධ්‍යාපනය ලබා දුන් ආකාරය සහ ජීවිතයේ සෑම අවස්ථාවකදීම තමා මිතුරියක් බව ඔප්පු කළ ආකාරය සොහොන් බිමේදී සිහිපත් කළේය. “ඇය අපේ පවුල විය,” තාස් පැවසීය.

උල්රිච් රිපර්ට්ගේ කතාව එලිසබෙත් සිමර්මන්-මොඩ්ලර්ගේ ජීවිතයට උපහාරයක් විය. පැමිණ සිටි වානේ කම්කරුවන් ඇතුළු බොහෝ දෙනෙක් පසුව පැවසුවේ රිපර්ට් එලීගේ චරිතය හරියටම ග්‍රහණය කරගත් බවයි. කතාව පහත පරිදි වේ:



එලිසබෙත් සිමර්මන්-මොඩ්ලර්ගේ අවමංගල්‍ය උත්සවයේදී උල්රිච් රිපර්ට් කතා කරමින්

ආදරණීය පීටර්, එලීගේ ආදරණීය ඥාතීන්, ආදරණීය සහෝදරවරුනි සහ මිතුරනි,

එලීගේ හදිසි හා ඛේදජනක මරණයෙන් අපි තවමත් දැඩි ලෙස පීඩාවට පත්ව සිටිමු. නොවැම්බර් 28 වන දින උදෑසන සිදු වූයේ කුමක්ද යන්න හෝ ඇගේ මහල් නිවාසයේ මෙම විනාශකාරී ගින්න ඇති වූයේ කෙසේද යන්න අපි තවමත් නොදනිමු. අපි දැඩි ලෙස කම්පනයට පත්ව සිටිමු.

වසර තුනකට පෙර ඇයට ඇති වූ ආඝාතය සහ එතැන් සිට ඇයට ගැනීමට සිදු වූ ඖෂධ ඇයට දැඩි ලෙස බලපෑ බව අපි දැන සිටියෙමු. අද මෙහි රැස්ව සිටි බොහෝ දෙනෙක් ඇගේ අසනීපයේ ප්‍රතිවිපාක දුටුවෝය. එය සැබවින්ම ඛේදජනකයි. අපි එලීගේ වෛද්‍ය ප්‍රතිකාර වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටියා, එහෙත් දැන් මරණය අපව අභිබවා ගියා.

ඇගේ අසනීප තත්ත්වය නොතකා, එලීට සෑම දෙයකටම සහභාගී වීමට අවශ්‍ය විය. අපෙන් බොහෝ දෙනෙක් දින කිහිපයකට පෙරත් ඇයව බර්ලිනයේ පැවති උත්සවයකදී මුණගැසී ඇය සමඟ කතා කර සාකච්ඡා කළා.

එලී අසාමාන්‍ය ලෙස ධෛර්ය සම්පන්න පෞරුෂයක් වූවාය. ඇය ඉතා නිරවුල් බවකින් සහ සංගතභාවයකින් ඇගේ ජීවන මාවත තරණය කළාය.

එලී ජීවිතයේ හිරු රැසින් දිදුලන පැත්තේ ඉපදුනේ නැහැ. ඇය ලෝකයට එන විට යුද්ධය සහ නාසි අපරාධ අවසන් වී ගෙවී තිබුණේ වසර එකොළහක් පමණයි. ඇගේ ළමා කාලය සහ තරුණ කාලය, ජර්මානු සමාජයට සහ පවුල්වලටම ගැඹුරින් විනිවිද ගිය නාසීන්ගේ අපරාධ සහ යුද්ධවලින් ඉතිරි වූ තුවාල සහ කැළැල් මගින් සලකුණු වුනා.

ඇගේ මව දැන් වෙක් ජනරජය ලෙස හඳුන්වන උතුරු බොහීමියාවෙන් පිටුවහල් කර තිබුණි; එලී ඉපදෙන විට ඇයට වයස අවුරුදු 17 ක් පමණි. ඇය තනි මාපියෙකු ද, ගුරුවරියකද වූ අතර රැකියාවක යෙදීමට සිදු විය. එලී හදා වඩා ගැනීම සඳහා පවුලකට භාර දුන් අතර ඇගේ මුල් ළමා කාලය එහි ගත කළාය. වයස අවුරුදු දොළහේදී, එලීට සංකීර්ණ කොඳු ඇට පෙළේ සැත්කමකට භාජනය වී ප්ලාස්ටර් ඇඳක මාස ගණනාවක් වැතිර සිටීමට සිදු විය. ඇගේ ජීවිත කාලය පුරාම පිට කොන්දේ ගැටළු ඇය සමඟ පැවතුනි.

නමුත් එලී මේ සියලු දුෂ්කරතා වලට අභියෝග කළාය. ඇය ජීවිතය ඉතා ධනාත්මකව තහවුරු කළ පුද්ගලයෙකි.

මම මුලින්ම එලීව මුණගැහිලා අවුරුදු 50කටත් වැඩියි. ඒ 1975 මැයි මාසේ මුල. එවිට ඇයට වයස අවුරුදු 19ක් වූ ඇතර ද්විතීක අධ්‍යාපන උපාධිය සඳහා සූදානම් වෙමින් සිටියා. මේ පළමු හමුවෙහිදී ම අපි තීව්‍ර සාකච්ඡා පැවැත්වූ බවත්, සමීප සහයෝගීතාවයක් ආරම්භ වූ බවත් මට මතකයි.

නාසි ත්‍රස්තයේ අපරාධ තවමත් ඉතා සජීවීව පැවති පරම්පරාවකට එලී අයත් වූවාය. ඉතා දියුණු සංස්කෘතියක් සහ ශක්තිමත් කම්කරු ව්‍යාපාරයක් සහිත නූතන රටක ම්ලේච්ඡත්වයට නැවත කඩාවැටීමක් සිදුවූයේ කෙසේද යන ප්‍රශ්නය ඇය සහ ඒ කාලයේ අප සියල්ලන්ම අලලා ගත්තා.

තරුණ වියේදී පවා, එලී නාසිවාදයේ විරුද්ධවාදීන්ගේ ලේඛන කියවා තිබූ අතර, වතිකානුව සහ නාසීන් අතර සහයෝගීතාවය පිළිබඳව සාකච්ඡා කළ වූ රොල්ෆ් හොචුත්ගේ ද ඩෙපියුටි නාට්‍යය (The Deputy) ද ඒ අතර විය. ඇයගේ සංගත භාවයට අනුකූලව ඇය, ඉන් ඉක්බිතිව පල්ලියෙන් ඉවත් වූවාය.

එකල බොහෝ දෙනෙක් ෆැසිස්ට්වාදයට හේතු කාරනා, මහජන මනෝවිද්‍යාව සහ ජර්මානු ජනතාව පරිහරණය වීමට ගොදුරු වීමේ ප්‍රවණතාව අනුව පැහැදිලි කළහ. එලී එවැනි සරල හා නොගැඹුරු පිළිතුරු වලින් සෑහීමකට පත් නොවීය. ඇයට අවශ්‍ය වූයේ දේවල්වල මූලයට යාමටයි.

ෆැසිස්ට්වාදය සහ ධනවාදය අතර සම්බන්ධතාවය ගැන එලී සාකච්ඡා කළාය. හිට්ලර්ට මහා කර්මාන්ත මුදල් මගින් සපයා ඇති බවත් ඔහු බලයට ගෙන එන ලද්දේ ඔවුන් බවත් ඇය දැන සිටියාය.

පසුව, ෆැසිස්ට් පක්ෂ නැවතත් ගොඩනඟමින් බලයට ගෙන ඒමට හේතුව තේරුම් ගැනීමට නම්, ධනවාදය සහ ෆැසිස්ට්වාදය අතර

මෙම සම්බන්ධතාවය මෙතරම් වැදගත් වන්නේ මන්දැයි අවධාරණය කරමින් ඇය ලිපි කිහිපයක් ලිවීය.

නමුත් පසුව තවත් ප්‍රශ්නයක් මතු විය: 1933 දී කම්කරු පන්තිය නාසීන්ගේ ජයග්‍රහණය නතර කර මිලේච්ඡත්වයට පල්ලම් බැසීම වළක්වා නොගත්තේ මන්ද?

මෙයට පිළිතුරු දීම සඳහා, ස්ටැලින්වාදයට එරෙහිව සමාජවාදයේ ඉදිරිදර්ශනය ආරක්ෂා කළ ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන පිළිබඳ දැඩි අධ්‍යයනයකට එලී සහභාගී විය. ට්‍රොට්ස්කි පෙන්වා දී තිබුණේ හිට්ලර්ට බලයට පැමිණිය හැකි වූයේ ස්ටාලින් ඔහුගේ "සමාජ ෆැසිස්ට්වාදයේ" ප්‍රතිපත්තිය මඟින් කම්කරු පන්තිය බෙදීම හා දුර්වල කිරීම නිසා පමණක් බවයි.

නිගමනය පැහැදිලිය: යුද්ධය සහ ෆැසිස්ට්වාදය වැළැක්විය හැකි එකම සමාජ බලවේගය කම්කරු පන්තිය පමණි. නමුත් මේ සඳහා ශක්තිමත් විප්ලවවාදී පක්ෂයක් අවශ්‍ය වේ.

එලී මෙම නිගමනයට එළඹුණු අතර, පළමුව, සමාජවාදී සහ, දෙවනුව, ජාත්‍යන්තර නව කම්කරු පක්ෂයක් ගොඩනැගීම සඳහා උද්යෝගිමත් සටන්කරුවෙකු බවට පත්විය

ආදරණීය මිත්‍රවරුනි, මෑත දිනවල මම මෙහි එලීගේ සොහොන අසලදී කුමක් කිව යුතුදැයි සිතමින් සිටියදී, එලී විසින්ම කුමක් කියයිදැයි මම මගෙන්ම විමසුවෙමි. හදිසියේම මට ඇගේ පැහැදිලි කටහඬ ඉතා ප්‍රත්‍යක්ෂව ඇසුණි—විඑලීට හයියෙන්, පැහැදිලිව, ස්වාභාවික ආකාරයෙන්ම හා ඉතා ඒත්තු ගැන්වෙන ලෙසටම කතා කළ හැකි විය—ඇය මෙසේ පැවසුවාය: "ඇයි ඔබ සරලවම සත්‍යය නොකියන්නේ? මම ඉතා දේශපාලනික ජීවිතයක් ගත කළෙමි. ඒ වගේම මම ඒ ගැන ආඩම්බර වෙමි!"

එලීගේ ජීවිතය තුළ ඉතා දර්ශීය (typical) හා සිත් කාවදින දෙයක් තිබේ. මම විශ්වාස කරන්නේ එය සංගතභාවය (consistency) ලෙස හඳුන්වන බවයි. ඇය කාල් මාක්ස්ගේ ආප්තයට අනුව ජීවත් වූවාය: "යමෙක්ට තමන් එළඹෙන නිගමනවලට බිය නොවී සිතීම සඳහා ධෛර්යය තිබිය යුතුය—ඉන්පසු ඒවා මත ක්‍රියා කළ යුතුය."

එලී මෙම ආප්තයට අනුව ජීවත් වූවාය. ඇය නිවැරදි යැයි හඳුනාගත් දේ—රැඩිකල් ලෙස සහ සියලු ප්‍රතිවිපාක සමඟ—ඇය ක්‍රියාවට නැංවූවා ය. යුද්ධයට සහ ෆැසිස්ට්වාදයට එරෙහිව විරෝධතා දැක්වූ ඇගේ පරම්පරාවේ එකම තැනැත්තා ඇය පමණක් නොවීය, එනමුත් නිවැරදි නිගමනවලට එළඹුණු සහ සම්මුති විරහිතව ඒවා තදින් අල්ලා ගත් ඉතා ස්වල්ප දෙනා අතර ඇයද වූවාය.

සාමවාදීන්ගෙන් හිස්ටීරික මිලිටරිවාදීන් බවට පරිවර්තනය වූ හරිත පිල්මාරු කාරයන් ඇය පිළිකුල් කළාය. වමට කතා කර දකුණට ක්‍රියා කරන වාම පක්ෂයේ (Left Party) මුසාවන්ට එරෙහිව ඇය සටන් කළාය.

එලීගේ ජීවිතයේ විශේෂයෙන් කැපී පෙනෙන දේවල් දෙකක් තිබේ.

පළමුව, ඇය කම්කරු පන්තිය දැන සිටි අතර එය තේරුම් ගත්තාය. ඇය එහි කොටසක් වූවාය. ඇය Siemens හි වසර 35 ක් සේවය කළ අතර එහි සාප්පු භාරකරුවෙකු (shop steward) ලෙස කටයුතු කළාය. වසර හතළිස් දෙකකට පෙර, ඇයට ඇගේ අනාගත සැමියා වන පීටර් මොඩ්ලර් මුණගැසුණි. ඔහු වානේ කම්කරුවෙකු ලෙස සේවා මුර වැඩ කළ අතර Thyssenkrupp හි සාප්පු භාරකරුවෙකු විය. ඔහු ඇගේ දේශපාලන කටයුතුවලට දැඩි ලෙස සහාය දුන්නේය.

නමුත් කම්කරුවන් සමඟ කතා කරන විට පවා, ධනපතියන්ගේ කෲරත්වය, දොට්ට දැමීම් සහ සේවා කොන්දේසි නිරන්තරයෙන් පිරිහීම ගැන පැමිණිලි කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව එලී අවධාරණය කළාය. රජයේ සහ පාලක ප්‍රභූවේ වගකීම් විරහිතභාවය ගැන කෝපයට පත්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. තමන්ගේම වගකීම හඳුනාගෙන භාර ගැනීම අවශ්‍ය වේ.

“කම්කරුවන්ගේ විමුක්තිය කම්කරුවන්ගේම කාර්යය විය යුතුය” යන මාක්ස්ගේ ප්‍රකාශය එලී දැන සිටි අතර ඇය එය ඉතා බැරෑරුම් ලෙස සැලකුවාය.

එලීගේ දෙවන කැපී පෙනෙන ලක්ෂණය වූයේ ඇගේ ජාත්‍යන්තරවාදයයි.

එය ඇයට ලොව පුරා මිතුරන් සිටීම පමණක් නොවේ. ජාත්‍යන්තරවාදය දේශපාලන වැඩසටහනක් ලෙස ඇය තේරුම් ගත්තාය. වෘත්තීය සමිති සහ ධනේශ්වර පක්ෂවල ජාතිකවාදයට එරෙහිව ඇය සටන් කළාය. කම්කරුවන්ට මාතෘ භූමියක් නොමැති බවත්, ඔවුන් ලෝක නිෂ්පාදන ක්‍රියාවලියේදී ගෝලීය වශයෙන් අන්තර් සම්බන්ධිත බවත් ඇය දැන සිටියාය. සෑම රටකම කම්කරුවන් එකම හෝ සමාන ගැටලුවලට මුහුණ දෙන බවත්, ධනවාදයට එරෙහි අරගලය සාර්ථක විය හැක්කේ එය ජාත්‍යන්තරව සිදු කළහොත් පමණක් බවත් ඇය බොහෝ විට අවධාරණය කළාය.

බොහෝ රැස්වීම්වලදී, සරණාගතභාවය සඳහා ඇති අයිතිය ක්‍රමානුකූලව අහෝසි කිරීමට එරෙහිව සහ විදේශිකයන් ඉලක්ක කරගත් උද්ඝෝෂණවලට එරෙහිව එලී සටන් කළාය. සංක්‍රමණිකයන් සහ සරණාගතයින් ජාත්‍යන්තර කම්කරු පන්තියේ වැදගත් කොටසක් බවත්, විදේශිකයන්ට එරෙහි සියලු ප්‍රහාර අධිෂ්ඨානශීලීව ප්‍රතික්ෂේප කළහොත් පමණක් කම්කරුවන්ට තමන්ගේම අයිතිවාසිකම් ආරක්ෂා කර ගත හැකි බවත් ඇය අවධාරණය කළාය.

කම්කරු ව්‍යාපාරයේ සෑම අවස්ථාවාදී ධාරාවක්ම ආරම්භ වන්නේ ජාතිකවාදයට අනුවර්තනය වීමෙන් බව එලී දැන සිටි අතර, වසර හතළිහකට පෙර අපගේ සහෝදරවරුන් අතර එවැනි ආරවුලක් ඇති වූ විට, ඇය වහාම සහ පැකිලීමකින් තොරව ජාත්‍යන්තරවාදීන්ගේ පැත්ත ගත්තාය.

ලෝක පක්ෂයක් ලෙස අපගේ පක්ෂය ගැන එලී ඉතා ආඩම්බර වූ අතර බොහෝ ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණවලට සහභාගී විය.

දශක ගණනාවක් තිස්සේ ඇය අප සමාජවාදී සමානතා පක්ෂයේ විධායක කමිටුවේ සාමාජිකාවක් වූවාය; ඇය බොහෝ මැතිවරණවලදී අපේක්ෂිකාවක් ලෙස ඉදිරිපත් වූ අතර ගුවන් විදුලියේ සහ රූපවාහිනියේ අපගේ වැඩසටහන ඉදිරියට ගෙන ගියාය.

මෙම දැඩි දේශපාලන කටයුතු මධ්‍යයේ වුවද, ඇය සංස්කෘතික දේ සඳහා කාලය සොයා ගත්තාය. ඇය සාහිත්‍යය, සිනමාව, ඔපෙරා සහ ප්‍රසංගවලට ප්‍රිය කළාය.

එලීගේ මරණයේ ඛේදවාචකය හරියටම පවතින්නේ ඇය ඇගේ මුළු වැඩිහිටි ජීවිතය පුරාම සටන් කළ දේශපාලන අදහස් සහ ඉදිරිදර්ශන එතරම් විශාල අදාළත්වයක් සහ වැදගත්කමක් ලබා ගන්නා මොහොතේම ඇයව ජීවිතයෙන් ඉරා වෙන් කර දැමීම තුළය.

ආදරණීය එලී: ඔබ තවදුරටත් අප සමඟ නොමැති වීම ගැන අපි අතිශයින් කණගාටු වෙමු. අපට ඔබ නැති අඩුව දැනේ. නමුත් ඔබ ඔබේ ජීවිතය කැප කළ අරගලය අපි දිගටම අරගෙන යන්නෙමු.

කම්කරු පන්තියේ විමුක්තිය සඳහා සටන්කරුවෙකු ලෙස ඔබ සැමවිටම අපගේ මතකයේ ජීවමාන වනු ඇත. අපි එය පොරොන්දු වෙමු.

වැඩිදුර කියවන්න: Elisabeth Zimmermann-Modler 1956–2025: Trotskyist and fighter for the working class




**අපගේ සියලුම පාඨකයින්ට Socialism AI සඳහා සාමාජික වී එය ඔබගේ දෛනික දේශපාලන ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි ආරාධනා කරමු.**

**2026 දී සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය. එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්ථනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරය හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවියේ අලුත් අවුරුදු අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) විප්ලවවාදී වාම කන්ඩායම වන ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/ මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා අපව සම්බන්ධ කර ගැනීම සඳහා අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය theSocialist.lk නිති පතා කියවන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර. කමිටුවේ (හජජාක) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය දිනපතා කියවන්න: wsws.org. සසප යනු හජජාක ලංකා ශාඛාවයි

**ලංකාවේ සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න